Summary report on agricultural activities

Economic Census 2013/14

Preliminary report on agricultural activities of the Economic Census 2013/2014 was originally published on 30th July 2015. However certain statistical tables were revised. Thereafter, earlier report is replaced by this new version. Users are hereby informed to use this new version instead of the early version.

ආර්ථික සංගණනය 2013/ 14-ශ්‍රී ලංකාව

කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම

කුඩා ගොවි කාණ්ඩ සහ වතු පිළිබඳ සාරාංශ වාර්තාව

කුඩා ගොවි කාණ්ඩ පිළිබඳ තොරතුරු, ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් හා වතු පිළිබඳ තොරතුරු එන්නේ පරිපාලන කාර්යාලයේ පිහිටීම පදනම් කර ගනිමින් ඇතුළත් කර ඇත

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

කුඩා ගොවි කාණ්ඩ සහ වතු පිළිබඳ සාරාංශ වාර්තාව

කුඩා ගොවි කාණ්ඩ පිළිබඳ තොරතුරු ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් හා වතු පිළිබඳ තොරතුරු වත්තේ පරිපාලන කාර්යාලයේ පිහිටීම පදනම් කර ගනිමින් ඇතුළත් කර ඇත

ආර්ථික සංගණනය 2013/14

ශ්‍රී ලංකාව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ISBN 978 – 955 – 577 – 938 – 8

ප්‍රකාශනය හා මුද්‍රණය

2015 ජූලි

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පෙරවදන

ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි ඇතිවී ඇති ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් සංගණන ඉතිහාසයේ ප්‍රථම වරට 2013/14 වර්ෂවලදී ආර්ථික සංගණනයක් පැවැත්වීමට කටයුතු සම්පාදනය කරන ලදී. මෙම සංගණනයේදී ආර්ථිකයේ ප්‍රධාන අංශයන් වන කෘෂිකාර්මික, කර්මාන්ත, වෙළෙඳ හා සේවා යන සියලුම අංශ ආවරණය කෙරේ. මෙම සංගණනය අදියර හතරකින් සිදු කරන ලද අතර ප්‍රථම අදියර යටතේ සියලු වතු (අක්කර 20ට වැඩි) ලැයිස්තු ගත කරන ලදී. එය 2013 ජූලි මාසයේදී සිදු කළ අතර දෙවන අදියර යටතේ කර්මාන්ත, වෙළෙඳ හා සේවා කටයුතුවල නියුතු සියලු ආර්ථික ඒකකයන් 2013 සැප්තැම්බර්-ඔක්තෝබර් මාසවලදී ලැයිස්තු ගත කරන ලදී. තෙවන අදියර යටතේ කුඩා ගොවි කාණ්ඩ (අක්කර 20ට අඩු) හා වතු පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කරන ලද අතර එය 2014 ජුනි-අගෝස්තු මාසවලදී සිදු කරනු ලැබිණි. සිවුවන අදියර යටතේ ලැයිස්තුගත කර්මාන්ත, වෙළෙඳ හා සේවා ආයතනවලින් තෝරාගත් නියැදි ආයතනවලින් විස්තරාත්මක තොරතුරු රැස් කරන ලද අතර එය 2014 නොවැම්බර්-දෙසැම්බර් මාසවලදී සිදු කරනු ලැබිණි.

මෙහි ඇතුලත් වන්නේ කුඩා ගොවි කාණ්ඩ අංශයෙන් හා වතු අංශයෙන් රැස් කරන ලද විස්තරාත්මක තොරතුරු විශ්ලේෂණයෙන් පිළියෙල කරන ලද වාර්තාවකි. කුඩා ගොවි කාණ්ඩ හා වතු පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කිරීමේ අදියර සාර්ථක කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මෙන්ම දෙපාර්තුමේන්තුවෙන් පරිබාහිර වෙනත් රජයේ නිලධාරීන් ද සහභාගි කර ගන්නා ලදී.

ආර්ථික සංගණනය යටතේ කෘෂිකාර්මික කටයුතු ගණන් ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධව කටයුතු කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් වූ මෙහෙයුම් කමිටුවක් පිහිටුවන ලදී. මෙම කමිටුවේ දායකත්වය කුඩා ගොවි කාණ්ඩලැයිස්තු ගත කිරීම හා වතු පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ඉවහල් විය.

කුඩා ගොවි කාණ්ඩ හා වතු පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කිරීමේ අදියරේදී, රැස් කරන ලද තොරතුරු ගණන් ගන්නා නිලධාරීන් විසින් එම කටයුතු අවසන් වීමෙන් පසු සාරාංශ ගත කරනු ලැබිණි. මෙම සාරාංශ ගත කිරීම පියවර හතරකින් සිදු කෙරිණි. ගණන් ගන්නා නිලධාරී විසින් සකස් කරන ලද වාර්තාව පදනම් කර ගනිමින් අධීක්ෂණ නිලධාරී විසින් ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අදාලව සාරාංශ ලේඛනයක් සකස් කළ අතර එම සාරාංශ ලේඛන පදනම් කර ගනිමින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය භාර සංඛ්‍යාලේඛන නිලධාරී/ සංඛ්‍යාලේඛන සහකාර විසින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අදාලව සාරාංශ ලේඛනයක් සකස් කෙරිණි. ඒ අයුරින් දිස්ත්‍රික්ක විසි පහට (25) අදාලව ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ සාරාංශ ලේඛන පදනම් කර ගනිමින් කුඩා ගොවි කාණ්ඩ හා වතු පිළිබඳ අවසන් සාරාංශ වාර්තාව පිළියෙල කරනු ලැබීය.

කුඩා ගොවි කාණ්ඩ පිළිබඳ තොරතුරු රැස් කිරීමේදී, අධීක්ෂණ නිලධාරීන් ලෙස කටයුතු කළ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම උපදේශකවරු, කපු සංවර්ධන නිලධාරීන්, පොල් සංවර්ධන නිලධාරීන්, අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්, සත්ව නිෂ්පාදන පරීක්ෂකවරු ඇතුළු අනෙකුත් නිලධාරීන්ට ද ගණන් ගන්නා නිලධාරීන් ලෙස කටයුතු කළ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් රජයේ නිලධාරීන්ට ද තොරතුරු ලබා දුන් කුඩා ගොවි කාණ්ඩවල ගොවි කාරකවරුන්ට ද ලබා දුන් සහයෝගය වෙනුවෙන් ස්තුති වන්ත වෙමි. එමෙන්ම වතු පිළිබඳ තොරතුරු

රැස් කිරීමේදී, ගණන් ගන්නා නිලධාරීන් ලෙස කටයුතු කළ ග්‍රාම නිලධාරීන්ට ද තොරතුරු ලබා දුන් වතු අධිකාරිවරුන්/ භාරකරුවන් සහ වතු සමාගම්වලට ද ස්තුති වන්ත වෙමි.

සංගණනය සඳහා පත් කළ සංගණන කොමසාරිස්, නියෝජ්‍ය සංගණන කොමසාරිස්, සහකාර සංගණන කොමසාරිස් සහ දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයෙන් ලබා දුන් අඛණ්ඩ සහායද මෙම අදියර සාර්ථකව අවසන් කිරීමට ඉවහල් විය.

කුඩා ගොවි කාණ්ඩ හා වතු පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කිරීමේ අදියරේදී එක් රැස් කළ තොරතුරු ඇසුරෙන් මෙම වාර්තාව කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාලේඛන අංශයේ අධ්‍යක්ෂ පී.එම්.පී. අනුර කුමාර මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ සී.ඩී.ද සිල්වා මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ කේ.පී.කේ. දිසානායක මයා යන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ එස්. තනබාලසිංහම් මයා, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ ජයසම්පත් ලියනගේ මයා, සංඛ්‍යාලේඛනඥ පී.කේ. පත්බේරිය මෙය, සංඛ්‍යාලේඛන නිලධාරී ටී.ආර්.ඩී. පද්මසිරි මිය, සංවර්ධන නිලධාරී අයි.එල්. වික්‍රමරත්න මයා, සංවර්ධන නිලධාරී එච්.එෆ්.එච්.එන්.ඩී. ෆොන්සේකා මිය, තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන සහකාර කේ.එස්. චාමින්ද මයා ඇතුළු කාර්ය මණ්ඩලයට ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ එම්.එස්.එස්. සුමනපාල මහත්මියට ද ස්තුතිවන්ත වෙමි.

මෙම වාර්තාවේ ඇතුළත් කරුණු කුඩා ගොවි කාණ්ඩ හා වතු අංශය පිළිබඳව තොරතුරු භාවිතා කරන්නන්ට ප්‍රයෝජනවත් වනු ඇතැයි විශ්වාස කරමි.

ආචාර්ය ඒ.ජේ. සතරසිංහ
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
නො. 306/71, පොල්දූව පාර,
බත්තරමුල්ල.
2015.07.30

සාරාංශය

කුඩා ගොවිකාණ්ඩ හා වතු අංශයේ තොරතුරු රැස්කිරීමේ අදියර

ශ්‍රී ලංකාවේ 14 වෙනි ජන හා නිවාස සංගණනය 2012 වසරේ පවත්වන ලදී. සාමාන්‍යයෙන් ජන හා නිවාස සංගණනයෙන් පසුව එළඹෙන වසර දෙක තුළදී කෘෂිකර්ම සංගණනය සහ කර්මාන්ත සංගණනය පැවැත්වීම සම්ප්‍රදායක් වේ. එහෙත් මෙ වන විට ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ කෘෂිකර්ම හා කර්මාන්ත අංශ අභිබවා වෙළඳ හා සේවා අංශය ඉදිරියට පැමිණ ඇති අතර, එය ජාතික ආදායමට විශාල ලෙස (2013 වසරේ 58%) දායකත්වයක් දක්වන බැවින්, මෙවර වෙන වෙනම සංගණන දෙකක් නොපවත්වා ඒ වෙනුවට කෘෂිකර්ම, කර්මාන්ත, වෙළඳ හා සේවා යන ආර්ථිකයේ සියලුම අංශ ආවරණය වන පරිදි ආර්ථික සංගණනයක් 2013/14 වර්ෂ වලදී පැවැත්වීමට කටයුතු කරන ලදී.

ආර්ථික සංගණනය 2013/14 අදියර 4 කින් පවත්වන ලද අතර එහි ප්‍රථම අදියර වූයේ ශ්‍රී ලංකාවේ අක්කර 20 ට වැඩි බිම් ප්‍රමාණයෙන් යුතු සියලුම වතු ලැයිස්තුගත කිරීමයි. එම අදියරේදී රැස්කරන ලද තොරතුරු ආශ්‍රයෙන් වතු පිළිබඳ සංඛ්‍යාති කිහිපයක් ඇතුළත් ප්‍රකාශනයක් 2013 සැප්තැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී. මෙම සංගණනයේ තෙවන අදියර යටතේ ශ්‍රී ලංකාවේ සියලු කුඩා ගොවිකාණ්ඩ එනම්, ප්‍රමාණයෙන් අක්කර 20 ට අඩු කෘෂිකාර්මික ඒකක (තවදුරටත් පර්චස් 40 කට අඩු හා පර්චස් 40 ට වැඩි ලෙස කොටස් 2ක් වන පරිදි වෙන්කර) සහ ලැයිස්තුගත කරන ලද සියලුම වතු වලින් විස්තරාත්මක තොරතුරු 2014 ජූලි, අගෝස්තු මාස වලදී රැස්කරන ලදී. එම අවස්ථාවේදී ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පිළියෙල කරන ලද සාරාංශ ලේඛන උපයෝගී කර ගනිමින් කුඩා ගොවිකාණ්ඩ අංශය සහ වතු අංශය පිළිබඳ වූ වැදගත් තොරතුරු ඇතුළත් කොට මෙම ප්‍රකාශනය පිළියෙල කිරීමට කටයුතු කරන ලදී.

එම රැස්කරනු ලැබූ තොරතුරු අනුව මෙම ප්‍රකාශනයේ ශ්‍රී ලංකාවේ ගොවිකාරකයන්, වගා බිම් ප්‍රමාණය සහ තේ, රබර්, පොල් වගාවන් යටතේ ඇති බිම් ප්‍රමාණය, එළ ගවයන්, මී ගවයන් පිළිබඳ සංඛ්‍යාති, දෛනික කිරි නිෂ්පාදනය හා කුකුළන් පිළිබඳ සංඛ්‍යාති කුඩා ගොවි කාණ්ඩ අංශය යටතේ ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික් මට්ටමින් හා වතු අංශය යටතේ වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික් මට්ටමින් ඇතුළත් කර ඇත.

මෙම තොරතුරු වලට අනුව ශ්‍රී ලංකාවේ මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව (උප ගොවි කාරකයින්ද ඇතුළත්ව) 4,313,897 ක් ලෙස වාර්තා වී ඇත. මෙයින් වැඩිම ගොවි කාරකයින් සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ ගම්පහ (442,693) දිස්ත්‍රික්කයෙන් වන අතර අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ මන්නාරම (19,092) දිස්ත්‍රික්කයෙනි.

වගා බිම් ප්‍රමාණය සැලකිල්ලට ගත්විට ආර්ථික සංගණනය 2013/14 යටතේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමට අනුව කුඩා ගොවි කාණ්ඩ යටතේ අක්කර 4,497,546 (හෙක්ටයාර් 1,820,133) ක් ලෙස වාර්තා වී ඇත. මෙය කෘෂිකර්ම සංගණනය 2002 අනුව වාර්තා වී ඇති අක්කර 3,643,875 සමඟ සසඳන විට අක්කර 853,667 ක බිම් ප්‍රමාණයකින් වැඩිවී ඇත. එය ප්‍රතිශතයක් ලෙස 23.4% කි.

ගොවි කාරකයාගේ පදිංචිය අනුව පළාත් මට්ටමින් සැලකිල්ලට ගත්විට කුඩා ගොවි කාණ්ඩ යටතේ වැඩිම වගා බිම් ප්‍රමාණය වයඹ (අක්කර 760,218) පළාතෙන් වාර්තා වී ඇති අතර එය කුඩා ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති මුළු වගා බිම් ප්‍රමාණයෙන් 16.9% ක් වේ. එමෙන්ම අඩුම වගා බිම් ප්‍රමාණය උතුරු (අක්කර 289,580) පළාතෙන් වාර්තා වී ඇති අතර එය කුඩා ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් වශයෙන් 6.4% ක් වේ. කුඩා ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති බිම් ප්‍රමාණයන් අදාල ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික් මට්ටමින් සැලකිල්ලට ගත්විට

වැඩිම වගාබිම් ප්‍රමාණය කුරුණෑගල (අක්කර 569,329) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර අඩුම වගා බිම් ප්‍රමාණය වාර්තා වී ඇත්තේ මන්නාරම (අක්කර 34,683) දිස්ත්‍රික්කයෙනි.

වතු යටතේ වාර්තා වී ඇති වගා බිම් ප්‍රමාණය සැලකිල්ලට ගත්විට ආර්ථික සංගණනය 2013/14 කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමට අනුව වාර්තා වී ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 951,983 (හෙක්ටයාර් 385,263) ක් වේ. මෙයින් වැඩිම බිම් ප්‍රමාණය නුවරඑළිය (අක්කර 152,340) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර අඩුම බිම් ප්‍රමාණය වවුනියාව (අක්කර 255) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

ප්‍රධාන වැවිලි බෝගයන් වගා කර ඇති බිම් ප්‍රමාණයන් සැලකීමේදී කුඩා ගොවි කාණ්ඩ යටතේ තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 300,885 (හෙක්ටයාර් 121,766) ක් වන අතර වතු යටතේ වාර්තා වී ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 234,124 (හෙක්ටයාර් 94,749) ක් වේ. මෙයින් ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී කුඩා ගොවි කාණ්ඩ යටතේ තේ වගා කරන ලද වැඩිම බිම් ප්‍රමාණයක් රත්නපුර (අක්කර 83,256) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය කුඩා ගොවි කාණ්ඩ යටතේ තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 27.7% ක් වේ. එමෙන්ම වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී වතු යටතේ වැඩිම තේ වගා කරන ලද බිම් ප්‍රමාණයක් නුවරඑළිය (අක්කර 96,714) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය වතු යටතේ වාර්තා වී ඇති මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් වශයෙන් 41.3% ක් වේ.

කුඩා ගොවි කාණ්ඩ යටතේ රබර් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 137,507(හෙක්ටයාර් 55,648) ක් වන අතර වතු යටතේ වාර්තා වී ඇති පරිදි රබර් වගා කරන බිම් ප්‍රමාණය අක්කර 161,152 (හෙක්ටයාර් 65,219) ක් වේ. ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී කුඩා ගොවි කාණ්ඩ යටතේ රබර් වගා කරන ලද වැඩිම බිම් ප්‍රමාණය කෑගල්ල (අක්කර 38,880) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය කුඩා ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති රබර් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් 28.3% ක් වේ. එමෙන්ම වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්ක අනුව සැලකීමේදී වතු යටතේ වැඩිම රබර් වගා කරන ලද බිම් ප්‍රමාණයද කෑගල්ල (අක්කර 51,035) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය වතු යටතේ රබර් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් වශයෙන් 31.7% ක් වේ.

ශ්‍රී ලංකාවේ පොල් වගාව යටතේ ක්‍රමවත් වගාව සහ විසිරි වගාව ලෙස කාණ්ඩ 2 කින් තොරතුරු රැස්කර ඇත .ඒ අනුව කුඩා ගොවි කාණ්ඩයෙන් ක්‍රමවත් වගාව යටතේ වාර්තා වී ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 241,718 ක් වේ .විසිරි වගාව යටතේ වාර්තා වී ඇති මුළු ගස් ගණන 41,302,188 ක් වේ. එයට පොල් ගස් 40,361,023 ක් ද තැඹිලි ගස් 941,165ක් ද ඇතුළත්ව ඇත. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් කුඩා ගොවි කාණ්ඩ යටතේ ක්‍රමවත්ව පොල් වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය වාර්තා වී ඇත්තේ කුරුණෑගල (අක්කර 97,049) දිස්ත්‍රික්කයෙනි. එය කුඩා ගොවි කාණ්ඩ යටතේ ක්‍රමවත්ව පොල් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 40.1% ක් වේ. එමෙන්ම අඩුම බිම් ප්‍රමාණය වාර්තා වී ඇත්තේ නුවරඑළිය (අක්කර 170) දිස්ත්‍රික්කයෙන් වන අතර එය කුඩා ගොවි කාණ්ඩ යටතේ ක්‍රමවත්ව පොල් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් 0.1% ක් වේ. ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකීමේදී කුඩා ගොවි කාණ්ඩවල විසිරි වගාව යටතේ තැඹිලි ගස්ද ඇතුලුව වැඩිම ගස් සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ කුරුණෑගල (8,177,108) දිස්ත්‍රික්කයෙන් වන අතර අඩුම ගස් සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ නුවරඑළිය (204,353) දිස්ත්‍රික්කයෙනි.

වාර්තා වී ඇති තොරතුරුවලට අනුව වතු යටතේ ක්‍රමවත්ව පොල් වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 162,110 (හෙක්ටයාර් 65,602) ක් වන අතර විසිරි වගාව යටතේ වාර්තා වී ඇති පොල් ගස් සංඛ්‍යාව 711,585 ක් වේ. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී වතු

යටතේ ක්‍රමවත්ව පොල් වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 80,143) හා විසිරි වගාව යටතේ වැඩිම පොල් ගස් සංඛ්‍යාව (435,943) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

2014 කෘෂිකර්ම තොරතුරු රැස් කිරීමට අනුව කුඩා ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති මුළු ගවයින් සංඛ්‍යාව 1,310,862 ක් වේ. එය එළ ගවයින් 1,082,873 (82.6) කින් හා මී ගවයින් 227,989 (17.4) කින් සමන්විත වී ඇත. එළ ගවයින්ගෙන් ගැහැණු සතුන් 893,914ක්ද පිරිමි සතුන් 194,494ක්ද වාර්තා වී ඇති අතර ගැහැණු සංඛ්‍යාවෙන් දැනට කිරි ගනිමින් සිටින සතුන් සංඛ්‍යාව 188,959ක් ලෙස වාර්තා වී ඇත .මී ගවයින්ගෙන් පිරිමි සතුන් 40,503ක් ද ගැහැණු සතුන් 187,486 ක් ද වාර්තා වී ඇත. ගැහැණු සතුන් සැලකිල්ලට ගතහොත් එයින් දැනට කිරි ගන්නා සතුන්ගේ සංඛ්‍යාව 52,727 ක් ලෙස වාර්තා වී ඇත. එමෙන්ම වතු යටතේ වාර්තා වී ඇති මුළු ගවයින් සංඛ්‍යාව 42,591 ක් වන අතර එයට එළ ගවයින් 33,593 ක් හා මී ගවයින් 8,998 ක් ඇතුළත් වී ඇත.

ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් කුඩා ගොවි කාණ්ඩ යටතේ වැඩිම එළ ගවයින් සංඛ්‍යාව කුරුණෑගල (124,328) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය කුඩා ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති මුළු එළ ගවයින් සංඛ්‍යාවෙන් 11.5% ක් වේ. එමෙන්ම කුඩා ගොවි කාණ්ඩ යටතේ අඩුම එළ ගවයින් සංඛ්‍යාව කෑගල්ල (10,029) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය කුඩා ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති මුළු එළ ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් 0.9% ක් වේ. ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී කුඩා ගොවි කාණ්ඩ යටතේ වැඩිම මී ගවයින් සංඛ්‍යාවක් හම්බන්තොට (36,580) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය කුඩා ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් 16.0% ක් වේ. එමෙන්ම කුඩා ගොවි කාණ්ඩ යටතේ අඩුම මී ගවයින් සංඛ්‍යාව යාපනය (246) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය කුඩා ගොවි කාණ්ඩ යටතේ වාරතා වී ඇති මී ගවයින් සංඛ්‍යාවෙන් 0.1% ක් වේ. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී වතු යටතේ වාර්තා වී ඇති වැඩිම එළ ගවයින් සංඛ්‍යාව කුරුණෑගල (11,297) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය වතු යටතේ වාර්තා වී ඇති මුළු එළ ගවයින් සංඛ්‍යාවෙන් 33.6% ක් වේ. එමෙන්ම වතු යටතේ වාර්තා වී ඇති අඩුම එළ ගවයින් සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ මන්නාරම (03) දිස්ත්‍රික්කයෙනි. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී වතු යටතේ වාර්තා වී ඇති වැඩිම මී ගවයින් සංඛ්‍යාවද කුරුණෑගල (2,660) දිස්ත්‍රික්කයෙන් වන අතර එය වතු යටතේ වාර්තා වී ඇති මුළු මී ගවයින් සංඛ්‍යාවෙන් 29.6% ක් වේ.

මෙහිදී රැස්කරන ලද කුකුලන් පිළිබඳ තොරතුරු වලට අනුව ශ්‍රී ලංකාවේ කුඩා ගොවි කාණ්ඩ යටතේ කුකුල් ගහණය 6,330,798ක්ද වතු යටතේ කුකුල් ගහණය 1,364,967ක්ද ලෙස වාර්තා වී ඇත. ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය අනුව සැලකිල්ලට ගත්විට කුඩා ගොවි කාණ්ඩ යටතේ වැඩිම කුකුල් ගහණය ලෙස 2,871,794 ක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ය. එය කුඩා ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති මුළු කුකුල් ගහණයෙන් 45.4.% ක් වේ. එමෙන්ම කුඩා ගොවි කාණ්ඩ යටතේ අඩුම කුකුල් ගහණය හම්බන්තොට (33,803) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. මේ යටතේ වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී වතු අංශයෙන් වාර්තා වී ඇති වැඩිම කුකුල් ගහණය පුත්තලම (373,949) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය වතු යටතේ වාර්තා වී ඇති මුළු කුකුල් ගහණයෙන් 27.4% ක් වේ. කුකුළන් පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමේදී පර්චස් 40 කට වැඩි හෝ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් අලෙවි කරනු ලබන ගොවි කාණ්ඩවලින් හා වතු යටතේ මස් පිණිස ඇති කරනු ලබන කුකුළන් ගහණය කුකුල් ගහණයට ඇතුළත් වී නැත.

මෙම සාරාංශ වාර්තාවේ ඇතුළත් සංඛ්‍යාති ගොවි කාරකයින්ගේ පදිංචි දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් ඇතුළත් කර ඇති බැවින් හා ඉදිරියේදී අවසන් වාර්තාව ගොවි කාණ්ඩ පිහිටා ඇති දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් සකස් කරනු ලබන බැවින් මෙම සාරාංශ වාර්තාවේ සංඛ්‍යාති හා අවසන් වාර්තාවේ සංඛ්‍යාති වෙනස්වීමට ඉඩ ඇත.

පටුන

පිටු අංකය

පළමු පරිච්ඡේදය - හැඳින්වීම 01

දෙවැනි පරිච්ඡේදය - සංකල්ප හා අර්ථ දැක්වීම 03

2.1 ආර්ථික සංගණනය 03

2.2 ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම 03

2.3 සංගණන කාණ්ඩය 03

2.4 නිවාස ඒකකය,සමූහ වාසස්ථානය,වාසය සඳහා නොවන ස්ථානය 03

2.5 ගෘහ කාණ්ඩය 04

2.6 ගොවි කාරකයා,උපගොවි කාරකයා 04

2.7 කාරක තත්ත්වය 06

2.8 ගොවි කාණ්ඩය 07

2.9 බුක්තිය 07

2.10 බිම් කැබැල්ල 08

2.11 ගොවි කාණ්ඩයේ මුළු බිම් ප්‍රමාණය 09

2.12 ශුද්ධ බිම් ප්‍රමාණය, දළ බිම් ප්‍රමාණය 09

2.13 ගෙවත්ත 10

2.14 කෘෂිකාර්මික වැඩ කටයුතු 10

2.15 කුඩා ගොවි කාණ්ඩය 11

2.16 යොමු කාලය 11

2.17 "වත්ත " අර්ථ දැක්වීම 11

2.18 "උප කොටස" අර්ථ දැක්වීම 12

තෙවන පරිච්ඡේදය - කුඩා ගොවි කාණ්ඩ අංශය **13**

3.1 පර්චස් 40ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ පරිභෝජනයට යොදා ගන්නා කුඩා ගොවි කාණ්ඩ 13

3.1.1 දිස්ත්‍රික්ක අනුව ගොවි කාරකයින්ගේ ව්‍යාප්තිය 13

3.1.2 දිස්ත්‍රික්ක අනුව කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාව හා ඒවායෙහි බිම් ප්‍රමාණයේ ව්‍යාප්තිය 17

3.1.3 දිස්ත්‍රික්ක අනුව ගෙවතු වගාවේ ව්‍යාප්තිය 21

3.1.4 දිස්ත්‍රික්ක අනුව ස්ථිර භෝග වගාවේ ව්‍යාප්තිය 24

3.1.5 දිස්ත්‍රික්ක අනුව සත්ව පාලනයේ ව්‍යාප්තිය (ගව පාලනය) 31

3.1.6 දිස්ත්‍රික්ක අනුව එළුවන්, බැටළුවන් හා ඌරන්ගේ ව්‍යාප්තිය 36

3.1.7 දිස්ත්‍රික්ක අනුව කුකුළු පාලනයේ හා අනෙකුත් කුකුල් වර්ගවල ව්‍යාප්තිය 40

3.2 පර්චස් 40 ට වැඩි හෝ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් අලෙවි කරනු ලබන කුඩා ගොවි කාණ්ඩ 46

3.2.1 දිස්ත්‍රික්ක අනුව ගොවි කාරකයින්ගේ සහ උප ගොවි කාරකයින්ගේ ව්‍යාප්තිය 46

3.2.2 දිස්ත්‍රික්ක අනුව කුඩා ගොවි කාණ්ඩවල බිම් ප්‍රමාණයෙහි ව්‍යාප්තිය 50

3.2.3 දිස්ත්‍රික්ක අනුව තේ හා රබර් වගාවේ ව්‍යාප්තිය 52

3.2.4 දිස්ත්‍රික්ක අනුව පොල් වගාවේ ව්‍යාප්තිය 55

3.2.5 දිස්ත්‍රික්ක අනුව එළ ගවයින්ගේ ව්‍යාප්තිය හා කිරි නිෂ්පාදනය 60

3.2.6 දිස්ත්‍රික්ක අනුව මී ගවයින්ගේ ව්‍යාප්තිය හා කිරි නිෂ්පාදනය 64

3.2.7 දිස්ත්‍රික්ක අනුව කුකුල් පාලනයේ ව්‍යාප්තිය 68

3.3 කුඩා ගොවි කාණ්ඩ අංශය (සාරාංශය) 73

3.3.1 කුඩා ගොවි කාණ්ඩවල ගොවි කාරකයින් 73

3.3.2 කුඩා ගොවි කාණ්ඩවල බිම් ප්‍රමාණය 75

3.3.3 කුඩා ගොවිකාණ්ඩවල පොල් වගාව 77

3.3.4 කුඩා ගොවිකාණ්ඩවල එළ ගව පාලනය 79

3.3.5 කුඩා ගොවිකාණ්ඩවල මී ගව පාලනය 81

3.3.6 කුඩා ගොවිකාණ්ඩවල කුකුල් පාලනය 83

සිව්වන පරිච්ඡේදය - වතු අංශය 85

4.1 වතු සංඛ්‍යාව හා ඒවායෙහි බිම් ප්‍රමාණයේ ව්‍යාප්තිය 85

4.2 බෝග වගාව අනුව වතුවල ව්‍යාප්තිය 89

4.2.1 තේ වගාව යටතේ වතුවල ව්‍යාප්තිය 89

4.2.2 රබර් වගාව යටතේ වතුවල ව්‍යාප්තිය 92

4.2.3 පොල් වගාව යටතේ වතුවල ව්‍යාප්තිය 96

4.3 වතු ආශ්‍රිතව සිදු කරන සත්ව පාලනයේ ව්‍යාප්තිය 99

4.3.1 වතු ආශ්‍රිතව සිදු කරන එළ ගවපාලනයේ ව්‍යාප්තිය 99

4.3.2 වතු ආශ්‍රිතව සිදු කරන මී ගවපාලනයේ ව්‍යාප්තිය 104

4.3.3 වතුආශ්‍රිතව සිදු කරන කුකුල් පාලනයේ ව්‍යාප්තිය 109

4.4 අයිතිය අනුව වතුවල ව්‍යාප්තිය 113

පළමු පරිච්ඡේදය

1. හැඳින්වීම

සංවර්ධන දර්ශකයන් පුළුල් පරාසයක් ඔස්සේ පැතිර ඇති මෙම කාල වකවානුව තුළ 2013/14 වර්ෂයන් කේන්ද්‍රකර ගනිමින් පළමුවරට ජාතික වැදගත්කමකින් යුතු ආර්ථික සංගණනයක් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මේ වන විට පවත්වා අවසන් කොට ඇත.

මෙම ආර්ථික සංගණනය, සාමාන්‍යයෙන් ජන හා නිවාස සංගණනයට අනතුරුව පැවැත්වෙන කෘෂිකර්ම සංගණනයත් කර්මාන්ත සංගණනයත් යන සංගණන දෙකෙහි එකතුවකි. ආර්ථිකයේ ප්‍රධාන අංශයන් වන කෘෂිකර්ම, කර්මාන්ත,වෙළෙඳ හා සේවා යන අංශ ආවරණය කරමින් පවත්වන ගණන් ගැනීමේ කටයුතුවලදී කෘෂිකර්ම අංශයේ තොරතුරු ලබා ගැනීම ප්‍රශ්නාවලීන් කිහිපයක් භාවිතා කරමින් වෙනම කොටසක් වශයෙන් සිදු කෙරිණි. ඒ අනුව ආර්ථික සංගණනය 2013/14,“කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම” සහ “කර්මාන්ත, වෙළෙඳ හා සේවා පිළිබඳ ගණන් ගැනීම” ලෙස කොටස් දෙකකින් යුක්තය.

මෙතෙක් ශ්‍රී ලංකාවේකෘෂිකර්ම තොරතුරු රැස්කර ගැනීම සඳහා සංගණන විවිධ ස්වරූපයෙන් සිදු කර ඇත. 1921 දී පවත්වා ඇති නිෂ්පාදන සංගණනය කෘෂිකර්ම සංගණන ඉතිහාසයේ හමුවන පළමුවන ගණන් ගැනීමයි. අනතුරුව 1924 හා 1929 වර්ෂවලදී තවත් අර්ධ සංගණන දෙකක් පවත්වා ඇත. එකී සංගණනයන්හි විශේෂ ලක්ෂණයක් වූයේ වගා කළ ඉඩම් ප්‍රමාණය, සත්ව සංඛ්‍යාති, නිෂ්පාදන ප්‍රමාණය ගම් මට්ටමින් එක් රැස් කිරීමයි. එමෙන් ම 1946, 1952, 1962, 1973, 1982 සහ 2002 යන වර්ෂවලදී පූර්ණ කෘෂිකර්ම සංගණන පවත්වා ඇත. රටේ ඇතැම් ප්‍රදේශවල පැවති අයහපත් වාතාවරණය නිසා 1992 වර්ෂයේදී කෘෂිකර්ම සංගණනයක් පැවැත්වීමට නොහැකිවිය.

ජන සංගණනයක් පැවැත්වීමෙන් අනතුරුව එළඹෙන වර්ෂදෙකේදී කෘෂිකර්ම සංගණනයත් කර්මාන්ත සංගණනයත් පැවැත්වීම සාමාන්‍ය සම්ප්‍රදායවිය. ජන හා නිවාස සංගණනයේදී යොදාගන්නා රාමුවම භාවිතා කළ හැකි වීම නිසා වියදම අවම කර ගැනීමට ඇති හැකියාව ද සැලකිල්ලට ගෙන වසර 10කට වරක් මෙම සංගණන රටාව අනුගමනය කෙරුණි. කෙසේ වෙතත් මෑත කාලීන ආර්ථික ප්‍රවණතාවයන් ද සැලකිල්ලට ගනිමින් 2012 වසරේ පැවති ජන හා නිවාස සංගණනයෙන් අනතුරුව 2013/14 වර්ෂවලදී ආර්ථික සංගණනයේ එක් කොටසක් ලෙස කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම සිදු කරන ලදී. 2002 වර්ෂයේ පැවති අවසන් කෘෂිකර්ම සංගණනයෙන් පසුව වසර 12ක පමණ කාලයක් තුළ ශ්‍රීලංකාවේ ආර්ථිකයට කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් ලැබී ඇති දායකත්වය ඇගයීම සඳහා මෙම සංගණනය බෙහෙවින් ඉවහල් වනු ඇත.

කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම ප්‍රධාන වශයෙන් පහත සඳහන් විෂයන්ට අදාල ප්‍රමාණාත්මක තොරතුරු රැස් කිරීම මූලික අරමුණු කොට ගනිමින් පවත්වනු ලැබීය.

I. ගොවි කාණ්ඩ
II. ගොවි කාරකයින්
III. ඉඩම් භාවිතය හා භුක්තිය
IV. බෝග වගාව

V. සත්ව පාලනය
VI. ජලජීවී වගාව
VII. පොහොර සහ පළිබෝධනාශක භාවිතය
VIII. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය හා අයිතිය

ගණන් ගැනීමේ අදියරයන්

කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම අදියර හතරකින් අවස්ථා තුනක දී සිදු වේ.

I. අක්කර 20ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩ එනම් "වතු"ලැයිස්තුගත කිරීම

අකකර 20ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩ "වතු" ලෙස හඳුනා ගන්නා අතර එම ගොවි කාණ්ඩ E1 උපලේඛනයෙහි ලැයිස්තුගත කරගනී.

II. අක්කර 20ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩ තුළින් විස්තරාත්මක තොරතුරු ලබාගැනීම

සකස් කරගත් E1උපලේඛනය අනුව සියළුම "වතු" වලින් E2 උපලේඛනය භාවිතයෙන් තොරතුරු රැස්කර ගනී.

III. අක්කර 20ට අඩු කුඩා ගොවි කාණ්ඩ අංශය ලැයිස්තුගත කිරීම

අක්කර 20ට අඩු සහ ඉදිරියේ දී විස්තර කෙරෙන පරිදි කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සිදු කරන ස්ථාන "කුඩා ගොවි කාණ්ඩ" ලෙස හඳුනාගෙන SH1 උපලේඛනයෙහි ලැයිස්තුගත කරගනී.

IV. කුඩා ගොවිකාණ්ඩ අංශයෙන් තොරතුරු ලබාගැනීම

සකස් කරගත් SH1උපලේඛනයෙන් සහ SH2උපලේඛනයෙන් "කුඩා ගොවිකාණ්ඩ" අංශයෙන් තොරතුරු රැස්කර ගනී.

වතු අංශයේ ලැයිස්තුගත කිරීම සහ තොරතුරු රැස් කිරීම ග්‍රාම නිලධාරීන් විසින්ද කුඩා ගොවිකාණ්ඩ අංශය ලැයිස්තු ගත කිරීම සහ තොරතුරු රැස්කිරීම කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ වෙනත් රජයේ නිලධාරීන් විසින්ද සාර්ථකව සිදු කරන ලදී.

දෙවැනි පරිච්ඡේදය

2. සංකල්ප හා අර්ථ දැක්වීම

2.1 ආර්ථික සංගණනය

ශ්‍රී ලංකාවේ දේශසීමාව තුළ ක්‍රියාත්මක වන සියලුම ආර්ථික කටයුතු වල නියුතු ඒකකයන් ආවරණය වන පරිදි නියම කරනු ලබන කාලසීමාවක් තුළ කෘෂිකර්ම, කර්මාන්ත, වෙළෙඳ හා සේවා කටයුතු වල තොරතුරු රැස් කිරීම, ගොනු කිරීම, ඇගයීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීමේ හෝ බෙදා හැරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය “ආර්ථික සංගණනය” ලෙස හැඳින් වේ.

2.2 ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම

තොරතුරු එක්රැස් කිරීමේ ඒකකය ලෙස ගොවිකාණ්ඩය පදනම්ව, කෘෂිකාර්මික ව්‍යුහයට අදාල ප්‍රමාණාත්මක තොරතුරු එක් වගා වර්ෂයක් තුළදී රාජ්‍ය අනුග්‍රහය සහිතව දීපව්‍යාප්තව එක්රැස් කිරීමේ ක්‍රියාවලිය “කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම” ලෙස හැඳින්වේ.

2.3 සංගණන කාණ්ඩය

2012 වර්ෂයේ පවත්වන ලද ජන හා නිවාස සංගණනයේදී ග්‍රාමීය ප්‍රදේශවල නිවාස හා ගොඩනැගිලි ඒකක 150ක් පමණ ප්‍රමාණයකින් සමන්විත වන පරිදි හා නාගරිකප්‍රදේශවල ඒකක 200ක් පමණ ප්‍රමාණයකින් සමන්විත වන පරිදි ස්වාභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කරන ලද මායිම් වලින් වෙන් කොට දැක්වූ භූමිප්‍රදේශයක් “ සංගණන කාණ්ඩය”ලෙස හැඳින්වේ.

2.4 නිවාස ඒකකය,සමූහ වාසස්ථානය හාවාසය සඳහා නොවන ස්ථානය

මිනිසුන්ගේ වාසය සඳහාවූද වෙනත් වාසස්ථාන වලින් වෙන්වූද ඇතුළුවීම/ පිටවීම සඳහා වෙනම භාවිතා කළහැකි දොරටුවක් තිබෙන්නාවූද ගොඩනැගිල්ලක්, “නිවාස ඒකකය” ලෙස හැඳින්වේ.

නිවාස ඒකකයක් වීමට,

1. මිනිසුන්ගේ වාසය සඳහා වූ ස්ථානයක් වීම
2. වෙනත් ස්ථානවලින් වෙන් වී තිබීම
3. ඇතුළුවීම/ පිටවීම සඳහා වෙනම දොරටුවක් තිබීම යන

ඉහත ලක්ෂණ සියල්ලම සම්පූර්ණ විය යුතුය.

පොදු අරමුණක් වෙනුවෙන් සාමාන්‍යයෙන් එකිනෙකට නෑකමක් නැති පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් පදිංචිව සිටින ස්ථානයක් “සමූහ වාසස්ථානය”ලෙස හැඳින්වේ.

නිවාස ඒකකයක් හෝ සමූහ වාසස්ථානයක් හෝ නොවන ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් හෝ ඇතැම්විට ගොඩනැගිලි සමූහයක් “වාසය සඳහා නොවන ස්ථානය”ලෙස හැඳින්වේ.

2.5 ගෘහ කාණ්ඩය

එක් පුද්ගලයෙකු තනිව වෙසෙමින් තමාගේ ආහාර පාන ඔහුම පිළියෙල කර ගන්නේ නම් හෝ පුද්ගලයින් සමූහයක් එකට වාසය කරමින් තමන්ගේ ආහාර පාන එක්ව පිළියෙල කර ගන්නේ නම්, ඔහු හෝ එම පුද්ගලයින් සමූහය "ගෘහ කාණ්ඩය"ලෙස හැඳින්වේ.

* ගෘහකාණ්ඩ ඇත්තේ නිවාස ඒකකවල පමණි. සමූහ වාසස්ථානවල සහ වාසය සඳහා නොවන ස්ථානවල ගෘහ කාණ්ඩ නොමැත.

* ගෘහ කාණ්ඩයක සාමාජිකයන් බොහෝ විට එකිනෙකාට නෑකම් ඇති අය වේ. සමහරවිට නෑකම් නැති අය ද සිටිය හැකි ය.

* ගෘහකාණ්ඩයක සාමාජිකයන් පවුලක් ම විය යුතු නැත. මව්පියන් හා දරුවන් පමණක් නොව පවුලෙන් බාහිර අය ද සිටිය හැකි ය. එනම් නෑදෑයින්, මෙහෙකරුවන් ආදිය යි. ඔවුන් පවුලේ සාමාජිකයින් හා පොදුවේ ආහාරපාන ගැනීම සඳහා කටයුතු සලසා ගෙන ඇත්නම් ඒ සියලු දෙනාම එකම ගෘහකාණ්ඩයට අයත් වේ.

* කෙසේ නමුත් මෙහි ස්ථිර පදිංචි නැති (පවුලෙන් බාහිර) පුද්ගලයින් ගෘහකාණ්ඩයේ ස්ථිර පදිංචි පුද්ගල ගණනින් බැහැර කර ඇත.

* සෑමවිට ම නිවාස ඒකකවල පදිංචි පුද්ගලයින් ගණන් ගැනීමේ දී ගෘහකාණ්ඩ වශයෙන් ගණන් ගත යුතුවන අතර, එක් නිවාස ඒකකයක ගෘහකාණ්ඩ එකකට වඩා තිබෙන අවස්ථා ද ඇත.

2.6 ගොවිකාරකයා, උපගොවිකාරකයා

- කෘෂිකාර්මික බෝග වගා කිරීම
- මස්, කිරි හෝ බිත්තර නිෂ්පාදනය සඳහා සතුන් ඇති කිරීම
- මිරිදිය/ කිවුල්දිය (කලපු) / කරදිය ජලජීවීන් වගා කිරීම

පිළිබඳ වගකීම් දරමින් එකී කටයුතු එකක් හෝ කිහිපයක් සම්බන්ධව ගෘහ කාණ්ඩය/ ආයතනය (මතු විස්තර කෙරෙන ගොවි කාණ්ඩය) තුළ ප්‍රධාන තීරණ ගන්නා තැනැත්තා "ගොවි කාරකයා"ලෙස හැඳින්වේ.

මෙහිදී ඔහු / ඇය ඉහත කටයුත්තක් හෝ කටයුතු,

* තමා විසින් කරන්නකු හෝ
* අන් අයගේ සහාය ඇතිව කරන්නකු හෝ
* එම කටයුතුවලට අදාලව කායික වැඩක් නොකර ඒවා මෙහෙයවමින් තීරණ ගන්නා තැනැත්තෙකු හෝ විය හැකි ය.

ඒ අනුව,

* ගොවිකාරකයෙක් ස්වකීය වගා කටයුතු/ සත්ව පාලනය/ ජලජීවී වගාවන් වෙන් වෙන් වශයෙන් හෝ සියල්ලම හෝ තමාම කරන්නකු විය හැකි ය.
* එසේත් නැතිව කෘෂිකර්මයට අදාළ කායිකව වැඩ නොකර එම කටයුතු මෙහෙයවන්නෙකු පමණක් ද විය හැකි ය.
* ඔහු ඉඩම් හෝ කෘෂිකාර්මික සතුන් හෝ ජලජීවී වගාවන් අයිතිකරුවකු හෝ නොවිය හැකි ය. එනම් හිමිකම කාරකත්වය සඳහා සුදුසුකමක් නොවන අවස්ථාවකි.
* ගොවි කාරකයකු වීමට ඔහු තම ශ්‍රමය යොදා ඉඩම් වගා කිරීම, කෘෂිකාර්මික සතුන්ගේ (කිරි දෙවීම, තණ කැවීම වැනි) එදිනෙදා කටයුතු, ජලජීවී වගාව ආශ්‍රිත එදිනෙදා කටයුතුවල නියැලීසිටීම අවශ්‍ය නොවීය. ඉඩම් වගා කිරීම,සතුන් ඇති කිරීම, ජල ජීවී වගා කටයුතු යන අංශ එකක හෝ කිහිපයක එදිනෙදා තීරණ ගැනීම ප්‍රමාණවත් විය.

- "ගොවිකාරකයා" ගොවි කාණ්ඩයක ප්‍රධානියා ය.
- කෘෂිකාර්මික කටයුතු මෙහෙයවීම පිළිබඳ ප්‍රධාන ආර්ථික හා තාක්ෂණික වගකීම ඔහු සතු ය.

ඒ අනුව,

i. සංගණන ඒකකයක ගොවි කාරකයින් කිහිපදෙනෙක් සිටිය හැකි ය.
ii. එක් ගොවි කාණ්ඩයක සිටිය හැක්කේ එක් ගොවි කාරකයෙකු පමණි.

"උපගොවිකාරකයා" යනුවෙන් හැඳින්වෙන්නේ තමාගේ ම වැඩ කරන කාරක තත්ත්වයක් සහිත (මතු විස්තර කෙරේ) ගොවිකාණ්ඩයක් තුළ ගොවිකාරකයාට අමතරව එම ගොවි කාණ්ඩය වෙනුවෙන් ම කෘෂිකාර්මික කටයුතු මෙහෙයවීම සඳහා එදිනෙදා තීරණ ගන්නා වෙනත් සාමාජිකයින්ය.

- උප ගොවිකාරකයා ද ගොවි කාණ්ඩයේ කිසියම් කටයුත්තක් හෝ කටයුතු කිහිපයක් සම්බන්ධව සක්‍රියව තීරණ ගන්නෙකු වේ.
- එහෙත් ඔහු ගොවිකාණ්ඩය පිළිබඳව ප්‍රධාන ආර්ථික හෝ තාක්ෂණික තීරණ ගන්නා නොවේ.
- උප ගොවිකාරකයා ඇතැම් විට ඉඩම් කැබැල්ලක කොටසක්, එක් ඉඩම් කැබැල්ලක්, ඉඩම් කැබලි සියල්ලම හෝ සත්ව පාලන කටයුතු, ජලජීවී වගා කටයුතු මෙහෙය වන්නා විය හැකිය.

ඒ අනුව,

i. උප ගොවිකාරකයින් සිටියහැක්කේ තමාගේම වැඩකරන කාරක තත්ත්වයක් සහිත ගොවි කාණ්ඩයක පමණි.
ii. තමාගේම වැඩකරන කාරක තත්ත්වයක් සහිත ගොවි කාණ්ඩයක උපගොවි කාරකයින් කිහිපදෙනෙකු සිටිය හැකි ය.
iii. පවුලේ සාමාජිකයන් කෘෂිකාර්මික කටයුතු වලට උදව් වූ පමණින් ඔවුන්ව උපගොවි කාරකයින් ලෙස හැඳින්විය නොහැකි ය.
iv. කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වැටුප් ලබන සේවකයින් (කම්කරුවන්) උප ගොවි කාරකයින් ලෙස සැළකිය නොහැකිය.

කුඩා ගොවිකාණ්ඩයක ගොවිකාරකයෙකු වීමට කෘෂිකාර්මික නිෂ්පාදනයක් සම්බන්ධ තීරණ ගන්නෙක් විය යුතුම ය. එබැවින් පහත කාර්යයන්හි නිරත වීම ගොවිකාරකයෙකු වීමට සුදුසු කමක් නොවේ.

I. ජංගම පැළ තවාන් කරුවකු ලෙස රථයක/ අට්ටාලයක පැළ වෙළෙඳාම් කිරීම
II. මල්/ විසිතුරු පැළ වගාවෙහි නිරතව සිටීම
III. දැවමය ශාක (වන) වගා කරුවකු වීම
IV. විනෝදාශයක් වශයෙන් සතුන් ඇති කිරීම
V. විනෝදාංශයක් වශයෙන් විසිතුරු මසුන් ඇති කිරීම

2.7 කාරකතත්ත්වය

කාරකතත්ත්වය ආකාර 4 කි.

- තමාගේම වැඩ කරන
- වෙනත් අය සමඟ හවුලේ
- පුද්ගලික අය වෙනුවෙන්
- ආයතනයක් වෙනුවෙන්

* එක් ගොවිකාරකයෙකුට මෙම කාරක තත්ත්ව කිහිපයක් යටතේ වෙනස් ගොවි කාණ්ඩ කිහිපයක් තිබිය හැකි ය.

* එනම් කාරකතත්ත්වය වෙනස් වූ විට එය වෙනම ගොවි කාණ්ඩයක් බවට පත් වේ.

- **තමාගේම වැඩ කරන**

වෙනත් කිසිම පුද්ගලයෙකුට හෝ ආයතනයකට වගකීමක් හෝ සම්බන්ධයක් නොමැතිව ගොවි කාණ්ඩයට අදාළ සියළුම තීරණ ගන්නා පුද්ගලයකු එකී ගොවි කාණ්ඩයට අදාළව “තමාගේම වැඩ කරන”කාරක තත්ත්වයක් ඇති ගොවි කාරකයා ලෙස හැඳින්වේ.

* ඔහු/ ඇය කම්කරුවන් හෝ සිය පවුලේ අය කෘෂිකර්ම වැඩ කටයුතු සඳහා යොදාගෙන තිබිය හැකි ය.

* අඳයට, බද්දට හෝ වී පොරොන්දුවපිට වී වගා කරන්නන් ද මේ යටතට ගැනේ.

- **වෙනත් අය සමඟ හවුලේ**

ගොවි කාණ්ඩයේ කටයුතු පිළිබඳ එදිනෙදා තීරණ ගැනීම හා වගකීම් දැරීම තවත් එක් අයකු හෝ කීපදෙනෙකු සමඟ සිදුකරයි නම් එම පුද්ගලයා එකී ගොවිකාණ්ඩයට අදාලව “වෙනත් අය සමග හවුලේ” කාරක තත්ත්වයක් ඇති ගොවිකාරකයා ලෙස හැඳින්වේ.

- **පුද්ගලික අය වෙනුවෙන්**

ගොවි කාණ්ඩයක කළමනාකරුවකු/ පාලකයකු/ භාරකරුවකු වශයෙන් පුද්ගලයෙකු හෝ කීපදෙනෙක් වෙනුවෙන්, වැටුපක්/ ප්‍රතිලාභයක් ලබා ගෙන වගකීම හා පාලනය දරන්නේ නම් එම පුද්ගලයා එකී ගොවිකාණ්ඩයට අදාළව “පුද්ගලික අය වෙනුවෙන්” කාරක තත්ත්වයක් ඇති ගොවිකාරකයා ලෙස හැඳින්වේ.

- **ආයතනයක් වෙනුවෙන්**

රජයේ හෝ අර්ධ රජයේ හෝ රජයේ අනුග්‍රහය ලබන සංවිධානයක්, පුද්ගලික ආයතනයක් වෙනුවෙන් වැටුප්/ ප්‍රතිලාභ ලබමින් ගොවි කාණ්ඩයක් මෙහෙයවන්නේ නම් එම පුද්ගලයා එකී ගොවිකාණ්ඩයට අදාළව "ආයතනයක් වෙනුවෙන්" කාරක තත්ත්වයක් ඇති ගොවිකාරකයා ලෙස හැඳින්වේ.

2.8 ගොවි කාණ්ඩය

එක් ගොවි කාරක තත්ත්වයක් යටතේ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සම්පූර්ණව හෝ කොටස් වශයෙන් ප්‍රයෝජනයටගනු ලබන සියළුම ගොඩ/ මඩ ඉඩම්/ සත්ව පාලන කටයුතු/ ජලජීවී වගා කටයුතු සිදු කරන ඒකක"ගොවි කාණ්ඩය" ලෙස හැඳින්වේ.

මේඅනුව,

* ගොවි කාණ්ඩයක් බිම් කැබලි එකකින් හෝ කිහිපයකින් සමන්විත විය හැකි ය.
* එම බිම් කැබලි එකම පරිපාලන බල ප්‍රදේශයක් තුළ හෝ වෙනස් පරිපාලන බල ප්‍රදේශ වල හෝ විසිරී තිබිය හැකි ය.
* ගොවි කාරකයාට එහි අයිතිය තිබිය හෝ නොතිබිය හැකි ය.
* ඒවා නිත්‍යානුකූලව හෝ අනවසරයෙන් වැඩ කරන කැබලි විය හැකි ය.
* ගොවි කාණ්ඩයේ බිම් ප්‍රමාණය (විශාලත්වය) කුමන හෝ ප්‍රමාණයක් විය හැකි ය.
* ගොවි කාණ්ඩයක් මඩ ඉඩම්වලින් පමණක් හෝ ගොඩ ඉඩම්වලින් පමණක් හෝ ගොඩ හා මඩ ඉඩම් යන දෙවර්ගයෙන් ම සමන්විත විය හැකි ය.
* ගොවි කාණ්ඩයක් බෝග වගාවලින් පමණක්, සත්ව පාලනයකින් පමණක්, ජල ජීවී වගා කටයුතුවලින් පමණක් හෝ ඉන් කිහිපයක සංකලනයක් ලෙසින් හෝ සමන්විත විය හැකි ය.

2.9 බුක්තිය

කාරකයා ගොවිකාණ්ඩයේ කෘෂිකාර්මික කටයුතු සඳහා භූමිය යොදවා ගන්නා නීත්‍යානුකූල හෝ නීත්‍යානුකූල නොවන ස්වරූපය "බුක්තිය" ලෙස හැඳින් වේ.

කුඩා ගොවිකාණ්ඩ තොරතුරු රැස්කිරීම සඳහා බුක්තිය ආකාර හතකින් දැක්විය හැකි ය.

1) තනි අයිතිය
ගොවි කාරකයාට හෝ ගොවි කාරකයාගේ පවුලේ සාමාජිකයකුට අයිති ඉඩම් මේ යටතට ගැනේ. මේවා ප්‍රවේනි හා සින්නක්කර ඉඩම් වේ.

2) බල පත්‍රයක් යටතේ
බලපත්‍රයක් යටතේ බුක්ති විඳීම යනු එල්.ඩී.ඕ./සී.එල්.ඕ./ එල්.ආර්.සී. දීමනා, ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර, ජනපද ව්‍යාපාර යටතේ රජයෙන් බදු හෝ අවසර පත් ලැබීම මගින් භුක්ති විඳීම සැලකේ.ස්වර්ණ භූමි,ජය භූමි, වැනි වැඩ සටහන් මගින් බලපත්‍/ ලබා දී ඇති ඉඩම් ද මෙයට ඇතුලත් වේ.

3) අඳයට/ බද්දට
වගා අස්වැන්නෙන් පංගුවක් හෝ ඒ වෙනුවෙන් මුදල් දීමෙන් වගා කෙරෙන ඉඩම් අඳයට හෝ බද්දට ගත් බුක්ති විඳීමක් ලෙස සැලකේ.

4) හවුල් අයිතිය
හවුල් අයිතියක් ඇති වන්නේඑක් පුද්ගලයෙකුට වඩා වැඩි අයිතිකරුවන් ප්‍රමාණයන් සිටින අවස්ථාවකය. තට්ටු මාරු, කට්ටි මාරු ක්‍රමයට බුක්ති විඳිමින් වගා කරන බිම්ද මේ යටතට ගැනේ.

5) බෙත්ම ක්‍රමය
බෙත්ම ක්‍රමය යනු ගොවි කාණ්ඩ/ වගා බිමට ජලයසැපයීම මත පදනම් වූ ක්‍රමයකි. කිසියම් කුඹුරු යායක කන්නයකදී නිකුත් කරනු ලබන ජල ප්‍රමාණය සීමිත නිසා එම යායේ වගා කරනු ලබන බිම් ප්‍රමාණයට වඩා අඩු බිම් ප්‍රමාණයක් යායට අදාළ ගොවීන් අතර මුල් බිම් ප්‍රමාණයේ අනුපාතයට බෙදාදී බෝග වගා කරනු ලබන විට ඇතුලත් වන බුක්ති ක්‍රමය වේ. මෙහිදී තමාගේ කුඹුරෙන් කොටසක් වෙනුවට වෙනත් අයෙකුගේ කුඹුරකින් කොටසක් ලැබිය හැකි ය.

6) අනවසර
ගොවි කාරකයාට හෝ පවුලේ සාමාජිකයකුට කිසිම අයිතියක් නැතිව බුක්ති විඳින ඉඩම් අනවසර බුක්තිය යටතට ගැනේ. රජයේ බිම්/ රක්ෂිත බිම් ආදියබුක්ති විඳීම ද මෙයට අයත් වේ.

7) වෙනත්
ඉහත විස්තර කළ කිසිදු කාණ්ඩයකට ඇතුලත් කළ නොහැකි බිම් කැබලි වෙනත් අයුරකින් බුක්ති විඳින යටතට දැක්විය හැකිය.ඒ අනුව මුදලින් හෝ අස්වැන්නෙන් ගෙවීම් නොකර කාරකත්වය දරණ පෞද්ගලික බිම් කැබලි මෙයට ඇතුලත් වේ.

2.10 බිම් කැබැල්ල

ගොවි කාණ්ඩයට අයත් බිම් කොටසක්,එම ගොවි කාණ්ඩයට අයත් නොවූ බිමකින්, ජල මාර්ගයකින්, පාරකින්, කැලැවකින් හෝ වෙනත් බුක්තියක් සහිත ඉඩමකින් සම්පූර්ණයෙන් මමායිම්ව ඇත්නම් එය“බිම් කැබැල්ල”ලෙස හැඳින්වේ.

* බුක්තිය වෙනස්නම් එකට යාව පිහිටන බිම් කොටස් වෙන වෙන ම ඉඩම් කැබලි ලෙස සැලකේ.
* එකම බුක්තිය යටතේ එකිනෙකට යාව පිහිටි බිම් කොටස් කිහිපයක් එකම කැබැල්ලක් ලෙස සැලකේ.

ඉඩමක ස්වභාවය අනුව හෝ එහි වගා කරනු ලබන බෝග වර්ග අනුව හෝ බිම් කැබැල්ලක් වෙන්කර දැක්විය නොහැකිය.

2.11 ගොවිකාණ්ඩයේ මුළු බිම් ප්‍රමාණය

සියලුම වගා කළ හා වගා නොකළ, භෞතික වශයෙන් නිශ්චය කරන ලද බිම් ප්‍රමාණයන්ගේ එකතුව“ගොවි කාණ්ඩයේ මුළු බිම් ප්‍රමාණය” ලෙස හැඳින්වේ.

* ගොවිකාණ්ඩයක් සියළුම ගොඩනැගිලි, ගල්තලා, ළඳු කැලෑආදියට යටවී ඇති බිම් ප්‍රමාණයන්ගෙන් ද, වගා කරන ලද හෝ වගා නොකරන ලද ගොඩ හා මඩ ඉඩම් වලින් ද සමන්විත වේ.

* මෙය ගොවි කාණ්ඩයේ “ශුද්ධ බිම් ප්‍රමාණය” ලෙස ද හැඳින් වේ.

මුළු බිම් ප්‍රමාණය සැළකීමේ දී ගොවි කාරකයා විසින් පාලනය හා වගකීම දරන,
- ඔහුටම අයත්,
- අන් අයගෙන් බද්දට ගෙන ඇති,
- වෙනස් බුක්ති ක්‍රමයන් යටතේ ඇති,
- එමගොවි කාණ්ඩයේ පිහිටි සියළුම ගොඩනැගිලිවලට යටව ඇති,

සම්පූර්ණ බිම් ප්‍රමාණය ඇතුළත් විය යුතු ය.

2.12 ශුද්ධ බිම් ප්‍රමාණය, දළ බිම් ප්‍රමාණය

කිසියම් බිම් කැබැල්ලක හෝ ඉඩමක භෞතික වශයෙන් නිශ්චය කරන ලද බිම් ප්‍රමාණය “ශුද්ධ බිම් ප්‍රමාණය” ලෙස හැඳින්වේ.

ශුද්ධ බිම් ප්‍රමාණයක් තුළ බෝගයන් යටතේ වගා කොට ඇතැයි ඇස්තමේන්තු කරන ලද බිම් ප්‍රමාණය “දළ බිම් ප්‍රමාණය ” ලෙස හැඳින්වේ.

එහිදී බිම් ප්‍රමාණය නිශ්චය කරනු ලබන්නේ,

- අක්කරයට නියමිත පදනමක් මත වගා කොට ඇති ගස්/ වැල්/ පඳුරු ගණන අනුව හෝ,
- අක්කරයක් සඳහා සාමාන්‍යයෙන් ඒ ඒ බෝග යටතේ වැපිරීම හෝ සිටුවීම සඳහා යොදාගත් බීජ ප්‍රමාණයට අනුරූපී අන්දමින් බිම් ප්‍රමාණය ගණනය කිරීමෙනි.

එහෙත් මෙහිදී,

- බිම් ප්‍රමාණය මිනුම් පටියෙන් මැන නිශ්චය කර නොමැති වීමට පිළිවන.

තවද,

එක් බිම් කැබැල්ලක්/ ඉඩමක් තුළ මිශ්‍ර අන්දමින් බෝග කිහිපයක් වගා කර ඇත්නම් දළ බිම් ප්‍රමාණය වශයෙන් එකී බෝග යටතට ඇස්තමේන්තු කරන ලද බිම් ප්‍රමාණයන්ගේ එකතුව ගත් විට ශුද්ධ බිම් ප්‍රමාණයට සමාන නොවී ඊට අඩු හෝ වැඩි හෝ විය හැකි ය.

2.13 ගෙවත්ත

I. පර්චස් 20කට සමාන හෝ ඊට අඩු ඉඩම් කැබැල්ලක ගොවි කාරකයා පදිංචි නිවසක් සහිතව නිවසේ පරිභෝජනය සඳහා හෝ වෙළෙඳපොළ සඳහා කෘෂිකාර්මික නිෂ්පාදනයක් (බෝග වගාව, සත්ව පාලනය, ජල ජීවී වගාව ආශ්‍රිතව) සිදුවේ නම් එය ද,

II. පර්චස් 20 කට වැඩි ඉඩම් කැබැල්ලක ගොවි කාරකයා පදිංචි නිවසක් සහිතව වැඩි ප්‍රමාණයක් නිවසේ පරිභෝජනය සඳහාකෘෂිකාර්මික නිෂ්පාදනයක් (බෝග වගාව, සත්ව පාලනය,ජල ජීවී වගාවආශ්‍රිතව) සිදුවේ නම් එය ද, “ගෙවත්ත” ලෙස හැඳින්වේ.

පදිංචි නිවසක් සහිත බිම් කැබැල්ලක් ගෙවත්තක්වන සහ නො වන අවස්ථා කිහිපයක් පහත පරිදි පෙන්වා දිය හැකි ය.

ගෙවත්තක් වීම	ගෙවත්තක් නොවීම
1. ගොවිකාරකයා පදිංචි නිවස සහිත පර්චස් 19ක ඉඩමෙහිතේ වගා කර ඇති අතර දළු අස්වැන්න අලෙවි කරයි.	1. ගොවිකාරකයා පදිංචි නිවස සහිත පර්චස් 35ක ඉඩමෙහි ලොකු ළූණු වගා කර ඇති අතර නිෂ්පාදනයෙන් වැඩි කොටස විකිණීම සඳහාය.
2. ගොවිකාරකයා පදිංචි නිවස සහිත අක්කර 2ක ඉඩම ස්ථිර බෝග කිහිපයකින් සහ කාලීන බෝග වගාවකින් යුතු වුව ද කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටස නිවසේ පරිභෝජනය සඳහාය.	2. ගොවිකාරකයා පදිංචි නිවස සහිත අක්. 2 ක ඉඩමෙහි ගම්මිරිස්, කෝපි සහ තවත් කාලීන බෝග කිහිපයක් වගා කර ඇති අතර වැඩි කොටස විකිණීම සඳහා වේ.

(ගොවිකාරකයා පදිංචි නිවසක් නොතිබේ නම් එම බිම් ප්‍රමාණය කිසි විටෙකත් ගෙවත්තක් ලෙස හඳුනානොගනී.)

2.14 කෘෂිකාර්මික වැඩකටයුතු

ගොවි කාණ්ඩයක බෝග වගා කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සතුන් ඇති කිරීම, ජල ජීවී වගාව යන සෑම කටයුත්තක්ම සහ ඒ හා සම්බන්ධිත කටයුතු“කෘෂිකාර්මික වැඩ කටයුතු” ලෙස හැඳින්වේ.

ඔහුගේ ගොවි කාණ්ඩයට සම්බන්ධව,

- කය වෙහෙසා කරන වැඩ
- ගොවිපලේ සැලසුම් සම්පාදනය / ගිණුම් තැබීම ආදී කාර්යයන්
- ගොවිපලෙන් පිටතදී කෙරෙන රසායනික පොහොර, කෘමි නාශක ආදිය මිලදී ගැනීම හෝ ප්‍රාථමික නිෂ්පාදිත ද්‍රව්‍ය අලෙවි කිරීම ආදිය කෘෂිකාර්මික වැඩකටයුතු වේ.

2.15 කුඩා ගොවි කාණ්ඩය

අක්කර 20ට අඩු බිම් කැබලි සහිත සියලුම කෘෂිකාර්මික ඒකක "කුඩා ගොවි කාණ්ඩය" ලෙස හැඳින්වේ.

2.16 යොමු කාලය

තොරතුරු එකතුකර ගැනීම සඳහා පාදක කරගන්නා කාලය ආර්ථික සංගණනයේ "යොමු කාලය ලෙස" හැඳින්වේ.

ආර්ථිකසංගණයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමට අදාල යොමු කාලය ලෙස සාමාන්‍යයෙන් මාස 12 ක කාලසීමාවක් සලකණු ලබයි.

2.17 "වත්ත"අර්ථ දැක්වීම

එකම කාරකතත්ත්වයක් යටතේ හා එකම භුක්තියක් යටතේ වන භූමි ප්‍රමාණයකින් අවම වශයෙන් එක් බිම් කැබැල්ලක්වත් අක්කර 20ක් හෝ ඊට වඩා වැඩි වන්නේ නම් එම ගොවි කාණ්ඩය වත්තක් ලෙස සලකනු ලැබේ. මෙහිදී වත්තේ සේවය කරනු ලබන කම්කරුවන්ගේ ප්‍රමාණය පිළිබඳව සැලකිල්ලට ගනු නොලැබේ.

I. එකම කාරක තත්ත්වය

වත්ත යන්න නිර්වචනය කිරීමේදී කාරක තත්ත්වයට විශේෂ ස්ථානයක් හිමිවන අතර වතු ඇසුරින් ප්‍රධාන වශයෙන්ම කාරක තත්ත්වයන් 4 ක් හඳුනාගත හැකිය. එනම්,

- ❖ තමා විසින්ම වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්
- ❖ රජයේ ආයතනයක්, වෙළෙඳ සමාගමක් හෝ කළමනාකරණ නියෝජිත ආයතනයක් වෙනුවෙන් වැඩකටයුතු මෙහෙයවන අධිකාරී, කොන්දොස්තර වැනි වැටුප් ලබන සේවකයන්
- ❖ පුද්ගලික අයෙකු හෝ පිරිසක් වෙනුවෙන් වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්
- ❖ තවත් හවුල්කරුවන් සමඟ වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්

වත්තක් වීම සඳහා ඉහත සඳහන් කරන ලද කාරකතත්වයන් ඇසුරින් එකම කාරකතත්වයක එම වත්ත හෝ එහි කොටස් පැවතිය යුතුය.

II. එකම භුක්තිය

යම් පුද්ගලයෙකුට හෝ ආයතනයකට භූමිය අයිතිව ඇති අවස්ථාවක එම පුද්ගලයා හෝ ආයතනය මෙන්ම වෙනත් පුද්ගලයෙකු හෝ ආයතනයක් එම භූමිය තුළ වගා කටයුතු, සත්ව පාලන කටයුතු කරමින් එහි අස්වැන්න හෝ නිෂ්පාදනය ලබා ගනී නම් එය හම භූමිය භුක්ති විඳීම වන අතර එය භුක්තිය ලෙස හඳුන්වයි.

වත්තක් තුළදී මෙම භුක්තිය ප්‍රධාන වශයෙන් ස්වරූප 6 ක් යටතේ හඳුනාගත හැකිය. එනම්,

- ❖ රජයේ
- ❖ අර්ධ රජයේ
- ❖ වැවිලි සමාගම්
- ❖ පුද්ගලික සමාගම්
- ❖ තනි පුද්ගල
- ❖ පුද්ගලික හවුල්

භුක්තිය කවර ආකාර වුවද ආර්ථික සංගණනයේ වතු නිර්වචනයට අනුව වත්තක් වීම සඳහා වත්තක සියළුම කොටස් **එකම භුක්තියක්** යටතේ විය යුතුය.

III. ගොවි කාණ්ඩය

එකම කාරක තත්ත්වයක් යටතේ, කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා සම්පූර්ණව හෝ කොටස් වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන සියළුම ගොඩ, මඩ, සතුන්, ජලජීවී වගා කටයුතු සිදුකරන කෘෂිකාර්මික බිම්, **ගොවි කාණ්ඩයක්** වශයෙන් හැඳින්වේ.

IV. බිම් කැබැල්ල

ගොවි කාණ්ඩයට අයත් බිම් කොටසක්, එම ගොවිකාණ්ඩයට අයත් නොවූ බිමකින්, ජල මාර්ගයකින්, පාරකින්, කැලෑවකින් සම්පූර්ණයෙන්ම මායිම්වී ඇත්නම් එය **බිම් කැබැල්ලක්** ලෙස හැඳින්වේ.

ගොවිකාණ්ඩය බිම් කැබලි කිහිපයකින් සමන්විත වන අවස්ථාවකදී වත්තක් ලෙස හඳුනාගන්නා ආකාරය පැහැදිලි කරගැනීම සඳහා උප කොටස යන්න හඳුනාගත යුතුය.

2.18 "උපකොටස" අර්ථ දැක්වීම

විශාල ගොවි කාණ්ඩයක්, ගොවි කාණ්ඩයේ පරිපාලන පහසුව සඳහා කොටස් කිහිපයකට වෙන්කොට එම කොටස් වෙන වෙනම නම්කර ඇති අවස්ථාවකදී එලෙස නම් කරන ලද කොටස් "උපකොටස්" (Sub Division) ලෙස හැඳින්වේ. මෙම උපකොටස් වල එකතුව වත්තක් වන අතර වත්තක උපකොටස් එකිනෙකට යාබදව මෙන්ම එකිනෙකට ඈත්වද පිහිටිය හැකිය. උපකොටස් කෙලෙස පිහිටියද උපකොටස් වල විශේෂ ලක්ෂණය වනුයේ ඊට අදාල පරිපාලන කටයුතු නිශ්චිත එක් ස්ථානයකින් සිදු වීමයි.

ගොවිකාණ්ඩයක් බිම් කැබලි කිහිපයකින් සමන්විත වන අවස්ථාවකදී එම බිම් කැබලි එකිනෙකට යාබද නොවන අයුරින් පිහිටිය හැක. එවැනි අවස්ථාවක එම කැබලි අතර අක්කර 20ට වැඩි කැබලි මෙන්ම අක්කර 20ට අඩු කැබලිද තිබිය හැක. මෙම කැබලි උපකොටස් ලෙස වෙන්කොට ඇත්නම් පමණක් ඒ අතර ඇති අක්කර 20ට අඩු කැබලිද වතු ගණයට අයත් වන අතර උපකොටස් ලෙස නම්කර නොමැති නම් වතු ගණයට අයත් නොවේ.

තෙවන පරිච්ඡේදය

3. කුඩා ගොවි කාණ්ඩ අංශය

ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට පවත්වන ලද ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමේ අදියරේ දී එක් රැස් කළ තොරතුරු කුඩා ගොවි කාණ්ඩ අංශය, වතු අංශය යනුවෙන් ප්‍රධාන අංශ 2ක් ඔස්සේ සිදු කරන ලදී. එහිදී කුඩා ගොවි කාණ්ඩ අංශය යටතේ ප්‍රධාන කොටස් 2ක් ඔස්සේ තොරතුරු එක් රැස් කරනු ලැබිණි. එනම්,

i. පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ පරිභෝජනයට යොදා ගන්නා කුඩා ගොවි කාණ්ඩ

ii. පර්චස් 40 ට වැඩි හෝ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් අලෙවි කරනු ලබන කුඩා ගොවි කාණ්ඩ

3.1 පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ පරිභෝජනයට යොදා ගන්නා කුඩා ගොවි කාණ්ඩ

3.1.1 දිස්ත්‍රික්ක අනුව ගොවි කාරකයින්ගේ ව්‍යාප්තිය

මේ යටතේ 2014 වසරේ පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ පරිභෝජනයට යොදා ගන්නා කුඩා ගොවි කාණ්ඩවල ගොවි කාරකයින් සංඛ්‍යාව ඔවුන් පදිංචි පළාත/ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ සාරාංශ වාර්තාව නිකුත් කරන මෙම අදියරේදී ඉහත ගොවි කාණ්ඩය යටතේ රටේ මුළු ගොවි කාරකයින් සංඛ්‍යාව ඔවුන් පදිංචි දිස්ත්‍රිකය අනුව බෙදී යන ආකාරය පැහැදිලි කළ හැක.

මේ අනුව, 2014 කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කිරීමේදී මෙම කාණ්ඩය යටතේ රටේ වාර්තා වී ඇති මුළු ගොවි කාරකයින් සංඛ්‍යාව 1,983,401 ක් වේ. පසුගිය කෘෂිකර්ම සංගණනයේදී (2002 වර්ෂයේ) මෙම සංඛ්‍යාව 1,462,904 ක් ලෙස වාර්තා වී ඇති අතර 2002 – 2014 කාල පරාසය තුළ මෙම සංඛ්‍යාව 520,497 (35.6%) කින් වැඩිවී ඇත.

ගොවි කාරකයින් පදිංචි පළාත් මට්ටමෙන් සැලකිල්ලට ගතහොත් වැඩිම ගොවි කාරකයින් සංඛ්‍යාව බස්නාහිර පළාතෙන් (725,921) වාර්තා වී ඇති අතර එය මුළු ගොවි කාරකයින් සංඛ්‍යාවෙන් 36.6% ක් වේ. අඩුම ගොවි කාරකයින් සංඛ්‍යාව උතුරුමැද පළාතෙන් (66,230) වාර්තා වී ඇති අතර එය මුළු ගොවි කාරකයින් සංඛ්‍යාවෙන් 3.3% ක් වේ. දකුණු පළාතෙන් ගොවි කාරකයින් 241,984 (12.2%) ක් ද නැගෙනහිර පළාතෙන් ගොවි කාරකයින් 221,707 (11.2%) ක් ද වයඹ පළාතෙන් ගොවි කාරකයින් 204,380 (10.3%) ක් ද මධ්‍යම පළාතෙන් ගොවි කාරකයින් 173,605 (8.8%) ක් ද

සබරගමුව පළාතෙන් ගොවි කාරකයින් 154,864 (7.8%) ක් ද උතුරු පළාතෙන් ගොවි කාරකයින් 123,836 (6.2%) ක් ද ඌව පළාතෙන් ගොවි කාරකයින් 70,874 (3.6%) ක් ද වාර්තා වී ඇත.

ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම ගොවි කාරකයින් සංඛ්‍යාව ගම්පහ (330,177) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය මුළු ගොවි කාරකයින් සංඛ්‍යාවෙන් 16.7% කි. දෙවනුවට වැඩිම ගොවි කාරකයින් සංඛ්‍යාව කොළඹ (239,969) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය මුළු ගොවි කාරකයින් සංඛ්‍යාවෙන් 12.1% කි. තෙවනුවට වැඩිම ගොවි කාරකයින් සංඛ්‍යාව කළුතර (155,775) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය මුළු ගොවි කාරකයින් සංඛ්‍යාවෙන් 7.9% කි. අඩුම ගොවි කාරකයින් සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ කිලිනොච්චි (5,533) දිස්ත්‍රික්කයෙන් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 0.3% කි.

ගොවි කාරකයින් 200,000 ට වැඩි සංඛ්‍යාවක් වාර්තා වන්නේ ගම්පහ (330,969) සහ කොළඹ (239,969) යන දිස්ත්‍රික්කවලින් පමණි. 150,000 – 200,000 අතර ගොවි කාරකයින් සංඛ්‍යාවක් කළුතර (155,775) දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර 100,000 – 150,000 ගොවි කාරකයින් සංඛ්‍යාවක් ගාල්ල (115,775), කුරුණෑගල (114,702) සහ මහනුවර (113,553) යන දිස්ත්‍රික්කවලින් වාර්තා වේ. ගොවි කාරකයින් 50,000 – 100,000 අතර සංඛ්‍යාවක් මඩකලපුව (95,269), පුත්තලම (89,678), යාපනය (89,379), අම්පාර (84,277), කෑගල්ල (82,828), මාතර (79,233), රත්නපුර (72,036) සහ බදුල්ල (56,766) යන දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇත. සෙසු දිස්ත්‍රික්කවල ගොවි කාරකයින් සංඛ්‍යාව 50,000 ට අඩු වන අතර වවුනියාව (12,876), මන්නාරම (9,777), මුලතිව් (6,271) සහ කිලිනොච්චි (5,533) යන දිස්ත්‍රික්ක කැපී පෙනෙන ලෙස අඩු අගයන් පෙන්වන දිස්ත්‍රික්ක වේ.

වගු අංක 3.1.1 : ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ පරිභෝජනයට යොදා ගන්නා ගොවි කාණ්ඩවල ගොවි කාරකයින් සංඛ්‍යාව - 2014

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	ගොවි කාරකයින්	
	සංඛ්‍යාව	%
කොළඹ	239,969	12.1
ගම්පහ	330,177	16.6
කළුතර	155,775	7.9
මහනුවර	113,553	5.7
මාතලේ	28,944	1.5
නුවරඑළිය	31,108	1.6
ගාල්ල	115,226	5.8
මාතර	79,233	4.0
හම්බන්තොට	47,525	2.4
යාපනය	89,379	4.5
මන්නාරම	9,777	0.5
වවුනියාව	12,876	0.6
මුලතිවු	6,271	0.3
කිලිනොච්චිය	5,533	0.3
මඩකලපුව	95,269	4.8
අම්පාර	84,277	4.2
ත්‍රිකුණාමලය	42,161	2.1
කුරුණෑගල	114,702	5.8
පුත්තලම	89,678	4.5
අනුරාධපුර	39,932	2.0
පොළොන්නරුව	26,298	1.3
බදුල්ල	56,766	2.9
මොණරාගල	14,108	0.7
රත්නපුර	72,036	3.6
කෑගල්ල	82,828	4.2
ශ්‍රී ලංකාව	**1,983,401**	**100.0**

සිතියම් අංක 1 : දිස්ත්‍රික්ක අනුව පර්චස් 40ට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ කාණ්ඩයේ පරිභෝජනයට යොදාගන්නා කුඩා ගොවි කාණ්ඩ වල සිටින ගොවි කාරකයින් ගණන



ගොවි කාරකයින් සංඛ්‍යාව ඔවුන්ගේ පදිංචි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

3.1.2 දිස්ත්‍රික්ක අනුව කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාව හා ඒවායෙහි බිම් ප්‍රමාණයේ ව්‍යාප්තිය

මේ යටතේ 2014 වසරේ පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ පරිභෝජනයට යොදා ගන්නා කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාව හා එහි බිම් ප්‍රමාණය ගොවි කාරකයා පදිංචි පළාත/ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

ශ්‍රී ලංකාව තුළ වාර්තා වී ඇති මුළු කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය පිළිබඳ තොරතුරු මෙම සාරාංශ වාර්තාවෙහි අන්තර්ගත කොට ඇත. ඒ අනුව දිවයිනේ මෙම කාණ්ඩය යටතේ වාර්තා වී ඇති මුළු කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාව 2,034,331 ක් වේ. පසුගිය කෘෂිකර්ම සංගණනයේදී (2002) වාර්තා වූ ගොවි කාණ්ඩ සංඛ්‍යාව (1,462,904) සමඟ සසඳන විට 2014 වර්ෂයේ දී මෙම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 571,427 (39.1%) කින් වැඩි වී ඇත.

ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාව ගම්පහ (336,914) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය මුළු කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 16.6% කි. දෙවනුවට වැඩිම කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ කොළඹ (241,311) දිස්ත්‍රික්කයෙනි. එය මුළු කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 11.9% කි. තෙවනුවට වැඩිම කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ කළුතර (158,241) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 7.8% කි. අඩුම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ කිලිනොච්චි (5,542) දිස්ත්‍රික්කයෙනි. එය මුළු කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාවෙන් 0.3% කි.

100,000 - 125,000 අතර ගොවි කාණ්ඩ සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල (117,451), මහනුවර (116,586) හා ගාල්ල (116,279) යන දිස්ත්‍රික්කවලිනි. 50,000 – 100,000 අතර ගොවි කාණ්ඩ සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මඩකලපුව (95,433), පුත්තලම (92,231), යාපනය (90,423), මාතර (80,407), අම්පාර (88,032), කෑගල්ල (86,614), රත්නපුරය (77,563) හා බදුල්ල (60,192) යන දිස්ත්‍රික්කවලිනි. 25,000 - 50,000 අතර ගොවි කාණ්ඩ සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ හම්බන්තොට (48,578), ත්‍රිකුණාමලය (43,457), අනුරාධපුරය (41,062), නුවරඑළිය (34,308), මාතලේ (29,839) හා පොළොන්නරුව (26,947) යන දිස්ත්‍රික්කවලිනි. 25,000ට අඩු ගොවි කාණ්ඩ සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මොණරාගල (16,147), වවුනියාව (13,097), මන්නාරම (11,357), මුලතිව් (6,320) හා කිලිනොච්චිය (5,542) යන දිස්ත්‍රික්කවලිනි. පසුගිය කෘෂිකර්ම සංගණනය (2002) සමඟ සසඳන විට කොළඹ දිස්ත්‍රික්කයේ කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාව වැඩි වශයෙන්ම වැඩිවී ඇති අතර එම වැඩිවීම කුඩා ගොවි කාණ්ඩ 97,816 ක් වේ. කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාව වැඩි වශයෙන් වැඩිවී ඇති සෙසු දිස්ත්‍රික්ක ලෙස ගම්පහ (91,095), ගාල්ල (31,036), මහනුවර (27,863) හා කළුතර (35,549) දැක්විය හැක. අනෙක් අතින් බලන විට මුලතිව් දිස්ත්‍රික්කයේ කුඩා ගොවි කාණ්ඩ සංඛ්‍යාවෙහි පහත වැටීමක් වාර්තා වී ඇත. එම පහත වැටීම කුඩා ගොවි කාණ්ඩ 29 කි.

කුඩා ගොවි කාණ්ඩවල බිම් ප්‍රමාණ සැලකිල්ලට ගතහොත් 2014 කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම අනුව කුඩා ගොවි කාණ්ඩවල බිම් ප්‍රමාණය අක්කර 239,677 (හෙක්ටයාර් 96,996) ක් වේ. පසුගිය කෘෂිකර්ම සංගණනය සමඟ සසඳන විට මෙය අක්කර 37,474 (හෙක්ටයාර් 15,174) ක වැඩි වීමක් වාර්තා කර ඇත.

ගොවි කාරකයින් පදිංචි පළාත් අනුව කුඩා ගොවි කාණ්ඩවල බිම් ප්‍රමාණ සැලකිල්ලට ගතහොත් වැඩිම බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ බස්නාහිර පළාතෙන් වන අතර එය අක්කර 77,480

(හෙක්ටයාර් 31,356) ක් වේ. එය මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 32.4% ක් වේ. අඩුම බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ ඌව පළාතෙන් වන අතර එය අක්කර 8,516 (හෙක්ටයාර් 3,446) ක් වේ. එය මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 3.6% ක් වේ. අක්කර 25,000 – 50,000 අතර බිම් ප්‍රමාණයක් දකුණ (අක්කර 29,989) හා වයඹ (අක්කර 29,696) යන පළාත්වලින් වාර්තා වී ඇති අතර එය ප්‍රතිශත වශයෙන් අනුපිළිවෙලින් 12.5% ක් හා 12.4% ක් වේ. අක්කර 25,000 ට අඩු බිම් ප්‍රමාණයක් නැගෙනහිර (අක්කර 23,441), මධ්‍යම (අක්කර 20,957), සබරගමුව (අක්කර 20,474), උතුරු (අක්කර 18,166), උතුරුමැද (අක්කර 10,958) හා ඌව (අක්කර 8,516) යන පළාත්වලින් වාර්තා වී ඇති අතර එය ප්‍රතිශත වශයෙන් අනුපිළිවෙලින් 9.9% ක්, 8.8% ක්, 8.6% ක්, 7.5% ක්, 4.5% ක් හා 3.6% ක් වේ.

ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව කුඩා ගොවි කාණ්ඩවල බිම් ප්‍රමාණ සැලකිල්ලට ගතහොත් වැඩිම බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් වන අතර එය අක්කර 38,343 (හෙක්ටයාර් 15,517) ක් වේ. එය මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 16.0% ක් වේ. අඩුම බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ මන්නාරම දිස්ත්‍රික්කයෙන් වන අතර එය අක්කර 1,097 (හෙක්ටයාර් 444) ක් වේ. එය මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 0.5% ක් වේ. අක්කර 15,000 – 25,000 අතර බිම් ප්‍රමාණයක් කොළඹ (අක්කර 21,742), කුරුණෑගල (අක්කර 18,705), කළුතර (අක්කර 17,395) යන දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇති අතර එය ප්‍රතිශත වශයෙන් අනුපිළිවෙලින් 9.1% ක්, 7.8% ක්, 7.3% ක් වේ. අක්කර 10,000 – 15,000 අතර බිම් ප්‍රමාණයක් මහනුවර (අක්කර 13,930), ගාල්ල (අක්කර 12,808), යාපනය (අක්කර 12,660), කෑගල්ල (අක්කර 11,060), පුත්තලම (අක්කර 10,991) යන දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇති අතර එය ප්‍රතිශත වශයෙන් අනුපිළිවෙලින් 5.8% ක්, 5.3% ක්, 5.3% ක්, 4.6% ක් හා 4.6% ක් වේ.

පසුගිය කෘෂිකර්ම සංගණනය (2002) සමඟ සසඳන විට ගම්පහ දිස්ත්‍රික්කයේ කුඩා ගොවි කාණ්ඩවල බිම් ප්‍රමාණය (අක්කර 6,695 කින්) වැඩි වශයෙන්ම වැඩි වී ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 22.2% ක් වේ. කුඩා ගොවි කාණ්ඩවල බිම් ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වී ඇති සෙසු දිස්ත්‍රික්ක ලෙස කොළඹ (අක්කර 6,34795 කින්), කුරුණෑගල(අක්කර 3,567 කින්) දැක්විය හැක. අනෙක් අතින් බලන විට කෑගල්ල දිස්ත්‍රික්කයෙන් කුඩා ගොවි කාණ්ඩවල බිම් ප්‍රමාණයේ (අක්කර 1,355 ක) පහත වැටීමක් වාර්තා වී ඇත.

වගු අංක 3.1.2 : ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ පරිභෝජනයට යොදා ගන්නා ගොවි කාණ්ඩ සංඛ්‍යාව හා ඒවායෙහි බිම් ප්‍රමාණය - 2014

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	ගොවි කාණ්ඩ			
	සංඛ්‍යාව	%	භූමි ප්‍රමාණය	
			අක්කර	%
කොළඹ	241,311	11.9	21,742	9.1
ගම්පහ	336,914	16.6	38,343	16.0
කළුතර	158,241	7.8	17,395	7.3
මහනුවර	116,586	5.7	13,930	5.8
මාතලේ	29,839	1.5	4,167	1.7
නුවරඑළිය	34,308	1.7	2,860	1.2
ගාල්ල	116,279	5.7	12,808	5.3
මාතර	80,407	4.0	9,280	3.9
හම්බන්තොට	48,578	2.4	7,901	3.3
යාපනය	90,423	4.4	12,660	5.3
මන්නාරම	11,357	0.6	1,097	0.5
වවුනියාව	13,097	0.6	2,007	0.8
මුලතිවු	6,320	0.3	1,212	0.5
කිලිනොච්චිය	5,542	0.3	1,190	0.5
මඩකලපුව	95,433	4.7	9,818	4.1
අම්පාර	88,032	4.3	8,525	3.6
ත්‍රිකුණාමලය	43,457	2.1	5,098	2.1
කුරුණෑගල	117,451	5.8	18,705	7.8
පුත්තලම	92,231	4.5	10,991	4.6
අනුරාධපුර	41,062	2.0	6,693	2.8
පොළොන්නරුව	26,947	1.3	4,265	1.8
බදුල්ල	60,192	3.0	6,221	2.6
මොණරාගල	16,147	0.8	2,295	1.0
රත්නපුර	77,563	3.8	9,414	3.9
කෑගල්ල	86,614	4.3	11,060	4.6
ශ්‍රී ලංකාව	**2,034,331**	**100.0**	**239,677**	**100.0**

සිතියම් අංක 2 : දිස්ත්‍රික්ක අනුව පර්චර්ස් 40ට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ කාණ්ඩයේ පරිභෝජනයට යොදාගන්නා කුඩා ගොවි කාණ්ඩවල ව්‍යාප්තිය



ගොවි කාණ්ඩ සංඛ්‍යාව හා ඒවායෙහි බිම් ප්‍රමාණයන් ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

3.1.3 දිස්ත්‍රික්ක අනුව ගෙවතු වගාවේ ව්‍යාප්තිය

මේ යටතේ 2014 වසරේ පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ පරිභෝජනයට යොදා ගන්නා කුඩා ගොවි කාණ්ඩවල ගෙවතු සංඛ්‍යාව හා එහි බිම් ප්‍රමාණය ගොවි කාරකයා පදිංචි පළාත/ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

ආර්ථික සංගණනය යටතේ, කුඩා ගොවි කාණ්ඩ හා වතු පිළිබඳ තොරතුරු රැස් කිරීමේදී ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව ඇති ගෙවතු පිළිබඳ තොරතුරු රැස් කරන ලදී. එම තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව ඇති ගෙවතු සංඛ්‍යාව 1,877,995 ක් වේ. පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සසඳන විට මෙවර වාර්තා වී ඇති ගෙවතු සංඛ්‍යාව 462,368 (32.7%) ක වැඩිවීමක් වාර්තා වී ඇත.

පළාත් මට්ටමින් සැලකිල්ලට ගතහොත් වැඩිම ගෙවතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බස්නාහිර (716,669) පළාතෙනි. එය ප්‍රතිශතයක් ලෙස දැක්වුවහොත් 38.2% ක් වේ. දෙවනුවට වැඩිම ගෙවතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ දකුණු (235,223) පළාතෙනි. එය ප්‍රතිශතයක් ලෙස දැක්වුවහොත් 12.5% ක් වේ. තෙවනුවට වැඩිම ගෙවතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ නැගෙනහිර (219,308)) පළාතෙනි. එය ප්‍රතිශතයක් ලෙස දැක්වුවහොත් 11.7% ක් වේ. අඩුම ගෙවතු සංඛ්‍යාව උතුරු මැද (61,369) පළාතෙන් වාර්තා වී ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 3.3% ක් වේ. එමෙන්ම ගෙවතු 100,000 - 200,000 අතර ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ වයඹ (164,491), මධ්‍යම (161,387), සබරගමුව (145,313) හා උතුරු (111,552) පළාත්වලිනි. ඌව පළාතෙන් ගෙවතු 62,683 ක් වාර්තා වී ඇත.

දිස්ත්‍රික් මට්ටමින් සැලකිල්ලට ගතහොත් වැඩිම ගෙවතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ (342,276) දිස්ත්‍රික්කයෙනි. එය ප්‍රතිශතයක් ලෙස දැක්වුවහොත් 17.9% ක් වේ. දිස්ත්‍රික් මට්ටමින් දෙවනුවට වැඩිම ගෙවතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කොළඹ (240,757) දිස්ත්‍රික්කයෙනි. එය ප්‍රතිශතයක් ලෙස දැක්වුවහොත් 12.6% ක් වේ. තෙවනුවට වැඩිම ගෙවතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කළුතර (165,523) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු ගෙවතු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට 8.7% ක් වේ. අඩුම ගෙවතු සංඛ්‍යාව මන්නාරම (4,976) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 0.3% ක් වේ.

එමෙන්ම ගෙවතු සංඛ්‍යාව 200,000 ඉක්මවා වාර්තා වී ඇත්තේ කොළඹ (240,969), ගම්පහ (332,849) දිස්ත්‍රික්කවලින් වන අතර 150,000 – 200,000 අතර ගෙවතු සංඛ්‍යාවක් වාර්තා වී ඇති එකම දිස්ත්‍රික්කය ලෙස කළුතර (151,851) දැක්විය හැක. මහනුවර (111,549) සහ ගාල්ල (113,296) දිස්ත්‍රික්කවල ගෙවතු 100,000 – 150,000 අතර සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර 50,000 –100,000 අතර ගෙවතු සංඛ්‍යාවක් වාර්තා වී ඇති දිස්ත්‍රික්ක ලෙස කුරුණෑගල (97,961), මඩකලපුව (94,268),අම්පාර (85,066), යාපනය (83,228), කෑගල්ල (77,246), මාතර (76,745), රත්නපුර (68,067), පුත්තලම (66,530), බදුල්ල (52,562) දැක්විය හැක. සෙසු දිස්ත්‍රික්කවලින් ගෙවතු 10,000 ටත් අඩු අගයක් ගන්නා දිස්ත්‍රික්ක ලෙස මන්නාරම (5,045), කිලිනොච්චිය (5,541), මුලතිව් (6,308) දිස්ත්‍රික්ක දැක්විය හැකිය.

වගු අංක 3.1.3 : ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව ගෙවතු වගාව - 2014

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	ගෙවතු වගාව		
	සංඛ්‍යාව	අක්කර	%
කොළඹ	240,969	20,445	11.1
ගම්පහ	323,849	35,351	19.2
කළුතර	151,851	15,520	8.4
මහනුවර	111,549	12,232	6.6
මාතලේ	24,212	2,195	1.2
නුවරඑළිය	25,626	1,039	0.6
ගාල්ල	113,296	11,909	6.5
මාතර	76,745	8,361	4.5
හම්බන්තොට	45,182	5,255	2.9
යාපනය	83,228	6,604	3.6
මන්නාරම	5,045	188	0.1
වවුනියාව	11,430	607	0.3
මුලතිවු	6,308	745	0.4
කිලිනොච්චිය	5,541	464	0.3
මඩකලපුව	94,268	9,671	5.2
අම්පාර	85,066	7,846	4.3
ත්‍රිකුණාමලය	39,974	3,517	1.9
කුරුණෑගල	97,961	11,314	6.1
පුත්තලම	66,530	4,678	2.5
අනුරාධපුර	37,142	4,775	2.6
පොළොන්නරුව	24,227	2,469	1.3
බදුල්ල	52,562	3,844	2.1
මොණරාගල	10,121	668	0.4
රත්නපුර	68,067	6,760	3.7
කෑගල්ල	77,246	7,901	4.3
ශ්‍රී ලංකාව	**1,877,995**	**184,358**	**100.0**

සිතියම් අංක 3 : දිස්ත්‍රික්ක අනුව ගෙවතු සංඛ්‍යාව සහ ගෙවතු යටතේ පවතින බිම් ප්‍රමාණයේ ව්‍යාප්තිය



ගෙවතු සංඛ්‍යාව ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

3.1.4 දිස්ත්‍රික්ක අනුව ස්ථිර භෝග වගාවේ ව්‍යාප්තිය

මේ යටතේ 2014 වසරේ පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ පරිභෝජනයට යොදා ගන්නා කුඩා ගොවි කාණ්ඩවල ස්ථිර භෝග වගාවන්හි ගස්/ වැල්/ පඳුරු සංඛ්‍යාව ගොවි කාරකයා පදිංචි පළාත/ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයේ වැඩි ප්‍රමාණයක් ගෘහ පරිභෝජනය සඳහා යොදා ගන්නා ගොවි කාණ්ඩවලින් වාර්තා වී ඇති මුළු පොල් ගස් සංඛ්‍යාව 5,377,927 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම පොල් ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ (793,374) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම පොල් ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ නුවරඑළිය (18,978) දිස්ත්‍රික්කයෙනි.

එමෙන්ම මෙම කාණ්ඩය යටතේ වාර්තා වී ඇති මුළු තැඹිලි ගස් සංඛ්‍යාව 941,165 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම තැඹිලි ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ (187,215) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම තැඹිලි ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කිලිනොච්චි (937) දිස්ත්‍රික්කයෙනි.

ස්ථිර භෝග වගාව යටතේ, පර්චස් 40ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයේ වැඩි ප්‍රමාණයක් ගෘහ පරිභෝජනය සඳහා යොදා ගන්නා ගොවි කාණ්ඩවලින් වාර්තා වී ඇති මුළු ගම්මිරිස් වැල් සංඛ්‍යාව 1,120,769 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම ගම්මිරිස් වැල් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මහනුවර (193,913) දිස්ත්‍රික්කයෙනි. අඩුම ගම්මිරිස් වැල් සංඛ්‍යාව වවුනියාව (09) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. මන්නාරම හා කිලිනොච්චි දිස්ත්‍රික්කවලින් ගම්මිරිස් වැල් වාර්තා වී නොමැත.

එමෙන්ම මෙම කාණ්ඩය යටතේ වාර්තා වී ඇති මුළු කෝපි පඳුරු සංඛ්‍යාව 588,158 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම කෝපි පඳුරු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මහනුවර (130,040) දිස්ත්‍රික්කයෙනි. අඩුම කෝපි පඳුරු සංඛ්‍යාව මඩකලපුව (17) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. මන්නාරම දිස්ත්‍රික්කයෙන් කෝපි පඳුරු කිසිවක් වාර්තා වී නොමැත.

පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයේ වැඩි ප්‍රමාණයක් ගෘහ පරිභෝජනය සඳහා යොදා ගන්නා ගොවි කාණ්ඩවලින් වාර්තා වී ඇති මුළු ගස්ලබු ගස් සංඛ්‍යාව 1,104,939 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම ගස්ලබු ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ (204,362) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම ගස්ලබු ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කිලිනොච්චි (2,315) දිස්ත්‍රික්කයෙනි.

ස්ථිර භෝග වගාව යටතේ, පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයේ වැඩි ප්‍රමාණයක් ගෘහ පරිභෝජනය සඳහා යොදා ගන්නා ගොවි කාණ්ඩවලින් වාර්තා වී ඇති මුළු රඹුටන් ගස් සංඛ්‍යාව 513,427 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම රඹුටන් ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ (164,910) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම රඹුටන් ගස් සංඛ්‍යාව මුලතිව් (06) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් රඹුටන් ගස් වාර්තා වී නොමැත.

මෙම කාණ්ඩය යටතේ අලිගැටපේර ගස් 463,940 ක් වාර්තා වී ඇත. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම අලිගැටපේර ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ

මහනුවර (62,532) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම අලිගැටපේර ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කිලිනොච්චි (1,092) දිස්ත්‍රික්කයෙනි.

එමෙන්ම මෙම කාණ්ඩය යටතේ වාර්තා වී ඇති මුළු දූරියන් ගස් සංඛ්‍යාව 58,579 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව වැඩිම දූරියන් ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මහනුවර (12,875) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම දූරියන් ගස් සංඛ්‍යාව ලෙස ගස් 02 බැගින් මුලතිව් සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

මෙම කාණ්ඩය යටතේ කරාබු ගස් 162,047 ක් වාර්තා වී ඇත. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම කරාබු ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මහනුවර (44,556) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම කරාබු ගස් සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ මන්නාරම, කිලිනොච්චි, මඩකලපුව යන දිස්ත්‍රික්කවලින් වන අතර එය ගස් 08 බැගිනි.

පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයේ වැඩි ප්‍රමාණයක් ගෘහ පරිභෝජනය සඳහා යොදා ගන්නා ගොවි කාණ්ඩවලින් වාර්තා වී ඇති මුළු පුවක් ගස් සංඛ්‍යාව 1,602,149 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම පුවක් ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ (217,995) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම පුවක් ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මන්නාරම (1,249) දිස්ත්‍රික්කයෙනි.

ස්ථිර භෝග වගාව යටතේ වාර්තා වී ඇති මුළු අඹ ගස් සංඛ්‍යාව 2,024,598 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම අඹ ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ (327,282) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම අඹ ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මුලතිව් (5,824) දිස්ත්‍රික්කයෙනි.

එමෙන්ම මෙම කාණ්ඩය යටතේ වාර්තා වී ඇති මුළු කෙසෙල් පඳුරු සංඛ්‍යාව 5,360,149 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම කෙසෙල් පඳුරු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ (875,514) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම කෙසෙල් පඳුරු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කිලිනොච්චි (28,212) දිස්ත්‍රික්කයෙනි.

මෙම කාණ්ඩය යටතේ දොඩම් ගස් 537,883 ක් ද දෙහි ගස් 665,339 ක් ද වාර්තා වී ඇත. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම දොඩම් ගස් සංඛ්‍යාව වන 48,153 හා වැඩිම දෙහි ගස් සංඛ්‍යාව වන 82,437 වාර්තා වී ඇත්තේ ගම්පහ දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම දොඩම් ගස් සංඛ්‍යාව මන්නාරම (2,186) දිස්ත්‍රික්කයෙන් ද අඩුම දෙහි ගස් සංඛ්‍යාව කිලිනොච්චි (3,166) දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වී ඇත.

එමෙන්ම මෙම කාණ්ඩය යටතේ වාර්තා වී ඇති මුළු මැංගුස් ගස් සංඛ්‍යාව 41,774 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම මැංගුස් ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කෑගල්ල (6,881) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම මැංගුස් ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මන්නාරම (24) දිස්ත්‍රික්කයෙනි.

මෙම කාණ්ඩය යටතේ වාර්තා වී ඇති මුළු කජු ගස් සංඛ්‍යාව 171,628 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම කජු ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල (30,598) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම කජු ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මන්නාරම (265) දිස්ත්‍රික්කයෙනි.

පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයේ වැඩි ප්‍රමාණයක් ගෘහ පරිභෝජනය සඳහා යොදා ගන්නා ගොවි කාණ්ඩවලින් වාර්තා වී ඇති මුළු කොස් ගස් සංඛ්‍යාව 1,153,132 ක් වේ. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම කොස් ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ (161,861) දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම අඩුම කොස් ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මන්නාරම (1,654) දිස්ත්‍රික්කයෙනි.

මෙම කාණ්ඩය යටතේ කිතුල් ගස් 66,039 ක් ද තල් ගස් 130,628 ක් ද වාර්තා වී ඇත. ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම කිතුල් ගස් සංඛ්‍යාවක් මහනුවර (13,323) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර වැඩිම තල් ගස් සංඛ්‍යාවක් යාපනය (42,941) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. අඩුම කිතුල් ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මන්නාරම (03) දිස්ත්‍රික්කයෙන් වන අතර අඩුම තල් ගස් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගාල්ල (34) දිස්ත්‍රික්කයෙනි.

වගු අංක 3.1.4 : ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව ස්ථිර භෝග වගාව - 2014

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	ගස්/වැල්/පඳුරු ගණන							
	පොල්		කෙසෙල්		ගම්මිරිස්		කෝපි	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	351,452	6.5	144,853	15.4	61,490	5.5	19,205	3.3
ගම්පහ	793,374	14.8	187,215	19.9	131,396	11.7	71,605	12.2
කළුතර	390,363	7.3	104,255	11.1	58,822	5.2	33,160	5.6
මහනුවර	180,983	3.4	33,262	3.5	193,913	17.3	130,040	22.1
මාතලේ	72,025	1.3	10,769	1.1	84,153	7.5	22,087	3.8
නුවරඑළිය	18,978	0.4	1,783	0.2	35,078	3.1	48,273	8.2
ගාල්ල	329,444	6.1	67,642	7.2	48,199	4.3	16,163	2.7
මාතර	216,468	4.0	52,574	5.6	64,540	5.8	25,736	4.4
හම්බන්තොට	195,921	3.6	27,954	3.0	42,063	3.8	8,065	1.4
යාපනය	361,739	6.7	35,208	3.7	146	0.0	103	0.0
මන්නාරම	67,614	1.3	5,137	0.5	0	0.0	0	0.0
වවුනියාව	51,310	1.0	7,086	0.8	9	0.0	25	0.0
මුලතිවු	37,747	0.7	1,095	0.1	982	0.1	509	0.1
කිලිනොච්චිය	29,344	0.5	937	0.1	0	0.0	18	0.0
මඩකලපුව	332,449	6.2	18,494	2.0	31	0.0	17	0.0
අම්පාර	251,834	4.7	26,970	2.9	4,961	0.4	1,842	0.3
ත්‍රිකුණාමලය	147,154	2.7	12,238	1.3	116	0.0	42	0.0
කුරුණෑගල	470,471	8.7	52,107	5.5	99,163	8.8	58,505	9.9
පුත්තලම	323,133	6.0	32,650	3.5	6,484	0.6	9,037	1.5
අනුරාධපුර	149,613	2.8	21,872	2.3	5,232	0.5	2,511	0.4
පොළොන්නරුව	107,849	2.0	12,125	1.3	8,609	0.8	1,656	0.3
බදුල්ල	42,614	0.8	6,156	0.7	49,524	4.4	50,249	8.5
මොණරාගල	44,692	0.8	7,220	0.8	31,976	2.9	4,480	0.8
රත්නපුර	194,219	3.6	31,889	3.4	95,742	8.5	24,090	4.1
කෑගල්ල	217,137	4.0	39,674	4.2	98,140	8.8	60,740	10.3
ශ්‍රී ලංකාව	**5,377,927**	**100.0**	**941,165**	**100.0**	**1,120,769**	**100.0**	**588,158**	**100.0**

වගු අංක **3.1.4 :** ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව ස්ථිර භෝග වගාව - **2014** (සම්බන්ධයි)

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	ගස්/වැල්/පඳුරු ගණන							
	ගස්ලබු		රඹුටන්		අලිගැටපේර		දූරියන්	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	114,164	10.3	77,041	15.0	29,529	6.4	4,040	6.9
ගම්පහ	204,362	18.5	164,910	32.1	55,064	11.9	12,014	20.5
කළුතර	102,273	9.3	57,076	11.1	29,813	6.4	2,617	4.5
මහනුවර	53,581	4.8	30,285	0.6	62,532	13.5	12,875	22.0
මාතලේ	16,764	1.5	6,341	1.2	12,652	2.7	1,252	2.1
නුවරඑළිය	11,186	1.0	3,033	0.6	26,940	5.8	2,190	3.7
ගාල්ල	91,632	8.3	36,815	7.2	30,264	6.5	2,136	3.6
මාතර	58,670	5.3	25,611	5.0	26,348	5.7	2,040	3.5
හම්බන්තොට	22,911	2.1	5,623	1.1	9,922	2.1	561	1.0
යාපනය	37,975	3.4	478	0.1	7,738	1.7	11	0.0
මන්නාරම	6,165	0.6	18	0.0	2,250	0.5	15	0.0
වවුනියාව	7,979	0.7	31	0.0	2,704	0.6	28	0.0
මුලතිවු	2,359	0.2	6	0.0	1,605	0.3	2	0.0
කිලිනොච්චිය	2,315	0.2	0	0.0	1,092	0.2	2	0.0
මඩකලපුව	29,374	2.7	179	0.0	3,035	0.7	32	0.1
අම්පාර	38,374	3.5	1,030	0.2	7,333	1.6	273	0.5
ත්‍රිකුණාමලය	16,982	1.5	144	0.0	5,163	1.1	88	0.2
කුරුණෑගල	87,544	7.9	31,707	6.2	26,566	5.7	1,643	2.8
පුත්තලම	53,440	4.8	9,004	1.8	9,180	2.0	337	0.6
අනුරාධපුර	20,942	1.9	938	0.2	8,412	1.8	215	0.4
පොළොන්නරුව	15,832	1.4	1,059	0.2	5,234	1.1	239	0.4
බදුල්ල	23,103	2.1	4,430	0.9	55,076	11.9	471	0.8
මොණරාගල	7,392	0.7	2,682	0.5	2,390	0.5	197	0.3
රත්නපුර	39,716	3.6	35,650	6.9	19,508	4.2	6,396	10.9
කෑගල්ල	39,904	3.6	46,593	9.1	23,590	5.1	8,905	15.2
ශ්‍රී ලංකාව	**1,104,939**	**100.0**	**540,684**	**100.0**	**463,940**	**100.0**	**58,579**	**100.0**

වගු අංක 3.1.4 : ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව ස්ථිර භෝග වගාව - 2014 (සම්බන්ධයි)

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	ගස්/වැල්/පඳුරු ගණන							
	කරාබු		පුවක්		අඹ		කෙසෙල්	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	7,046	4.3	84,788	5.3	195,571	9.7	463,655	8.7
ගම්පහ	19,381	12.0	217,995	13.6	327,282	16.2	875,514	16.3
කළුතර	8,879	5.5	112,065	7.0	145,153	7.2	448,513	8.4
මහනුවර	44,556	27.5	145,027	9.1	107,771	5.3	247,872	4.6
මාතලේ	6,645	4.1	43,255	2.7	36,925	1.8	85,307	1.6
නුවරඑළිය	6,411	4.0	33,455	2.1	21,898	1.1	100,305	1.9
ගාල්ල	6,660	4.1	72,669	4.5	116,447	5.8	358,356	6.7
මාතර	6,658	4.1	83,593	5.2	92,102	4.5	276,665	5.2
හම්බන්තොට	1,500	0.9	24,771	1.5	74,284	3.7	107,459	2.0
යාපනය	148	0.1	144,508	9.0	73,218	3.6	206,228	3.8
මන්නාරම	8	0.0	1,249	0.1	9,149	0.5	40,094	0.7
වවුනියාව	40	0.0	15,638	1.0	13,795	0.7	45,678	0.9
මුලතිවු	85	0.1	2,926	0.2	5,824	0.3	33,499	0.6
කිලිනොච්චිය	8	0.0	3,852	0.2	6,124	0.3	28,212	0.5
මඩකලපුව	8	0.0	10,891	0.7	104,872	5.2	253,682	4.7
අම්පාර	91	0.1	30,528	1.9	97,332	4.8	250,179	4.7
ත්‍රිකුණාමලය	34	0.0	6,661	0.4	50,965	2.5	126,388	2.4
කුරුණෑගල	6,227	3.8	108,593	6.8	145,173	7.2	375,307	7.0
පුත්තලම	343	0.2	12,602	0.8	85,881	4.2	180,071	3.4
අනුරාධපුර	142	0.1	19,272	1.2	68,187	3.4	132,284	2.5
පොළොන්නරුව	165	0.1	14,616	0.9	47,641	2.4	84,663	1.6
බදුල්ල	2,898	1.8	63,257	3.9	48,239	2.4	112,061	2.1
මොණරාගල	290	0.2	11,386	0.7	21,948	1.1	35,451	0.7
රත්නපුර	7,995	4.9	166,452	10.4	59,583	2.9	215,081	4.0
කෑගල්ල	35,829	22.1	172,100	10.7	69,234	3.4	277,625	5.2
ශ්‍රී ලංකාව	**162,047**	**100.0**	**1,602,149**	**100.0**	**2,024,598**	**100.0**	**5,360,149**	**100.0**

වගු අංක 3.1.4 : ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව ස්ථිර භෝග වගාව - 2014 (සම්බන්ධයි)

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	ගස්/වැල්/පඳුරු ගණන							
	දොඩම්		දෙහි		මැංගුස්		අඹ	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	27,454	5.1	47,785	7.2	3,173	7.6	4,066	2.4
ගම්පහ	48,153	9.0	82,427	12.4	5,807	13.9	21,056	12.3
කළුතර	17,743	3.3	32,677	4.9	4,438	10.6	4,672	2.7
මහනුවර	24,842	4.6	30,314	4.6	6,179	14.8	5,705	3.3
මාතලේ	12,522	2.3	15,645	2.4	803	1.9	5,929	3.5
නුවරඑළිය	13,577	2.5	7,711	1.2	1,290	3.1	891	0.5
ගාල්ල	28,920	5.4	37,716	5.7	2,590	6.2	4,630	2.7
මාතර	28,964	5.4	36,089	5.4	1,596	3.8	5,811	3.4
හම්බන්තොට	34,825	6.5	45,658	6.9	558	1.3	13,901	8.1
යාපනය	11,487	2.1	31,359	4.7	76	0.2	472	0.3
මන්නාරම	2,186	0.4	3,296	0.5	24	0.1	265	0.2
වවුනියාව	5,772	1.1	7,996	1.2	33	0.1	682	0.4
මුලතිවු	2,542	0.5	4,319	0.6	32	0.1	779	0.5
කිලිනොච්චිය	2,823	0.5	3,166	0.5	45	0.1	381	0.2
මඩකලපුව	26,828	5.0	16,187	2.4	32	0.1	13,581	7.9
අම්පාර	39,271	7.3	25,409	3.8	280	0.7	5,218	3.0
ත්‍රිකුණාමලය	20,897	3.9	16,225	2.4	84	0.2	3,463	2.0
කුරුණෑගල	38,378	7.1	60,289	9.1	1,868	4.5	30,598	17.8
පුත්තලම	27,289	5.1	27,195	4.1	757	1.8	15,078	8.8
අනුරාධපුර	28,987	5.4	33,344	5.0	307	0.7	15,397	9.0
පොළොන්නරුව	21,627	4.0	19,341	2.9	232	0.6	5,254	3.1
බදුල්ල	33,167	6.2	22,091	3.3	429	1.0	2,276	1.3
මොණරාගල	11,128	2.1	11,001	1.7	126	0.3	2,083	1.2
රත්නපුර	14,802	2.8	26,070	3.9	4,104	9.8	3,951	2.3
කෑගල්ල	13,699	2.5	22,029	3.3	6,881	16.5	5,489	3.2
ශ්‍රී ලංකාව	**537,883**	**100.0**	**665,339**	**100.0**	**41,744**	**100.0**	**171,628**	**100.0**

වගු අංක 3.1.4 : ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව ස්ථිර භෝග වගාව - 2014 (සම්බන්ධයි)

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	ගස්/වැල්/පඳුරු ගණන					
	පොල්		කිතුල්		තල්	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	83,269	7.2	2,820	4.3	638	0.5
ගම්පහ	161,861	14.0	4,245	6.4	489	0.4
කළුතර	98,675	8.6	3,294	5.0	107	0.1
මහනුවර	119,486	10.4	13,323	20.2	530	0.4
මාතලේ	30,166	2.6	3,236	4.9	158	0.1
නුවරඑළිය	28,302	2.5	4,544	6.9	294	0.2
ගාල්ල	73,026	6.3	4,872	7.4	341	0.0
මාතර	64,274	5.6	5,207	7.9	79	0.1
හම්බන්තොට	36,894	3.2	2,063	3.1	229	0.2
යාපනය	28,397	2.5	292	0.4	42,941	32.9
මන්නාරම	1,654	0.1	3	0.0	10,957	8.4
වවුනියාව	8,865	0.8	38	0.1	2,788	2.1
මුලතිවු	2,223	0.2	28	0.0	9,668	7.4
කිලිනොච්චිය	2,140	0.2	13	0.0	6,194	4.7
මඩකලපුව	18,397	1.6	16	0.0	25,800	19.8
අම්පාර	27,000	2.3	707	1.1	8,749	6.7
ත්‍රිකුණාමලය	21,335	1.9	83	0.1	15,377	11.8
කුරුණෑගල	71,579	6.2	3,164	4.8	362	0.7
පුත්තලම	21,653	1.9	626	0.9	3,207	2.5
අනුරාධපුර	36,001	3.1	853	1.3	595	0.5
පොළොන්නරුව	26,263	2.3	1,106	1.7	569	0.4
බදුල්ල	63,685	5.5	7,527	11.4	65	0.0
මොණරාගල	11,278	1.0	696	1.1	133	0.1
රත්නපුර	49,193	4.3	4,156	6.3	82	0.1
කෑගල්ල	67,516	5.9	3,127	4.7	83	0.1
ශ්‍රී ලංකාව	**1,153,132**	**100.0**	**66,039**	**100.0**	**130,435**	**100.0**

3.1.5 දිස්ත්‍රික්ක අනුව සත්ව පාලනයේ ව්‍යාප්තිය (ගව පාලනය)

මේ යටතේ 2014 වසරේ පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ පරිභෝජනයට යොදා ගන්නා කුඩා ගොවි කාණ්ඩවල එළ ගව/ මී ගව සංඛ්‍යාව ගොවි කාරකයා පදිංචි පළාත/ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම අංශය සැලකීමේදී භෝග වගාව මෙන්ම සත්ව පාලන කටයුතුද ඉතා වැදගත් අංගයක් ලෙස සැලකේ. මෙවර ආර්ථික සංගණනය යටතේ, කෘෂිකාර්මික තොරතුරු රැස් කිරීමේ අදියරේදී සත්ව පාලනය පිළිබඳ තොරතුරු ද රැස් කරන ලදී. එම තොරතුරු වලට අනුව ගව පාලනය යටතේ මෙම කාණ්ඩයෙන් ශ්‍රී ලංකාවේ වාර්තා වී ඇති මුළු ගවයින් සංඛ්‍යාව 85,761 ක් වේ. මෙයින් 77,588 ක් එළ ගවයින් වන අතර 8,173 ක් මී ගවයින් වේ.

එළ ගවයින් අතරින් 65,857 ක් ගැහැණු සතුන් වන අතර එය එළ ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 84.9% ක් වේ. එළ ගවයින්ගෙන් 11,731 ක් පිරිමි සතුන් වන අතර එය එළගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 15.1% ක් වේ. ගැහැණු සතුන්ගෙන් 29,655 ක් දැනට කිරි ගනිමින් සිටින කිරි දෙනුන් වේ. එය මුළු එළගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 38.2% ක් වේ.

මී ගවයින් අතරින් 6,008 ක් ගැහැණු සතුන් වන අතර එය මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 73.5% ක් වේ. මී ගවයින්ගෙන් 2,165 ක් පිරිමි සතුන් වන අතර එය මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 26.5% ක් වේ. ගැහැණු සතුන්ගෙන් 3,143 ක් දැනට කිරි ගනිමින් සිටින කිරි දෙනුන් වේ. එය මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 38.5% ක් වේ.

ගොවි කාරකයින් පදිංචි පළාත් අනුව සැලකීමේදී වැඩිම ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ උතුරු (21,308) පළාතෙනි. එය මුළු ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 24.8% ක් වේ. දෙවනුවට වැඩිම ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ නැගෙනහිර (20,857) පළාතෙන් වන අතර එය මුළු ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 24.3% ක් වේ. තෙවනුවට වැඩිම ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බස්නාහිර (11,385) පළාතෙන් වන අතර එය මුළු ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 13.3% ක් වේ. අඩුම ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ උතුරුමැද (3,414) පළාතෙනි. එය මුළු ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 4.0% ක් වේ. ගවයින් 5,000 - 10,000 අතර සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ වයඹ (8,890), මධ්‍යම (5,906) හා දකුණු (5,711) යන පළාත්වලිනි. ගවයින් 5,000ට අඩු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ උතුරුමැද (3,414), ඌව (3,939) හා සබරගමුව (4,351) යන පළාත් තුනෙනි.

ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකීමේදී වැඩිම ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ යාපනය (12,596) දිස්ත්‍රික්කයෙනි. එය මුළු ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 14.7% ක් වේ. දෙවනුවට වැඩිම ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මඩකලපුව (9,864) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 11.5% ක් වේ. තෙවනුවට වැඩිම ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ අම්පාර (6,148) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 7.2% ක් වේ. සෙසු දිස්ත්‍රික්කවලින් ගවයින් සංඛ්‍යාව 5000 ඉක්මවා වාර්තා වී ඇත්තේ කුරුණෑගල (5,933) හා ගම්පහ (5,525) දිස්ත්‍රික්කවලින් පමණි.

ගවයින් සංඛ්‍යාව 3,000 - 5000 අතර සංඛ්‍යාවක් වාර්තා වී ඇති දිස්ත්‍රික්ක ලෙස ත්‍රිකුණාමලය (4,845), මන්නාරම (4,606), කළුතර (3175) යන දිස්ත්‍රික්ක දැක්විය හැකිය. ගවයින් සංඛ්‍යාව 2,500 – 3,000 අතර සංඛ්‍යාවක් පුත්තලම (2957), කොළඹ (2,685) යන දිස්ත්‍රික්ක දෙකෙන් වාර්තා වී ඇති අතර

මහනුවර (2,482), නුවරඑළිය (2,379), කෑගල්ල (2,363), ගාල්ල (2,271), බදුල්ල (2,270) යන දිස්ත්‍රික්කවලින් ගවයින් සංඛ්‍යාව 2,000 - 2,500 අතර සංඛ්‍යාවක් වාර්තා වී ඇත. රත්නපුරය (1,988), වවුනියාව (1,883), අනුරාධපුරය (1,947), මාතර (1,721), හම්බන්තොට (1,719), මොණරාගල (1,669) යන දිස්ත්‍රික්කවලින් 1,500 - 2,000 අතර සංඛ්‍යාවක් වාර්තා වී ඇත. අඩුම ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මුලතිව් (942) දිස්ත්‍රික්කයෙනි. එය මුළු ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 1.1% ක් වේ. මුලතිව් හැරුණු විට සියලුම දිස්ත්‍රික්කවලින් ගවයින් සංඛ්‍යාව 1000 ඉක්මවා වාර්තා වී ඇත.

වගු අංක 3.1.5 : ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සත්ව පාලනය (ගව පාලනය) - 2014

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	එළ ගවයින්						මී ගවයින්					
	ගැහැණු සතුන්				පිරිමි සතුන්		ගැහැණු සතුන්				පිරිමි සතුන්	
	දැනට කිරි ගනිමින් සිටින කිරි දෙනුන්		වෙනත්				දැනට කිරි ගනිමින් සිටින කිරි දෙනුන්		වෙනත්			
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	764	2.6	990	2.7	463	3.9	167	5.3	197	6.9	104	4.8
ගම්පහ	1,498	5.1	2,451	6.8	1,139	9.7	188	6.0	60	2.1	189	8.7
කළුතර	833	2.8	1,227	3.4	648	5.5	189	6.0	157	5.5	121	5.6
මහනුවර	775	2.6	1,026	2.8	387	3.3	17	0.5	44	1.5	233	10.8
මාතලේ	317	1.1	417	1.2	181	1.5	37	1.2	41	1.4	52	2.4
නුවරඑළිය	720	2.4	1,139	3.1	307	2.6	19	0.6	165	5.8	29	1.3
ගාල්ල	644	2.2	952	2.6	396	3.4	115	3.7	97	3.4	67	3.1
මාතර	422	1.4	741	2.0	313	2.7	91	2.9	88	3.1	66	3.0
හම්බන්තොට	353	1.2	435	1.2	215	1.8	319	10.1	278	9.7	119	5.5
යාපනය	5,479	18.5	5,897	16.3	1,041	8.9	66	2.1	44	1.5	69	3.2
මන්නාරම	1,840	6.2	2,300	6.4	332	2.8	35	1.1	73	2.5	26	1.2
වවුනියාව	1,034	3.5	652	1.8	70	0.6	55	1.7	27	0.9	45	2.1
මුලතිවු	304	1.0	507	1.4	17	0.1	30	1.0	71	2.5	13	0.6
කිලිනොච්චිය	447	1.5	702	1.9	91	0.8	11	0.3	16	0.6	14	0.6
මඩකලපුව	4,259	14.4	4,063	11.2	735	6.3	308	9.8	371	12.9	128	5.9
අම්පාර	2,201	7.4	2,509	6.9	607	5.2	437	13.9	256	8.9	138	6.4
ත්‍රිකුණාමලය	1,491	5.0	1,783	4.9	729	6.2	417	13.3	231	8.1	194	9.0
කුරුණෑගල	1,709	5.8	2,825	7.8	1,090	9.3	65	2.1	128	4.5	116	5.4
පුත්තලම	698	2.4	1,476	4.1	652	5.6	34	1.1	37	1.3	60	2.8
අනුරාධපුර	626	2.1	759	2.1	296	2.5	107	3.4	109	3.8	50	2.3
පොළොන්නරුව	403	1.4	444	1.2	238	2.0	209	6.6	84	2.9	89	4.1
බදුල්ල	807	2.7	949	2.6	444	3.8	11	0.3	23	0.8	36	1.7
මොණරාගල	575	1.9	402	1.1	515	4.4	97	3.1	53	1.8	27	1.2
රත්නපුර	570	1.9	738	2.0	380	3.2	91	2.9	113	3.9	96	4.4
කෑගල්ල	886	3.0	818	2.3	445	3.8	28	0.9	102	3.6	84	3.9
ශ්‍රී ලංකාව	**29,655**	**100.0**	**36,202**	**100.0**	**11,731**	**100.0**	**3,143**	**100.0**	**2,865**	**100.0**	**2,165**	**100.0**

සිතියම් අංක 4 : දිස්ත්‍රික්ක අනුව පර්චර්ස් 40ට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ කාණ්ඩයේ පරිභෝජනයට යොදාගන්නා කුඩා ගොවි කාණ්ඩ යටතේ ඇති එළ ගවයින්ගේ ව්‍යාප්තිය



එළ ගවයින් සංඛ්‍යාව ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

සිතියම් අංක 5 : දිස්ත්‍රික්ක අනුව පර්චර්ස් 40ට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ කාණ්ඩයේ පරිභෝජනයට යොදාගන්නා කුඩා ගොවි කාණ්ඩ වල ඇති මී ගවයින්ගේ ව්‍යාප්තිය



මී ගවයින් සංඛ්‍යාව ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්කය අනුව සඳහන්ව ඇත.

3.1.6 දිස්ත්‍රික්ක අනුව එළුවන්, බැටළුවන් හා ඌරන්ගේ ව්‍යාප්තිය

මේ යටතේ 2014 වසරේ පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ පරිභෝජනයට යොදා ගන්නා කුඩා ගොවි කාණ්ඩවල එළුවන්, බැටළුවන් හා ඌරන් සංඛ්‍යාව ගොවි කාරකයා පදිංචි පළාත/ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පවත්වන ලද ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමේ අදියරේදී සත්ව පාලනය යටතේ එළුවන්, බැටළුවන් හා ඌරන්ගේ ව්‍යාප්තිය පිළිබඳව ද තොරතුරු රැස් කරන ලදී. එහිදී ශ්‍රී ලංකාවෙන් වාර්තා වී ඇති එළුවන් සංඛ්‍යාව 73,643 ක් වේ. එමෙන්ම වාර්තා වී ඇති බැටළුවන් සංඛ්‍යාව 615 ක් ද ඌරන් සංඛ්‍යාව 6,209 ක් ද වේ.

ගොවි කාරකයින් පදිංචි පළාත් අනුව සැලකීමේදී වැඩිම එළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ උතුරු (28,528) පළාතෙනි. එය මුළු එළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 38.7% ක් වේ. දෙවනුවට වැඩිම එළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ නැගෙනහිර (12,488) පළාතෙන් වන අතර එය මුළු එළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 17.0% ක් වේ. තෙවනුවට වැඩිම එළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ සබරගමුව (6,797) පළාතෙන් වන අතර එය මුළු එළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 9.2% ක් වේ. අඩුම එළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ උතුරුමැද (1,064) පළාතෙනි. එය මුළු එළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 1.4% ක් වේ. එළුවන් 5000 – 7500 අතර සංඛ්‍යාවක් සබරගමුව (6,783) බස්නාහිර (6,485), මධ්‍යම (5,856), වයඹ (5,472) යන පළාත් වලින්ද එළුවන් 2,500 – 5,000 අතර සංඛ්‍යාවක් දකුණු (3,854) හා ඌව (3,099) යන පළාත් වලින් ද වාර්තා වී ඇත. උතුරුමැද (1,064) පළාතේ පමණක් වාර්තා වී ඇති එළුවන් සංඛ්‍යාව 2,500 ටත් අඩුය.

ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකීමේදී වැඩිම එළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ යාපනය (24,274) දිස්ත්‍රික්කයෙනි. එය මුළු එළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 33.0% ක් වේ. දෙවනුවට වැඩිම එළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මඩකලපුව (5,254) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු එළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 7.1% ක් වේ. තෙවනුවට වැඩිම එළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ රත්නපුරය (3,683) දිස්ත්‍රික්කයෙනි. එය මුළු එළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 5.0% ක් වේ. අඩුම එළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ හම්බන්තොට (225) දිස්ත්‍රික්කයෙනි. එය මුළු එළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.3% ක් වේ.

එළුවන් 3,500 – 4,500 අතර සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ රත්නපුර (3683), අම්පාර (3,663), හා ත්‍රිකුණාමලය (3,571) යන දිස්ත්‍රික්කවලිනි. එමෙන්ම එළුවන් 2,500 – 3,500 අතර සංඛ්‍යාවක් කෑගල්ල (3,114), මහනුවර (2,990), පුත්තලම (2,830), කුරුණෑගල (2,642), බදුල්ල (2,559) යන දිස්ත්‍රික්ක වලින් ද එළුවන් 1,500 – 2,500 අතර සංඛ්‍යාවක් ගම්පහ (2,110), මන්නාරම (1,999), නුවරඑළිය (1,885) දිස්ත්‍රික්කවලින් ද වාර්තා වී ඇත. කොළඹ (989), මාතලේ (981), කිලිනොච්චි (719), අනුරාධපුර (552), මොණරාගල (540), පොළොන්නරුව (512) යන දිස්ත්‍රික්කවලින් එළුවන් 500 – 1,500 අතර සංඛ්‍යාවක් වාර්තා වී ඇත. අනෙකුත් දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇත්තේ එළුවන් 500 ටත් අඩු සංඛ්‍යාවකි.

ගොවි කාරකයින් පදිංචි පළාත් අනුව සැලකීමේදී වැඩිම බැටළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ උතුරු (304) පළාතෙනි. එය මුළු බැටළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 49.4% ක් වේ. දෙවනුවට වැඩිම බැටළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ සබරගමුව (84) පළාතෙන් වන අතර එය මුළු බැටළුවන්ගේ ප්‍රතිශතයක් ලෙස 13.7% ක් වේ. තෙවනුවට වැඩිම බැටළුවන් සංඛ්‍යාවක් වාර්තා වී

ඇත්තේ නැගෙනහිර (63) පළාතෙන් වන අතර එය මුළු බැටළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 10.2% ක් වේ. ඊළඟට බැටළුවන් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ පිළිවෙලින් බස්නාහිර (54) හා වයඹ (47) පළාත් වලිනි. අනෙකුත් පළාත් වල උතුරු මැද පළාතෙන් 26 ක් ද , දකුණු පළාතෙන් 15 ක් ද , මධ්‍යම පළාතෙන් 16 ක් ද, ඌව පළාතෙන් 6 ක් ද ලෙස බැටළුවන් වාර්තා වී ඇත.

ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකීමේදී වැඩිම බැටළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ යාපනය (261) දිස්ත්‍රික්කයෙනි. එය මුළු බැටළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 42.4% ක් වේ. දෙවනුවට වැඩිම බැටළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ රත්නපුර (58) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු බැටළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 9.4% ක් වේ. තෙවනුවට වැඩිම බැටළුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ (42) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු බැටළුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 6.8% ක් වේ. අඩුම බැටළුවන් සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ මාතලේ, මන්නාරම, බදුල්ල යන දිස්ත්‍රික්කවලිනි. එම සංඛ්‍යාව 02 බැගින් වේ.

ගොවි කාරකයින් පදිංචි පළාත් අනුව සැලකීමේදී වැඩිම ඌරන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ වයඹ (2,948) පළාතෙනි. එය මුළු ඌරන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 48.7% ක් වේ. දෙවනුවට වැඩිම ඌරන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බස්නාහිර (1,820) පළාතෙන් වන අතර එය මුළු ඌරන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 30.1% ක් වේ. තෙවනුවට වැඩිම ඌරන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ඌව (317) පළාතෙන් වන අතර එය මුළු ඌරන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 5.2% ක් වේ. අඩුම ඌරන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ දකුණු (47) පළාතෙනි. එය මුළු ඌරන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.8% ක් වේ. සෙසු පළාත්වලින් උතුරුමැද පළාතෙන් ඌරන් 301 ක් ද මධ්‍යම පළාතෙන් ඌරන් 242 ක් ද සබරගමුව පළාතෙන් ඌරන් 152 ක් ද නැගෙනහිර පළාතෙන් ඌරන් 199 ක් ද උතුරු පළාතෙන් ඌරන් 57 ක් ද ලෙස ඌරන් වාර්තා වී ඇත.

ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකීමේදී වැඩිම ඌරන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ පුත්තලම (2,264) දිස්ත්‍රික්කයෙනි. එය මුළු ඌරන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 37.4% ක් වේ. දෙවනුවට වැඩිම ඌරන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ (1,437) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු ඌරන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 23.7% ක් වේ. තෙවනුවට වැඩිම ඌරන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල (684) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු ඌරන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 11.3% ක් වේ. අඩුම ඌරන් සංඛ්‍යාව කිලිනොච්චි (02) , මාතර (02) දිස්ත්‍රික වලින් වාර්තා වී ඇත. ඌරන් 200 – 300 අතර සංඛ්‍යාවක් මොණරාගල (296), කළුතර (232) දිස්ත්‍රික්කවලින් ද ඌරන් 100 – 200 අතර සංඛ්‍යාවක් පොළොන්නරුව (173), කොළඹ (151), අනුරාධපුර (128) හා රත්නපුර (65) යන දිස්ත්‍රික්ක වලින් ද වාර්තා වී ඇත. සෙසු දිස්ත්‍රික්ක වලින් වාර්තා වන ඌරන් සංඛ්‍යාව 100 ට අඩු සංඛ්‍යාවක් වන අතර හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් 08 ක් ද මුලතිව් දිස්ත්‍රික්කයෙන් 05 ක් ද ලෙස ඌරන් වාර්තා වී ඇත.

වගු අංක 3.1.6 : ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව එළුවන්, බැටළුවන් හා ඌරන් සංඛ්‍යාව - 2014

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	එළුවන්		බැටළුවන්		ඌරන්	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	989	1.3	8	1.3	151	2.5
ගම්පහ	2,110	2.9	42	6.8	1,437	23.7
කළුතර	3,386	4.6	4	0.7	232	3.8
මහනුවර	2,990	4.1	4	0.7	79	1.3
මාතලේ	981	1.3	2	0.3	50	0.8
නුවරඑළිය	1,885	2.6	10	1.6	85	1.4
ගාල්ල	2,298	3.1	5	0.8	37	0.6
මාතර	1,331	1.8	6	1.0	2	0.0
හම්බන්තොට	225	0.3	4	0.7	8	0.1
යාපනය	24,274	33.0	261	42.4	17	0.3
මන්නාරම	1,999	2.7	2	0.3	12	0.2
වවුනියාව	1,076	1.5	13	2.1	21	0.3
මුලතිවු	460	0.6	10	1.6	5	0.1
කිලිනොච්චිය	719	1.0	18	2.9	2	0.0
මඩකලපුව	5,254	7.1	8	1.3	44	0.7
අම්පාර	3,663	5.0	38	6.2	78	1.3
ත්‍රිකුණාමලය	3,571	4.8	17	2.8	77	1.3
කුරුණෑගල	2,642	3.6	22	3.6	684	11.3
පුත්තලම	2,830	3.8	25	4.1	2,264	37.4
අනුරාධපුර	552	0.7	5	0.8	128	2.1
පොළොන්නරුව	512	0.7	21	3.4	173	2.9
බදුල්ල	2,559	3.5	2	0.3	21	0.3
මොණරාගල	540	0.7	4	0.7	296	4.9
රත්නපුර	3,683	5.0	58	9.4	65	1.1
කෑගල්ල	3,114	4.2	26	4.2	87	1.4
ශ්‍රී ලංකාව	**73,643**	**100.0**	**615**	**100.0**	**6,055**	**100.0**

රූප සටහන 01 : සත්ත්ව පාලනයේ ව්‍යාප්තිය - 2014



සිතියම් අංක 6 :දිස්ත්‍රික්ක අනුව පර්චර්ස් 40 ට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ කාණ්ඩයේ පරිභෝජනයට යොදාගන්නා කුඩා ගොවි කාණ්ඩ යටතේ සිටින එළුවන් බැටළුවන් සහ ඌරන් සංඛ්‍යාව



එළුවන්, බැටළුවන්, ඌරන් සංඛ්‍යාව ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

3.1.7 දිස්ත්‍රික්ක අනුව කුකුල් පාලනයේ හා අනෙකුත් කුකුල් වර්ගවල ව්‍යාප්තිය

මෙ යටතේ 2014 වසරේ පර්චස් 40 ක් හෝ ඊට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ පරිභෝජනයට යොදා ගන්නා කුඩා ගොවි කාණ්ඩවල කුකුළන්/ කිකිළියන් සංඛ්‍යාව ගොවි කාරකයා පදිංචි පළාත/ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

මෙවර පවත්වන ලද ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික තොරතුරු රැස්කිරීමේ අදියරේදී ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන කුකුළු පාලනයේ හා අනෙකුත් කුකුළු වර්ග පිළිබඳව තොරතුරු ද එක් රැස් කරනු ලැබිණි. එහිදී මෙම කාණ්ඩය යටතේ ශ්‍රී ලංකාවෙන් වාර්තා වී ඇති මුළු කුකුල් ගහණය 999,916 ක් වේ. එයින් බිත්තර පිණිස ඇති කරනු ලබන කිකිළියන් 705,904 ක් වාර්තා වී ඇත. එය මුළු කුකුල් ගහණයේ ප්‍රතිශතයක් ලෙස 70.6% ක් වේ. මුළු කුකුල් ගහණයෙන් 119,498 ක් මස් පිණිස ඇති කරන කුකුළු/කිකිළියන් බව වාර්තා වී ඇත. එය මුළු කුකුල් ගහණයේ ප්‍රතිශතයක් ලෙස 11.9% ක් වේ. මෙම අංශ දෙකටම අයත් නොවන කුකුළු/කිකිළියන් 174,514 ක් ශ්‍රී ලංකාවෙන් වාර්තා වී ඇත. එය මුළු කුකුල් ගහණයේ ප්‍රතිශතයක් ලෙස 17.5% ක් වේ.

ගොවි කාරකයින් පදිංචි පළාත් අනුව සැලකීමේදී වැඩිම කුකුල් ගහණයක් වාර්තා වී ඇත්තේ නැගෙනහිර (289,755) පළාතෙනි. එය මුළු කුකුල් ගහණයේ ප්‍රතිශතයක් ලෙස 29.0% ක් වේ. දෙවනුවට වැඩිම කුකුල් ගහණයක් වාර්තා වී ඇත්තේ උතුරු (217,411) පළාතෙනි. එය මුළු කුකුල් ගහණයේ ප්‍රතිශතයක් ලෙස 21.7% ක් වේ. තෙවනුවට වැඩිම කුකුල් ගහණයක් වාර්තා වී ඇත්තේ බස්නාහිර (145,957) පළාතෙනි. එය මුළු කුකුල් ගහණයේ ප්‍රතිශතයක් ලෙස 14.6% ක් වේ. මේ අතරින් බිත්තර පිණිස ඇති කරන කිකිළියන්ගෙන් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ නැගෙනහිර (186,443) පළාතෙනි. එය බිත්තර දමන කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 26.4% ක් වේ. බිත්තර දමන කිකිළියන් අඩුම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ඌව (20,650) පළාතෙනි. මස් පිණිස ඇතිකරන කුකුළු/කිකිළියන් වැඩිම සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ නැගෙනහිර (41,350) පළාතෙනි. එය මස් පිණිස ඇති කරන කුකුළු/කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 34.6% ක් වේ. මස් පිණිස ඇතිකරන කුකුළු/කිකිළියන් අඩුම සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ ඌව (1,872) පළාතෙනි. එය මස් පිණිස ඇති කරන කුකුළු/කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 1.6% ක් වේ. මෙම අංශ දෙකටම අයත් නොවන (අනෙකුත්) කුකුළු/කිකිළියන්ගෙන් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ නැගෙනහිර (61,962) පළාතෙන් වන අතර අඩුම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ උතුරුමැද (2,907) පළාතෙනි.

ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකීමේදී වැඩිම කුකුල් ගහණයක් වාර්තා වී ඇත්තේ යාපනය (138,106) දිස්ත්‍රික්කයෙනි. එය මුළු මුළු කුකුල් ගහණයේ ප්‍රතිශතයක් ලෙස 13.8% ක් වේ. දෙවනුවට වැඩිම කුකුල් ගහණයක් වාර්තා වී ඇත්තේ අම්පාර (113,689) දිස්ත්‍රික්කයෙනි. එය මුළු කුකුල් ගහණයේ ප්‍රතිශතයක් ලෙස 11.4% ක් වේ. තෙවනුවට වැඩිම කුකුල් ගහණයක් වාර්තා වී ඇත්තේ ගම්පහ (91,788) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු කුකුල් ගහණයේ ප්‍රතිශතයක් ලෙස 9.1% ක් වේ. දිස්ත්‍රික්ක මට්ටමෙන් සැලකීමේදී අඩුම කුකුල් ගහණයක් වාර්තා වී ඇත්තේ හම්බන්තොට (6,045) දිස්ත්‍රික්කයෙනි. එය මුළු කුකුල් ගහණයේ ප්‍රතිශතයක් ලෙස 0.6% ක් වේ. මේ අතරින් බිත්තර පිණිස ඇතිකරන කිකිළියන්ගෙන් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ යාපනය (99,849) දිස්ත්‍රික්කයෙනි. එය බිත්තර පිණිස ඇති කරන කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 14.1% ක් වේ. බිත්තර පිණිස ඇති කරන කිකිළියන් අඩුම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ හම්බන්තොට (4,970) දිස්ත්‍රික්කයෙනි. එය බිත්තර පිණිස ඇති කරන කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.7% ක් වේ. මස් පිණිස ඇති කරන කුකුළු/කිකිළියන් වැඩිම සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ අම්පාර (21,638)

දිස්ත්‍රික්කයෙනි. එය මස් පිණිස ඇති කරන කුකුළු/කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 18.1% ක් වේ. මස් පිණිස ඇති කරන කුකුළු/ කිකිළියන් අඩුම සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ මොණරාගල (412) දිස්ත්‍රික්කයෙනි. එය මස් පිණිස ඇති කරන කුකුළු/කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.3% ක් වේ. මෙම අංශ දෙකටම අයත් නොවන (අනෙකුත්) කුකුළු/කිකිළියන්ගෙන් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ යාපනය (28,486) දිස්ත්‍රික්කයෙනි. එම අංශයට අයත් කුකුළු/කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට එය 16.3% ක් වේ. මෙම අංශ දෙකටම අයත් නොවන (අනෙකුත්) කුකුළු/කිකිළියන්ගෙන් අඩුම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මොනරාගල (492) දිස්ත්‍රික්කයෙන් වන අතර එය එම අංශයට අයත් කුකුළු/කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට 0.3% ක් වේ.

මෙම සංගණනයේදී එක් රැස් කරන ලද තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාවේ වාර්තා වී ඇති තාරාවන් සංඛ්‍යාව 7,805ක් ද කළුකුන් සංඛ්‍යාව 2,591ක් ද වටුවන් සංඛ්‍යාව 1,415ක් ද වේ.

ගොවි කාරකයින් පදිංචි පළාත් අනුව සැලකීමේදී වැඩිම තාරාවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ නැගෙනහිර (2,856) පළාතෙනි. එය මුළු තාරාවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 37.6% ක් වේ. අඩුම තාරාවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ඌව (88) පළාතෙනි. එය මුළු තාරාවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 1.1% ක් වේ. වැඩිම කළුකුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බස්නාහිර (804) පළාතෙනි. එය මුළු කළුකුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 31.0% ක් වේ. අඩුම කළුකුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ උතුරු (73) හා ඌව (73) පළාත් වලිනි. එය මුළු කළුකුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 2.8% ක් වේ. වැඩිම වටුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බස්නාහිර (573) පළාතෙනි. එය මුළු වටුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 40.5% ක් වේ. අඩුම වටුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ඌව (25) පළාතෙන් වන අතර එය මුළු වටුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 1.8% ක් වේ.

ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකීමේදී වැඩිම තාරාවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ත්‍රිකුණාමලය (1,037) දිස්ත්‍රික්කයෙනි. එය මුළු තාරාවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 13.3% ක් වේ. අඩුම තාරාවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මොණරාගල (05) දිස්ත්‍රික්කයෙනි. එය මුළු තාරාවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.1% ක් වේ. වැඩිම කළුකුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ (367) දිස්ත්‍රික්කයෙනි. එය මුළු කළුකුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 14.2% ක් වේ. මුලතිව් දිස්ත්‍රික්කයෙන් කළුකුන් වාර්තා වී නොමැත. වැඩිම වටුවන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කළුතර (324) දිස්ත්‍රික්කයෙනි. එය මුළු වටුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 22.9% ක් වේ. මන්නාරම, මුලතිව්, කිලිනොච්චි, අනුරාධපුර හා මොණරාගල යන දිස්ත්‍රික්කවලින් වටුවන් වාර්තා වී නොමැත.

වගු අංක 3.1.7 : ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව කුකුළන්/කිකිළියන්, තාරාවන්, කළුකුන්, වටුවන් සංඛ්‍යාව - 2014

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	කුකුළන්/කිකිළියන්						තාරාවන්		කළුකුන්		වටුවන්	
	බිත්තර පිණිස		මස් පිණිස		අනෙකුත්							
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	16,984	2.4	2,674	2.2	2,971	1.7	307	3.9	110	4.2	96	6.8
ගම්පහ	70,821	10.0	10,165	8.5	10,802	6.2	899	11.5	367	14.2	153	10.8
කළුතර	24,184	3.4	2,944	2.5	4,412	2.5	216	2.8	327	12.6	324	22.9
මහනුවර	29,374	4.2	3,772	3.2	6,338	3.6	405	5.2	109	4.2	36	2.5
මාතලේ	10,245	1.5	3,279	2.7	1,873	1.1	93	1.2	45	1.7	6	0.4
නුවරඑළිය	13,553	1.9	2,987	2.5	7,096	4.1	154	2.0	20	0.8	3	0.2
ගාල්ල	14,478	2.1	1,356	1.1	2,551	1.5	171	2.2	147	5.7	59	4.2
මාතර	8,816	1.2	999	0.8	1,917	1.1	55	0.7	50	1.9	7	0.5
හම්බන්තොට	4,970	0.7	536	0.4	539	0.3	98	1.3	23	0.9	9	0.6
යාපනය	99,849	14.1	9,771	8.2	28,486	16.3	320	4.1	34	1.3	42	3.0
මන්නාරම	19,543	2.8	2,233	1.9	7,669	4.4	289	3.7	11	0.4	0	0.0
වවුනියාව	12,482	1.8	1,079	0.9	2,665	1.5	196	2.5	11	0.4	3	0.2
මුලතිවු	12,121	1.7	1,732	1.4	2,869	1.6	35	0.4	5	0.2	0	0.0
කිලිනොච්චිය	12,027	1.7	814	0.7	4,071	2.3	31	0.4	12	0.5	0	0.0
මඩකලපුව	51,829	7.3	11,812	9.9	21,678	12.4	960	12.3	186	7.2	22	1.6
අම්පාර	72,007	10.2	21,638	18.1	20,044	11.5	859	11.0	148	5.7	298	21.1
ත්‍රිකුණාමලය	62,607	8.9	7,900	6.6	20,240	11.6	1,037	13.3	132	5.1	95	6.7
කුරුණෑගල	39,323	5.6	7,989	6.7	5,053	2.9	514	6.6	224	8.6	69	4.9
පුත්තලම	49,840	7.1	11,838	9.9	11,404	6.5	346	4.4	270	10.4	88	6.2
අනුරාධපුර	11,719	1.7	2,101	1.8	1,577	0.9	241	3.1	82	3.2	0	0.0
පොළොන්නරුව	13,082	1.9	1,320	1.1	1,330	0.8	183	2.3	60	2.3	38	2.7
බදුල්ල	15,370	2.2	1,460	1.2	3,334	1.9	83	1.1	53	2.0	25	1.8
මොණරාගල	5,280	0.7	412	0.3	492	0.3	5	0.1	20	0.8	0	0.0
රත්නපුර	13,706	1.9	4,751	4.0	3,196	1.8	171	2.2	47	1.8	0	0.0
කෑගල්ල	21,694	3.1	3,936	3.3	1,907	1.1	137	1.8	98	3.8	42	3.0
ශ්‍රී ලංකාව	**705,904**	**100.0**	**119,498**	**100.0**	**174,514**	**100.0**	**7,805**	**100.0**	**2,591**	**100.0**	**1,415**	**100.0**

රූප සටහන 02 : කුකුළන් සංඛ්‍යාවේ ව්‍යාප්තිය - 2014



රූප සටහන 03 : තාරාවන්, කළුකුන් හා වටුවන් සංඛ්‍යාවේ ව්‍යාප්තිය - 2014



සිතියම් අංක 7 : දිස්ත්‍රික්ක අනුව පර්චර්ස් 40ට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ කාණ්ඩයේ පරිභෝජනයට යොදාගන්නා කුඩා ගොවි කාණ්ඩ වල කුකුළු පාලනය සහ අනෙකුත් සතුන් පිළිබඳ සංඛ්‍යාති



කුකුළන්/ කිකිළියන් සහ අනෙකුත් කුකුල් වර්ගයන්ට අයත් සතුන් සංඛ්‍යාව ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්කය අනුව සළකන් කර ඇත.

සිතියම් අංක 8 : දිස්ත්‍රික්ක අනුව පර්වර්ස් 40ට අඩු සහ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් ගෘහ කාණ්ඩයේ පරිභෝජනයට යොදාගන්නා කුඩා ගොවි කාණ්ඩ වල කුකුළු පාලනය පිළිබඳ සංඛ්‍යාති



කුකුළන්/ කිකිළියන් සංඛ්‍යාව ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්කය අනුව සඳහන්ව ඇත.

3.2 පර්චස් 40 ට වැඩි හෝ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් අලෙවි කරනු ලබන කුඩා ගොවි කාණ්ඩ

3.2.1 දිස්ත්‍රික්ක අනුව ගොවි කාරකයින්ගේ සහ උප ගොවි කාරකයින්ගේ ව්‍යාප්තිය

මේ යටතේ 2014 වසරේ පර්චස් 40 ට වැඩි හෝ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් අලෙවි කරනු ලබන කුඩා ගොවි කාණ්ඩවල ගොවි කාරකයින් සහ උප ගොවි කාරකයින් සංඛ්‍යාව ගොවි කාරකයා පදිංචි පළාත/ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ සාරාංශ වාර්තාව නිකුත් කරන මෙම අදියරේදී මෙම කාණ්ඩය යටතේ රටේ මුළු ගොවි කාරකයින් සංඛ්‍යාව ස්ත්‍රී/පුරුෂ භාවය අනුව දිස්ත්‍රික් මට්ටමෙන් බෙදී යන ආකාරය පැහැදිලි කළ හැක.

මේ අනුව 2014 වර්ෂයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කිරීම අනුව මෙම කාණ්ඩයෙන් වාර්තා වන රටේ මුළු ගොවි කාරකයින් සංඛ්‍යාව 2,300,677 ක් වේ. එහි පිරිමි ගොවි කාරකයින් සංඛ්‍යාව 1,883,325 ක් වන අතර ගැහැණු ගොවි කාරකයින් සංඛ්‍යාව 417,3 52 ක් ලෙස වාර්තා වී ඇත. ගැහැණු සහ පිරිමි ගොවි කාරකයින් සංඛ්‍යාව ප්‍රතිශතයක් වශයෙන් දැක්වුවහොත් පිළිවෙලින් 81.9% ක් හා 18.1% ක් ලෙස වාර්තා වී ඇත.

පසුගිය කෘෂිකර්ම සංගණනයේදී (2002 වර්ෂයේ) මෙම ගොවි කාරකයින් සංඛ්‍යාව 1,748,341 ක් ලෙස වාර්තා වී ඇති අතර 2002 – 2014 කාල පරාසය තුළ මෙම සංඛ්‍යාව 552,336 (31.6%) කින් වැඩිවී ඇත.

ගොවි කාරකයින් පදිංචි පළාත් අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම ගොවි කාරකයින් සංඛ්‍යාව වයඹ (382,243) පළාතෙන් වාර්තා වී ඇති අතර එය මුළු ගොවි කාරකයින් සංඛ්‍යාවෙන් 16.6% ක ප්‍රතිශතයකි. අඩුම ගොවි කාරකයින් සංඛ්‍යාව උතුරු (123,326) පළාතෙන් වාර්තා වී ඇති අතර එය මුළු ගොවි කාරකයින් සංඛ්‍යාවෙන් 5.4% ක ප්‍රතිශතයකි. දකුණු පළාතෙන් ගොවි කාරකයින් 341,370 (14.8%) ක් ද මධ්‍යම පළාතෙන් ගොවි කාරකයින් 301,428 (13.1%) ක් ද වාර්තා වී ඇත.

ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම ගොවි කාරකයින් සංඛ්‍යාව කුරුණෑගල (291,522) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය මුළු ගොවි කාරකයින් සංඛ්‍යාවෙන් 12.7% ක ප්‍රතිශතයකි. දෙවනුවට වැඩිම ගොවි කාරකයින් සංඛ්‍යාව අනුරාධපුර (185,202) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය මුළු ගොවි කාරකයින් සංඛ්‍යාවෙන් 8.0% කි. තෙවනුවට වැඩිම ගොවි කාරකයින් සංඛ්‍යාව රත්නපුරය (170,394) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර එය මුළු ගොවි කාරකයින් සංඛ්‍යාවෙන් 7.4% කි. අඩුම ගොවි කාරකයින් සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ මන්නාරම (9,273) දිස්ත්‍රික්කයෙන් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 0.4% කි.

150,000 ට වැඩි ගොවි කාරකයින් සංඛ්‍යාවක් රත්නපුර (170,394), අනුරාධපුර (185,202), කුරුණෑගල (291,522) යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත. 125,000 – 150,000 අතර ගොවි කාරකයින් සංඛ්‍යාවක් මහනුවර (138,310), ගාල්ල (128,004) හා බදුල්ල (125,051) යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇති අතර 100,000 – 125,000 අතර ගොවි කාරකයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇති දිස්ත්‍රික්ක ලෙස ගම්පහ (111,127), කෑගල්ල (109,796), මාතර (108,020), හම්බන්තොට (105,346) හා මොණරාගල (103,603) යන දිස්ත්‍රික්ක දැක්විය හැක. 50,000 – 100,000 අතර ගොවි කාරකයින්

සංඛ්‍යාවක් වාර්තා වී ඇති දිස්ත්‍රික්ක වන්නේ කළුතර (95,526), පුත්තලම (90,721), නුවරඑළිය (85,258), පොළොන්නරුව (78,747), මාතලේ (77,860), අම්පාර (68,983) යන දිස්ත්‍රික්කයන්ය. සෙසු දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇති ගොවි කාරකයින් සංඛ්‍යාව 50,000 ට අඩු වන අතර එයින් ගොවි කාරකයින් 25,000 ටත් අඩු දිස්ත්‍රික්ක ලෙස මුලතිව් (22,361), කිලිනොච්චිය (22,066) හා මන්නාරම (9,273) දැක්විය හැක. වැඩිම පිරිමි ගොවි කාරකයින් සංඛ්‍යාව වන 234,825 හා වැඩිම ගැහැණු ගොවි කාරකයින් සංඛ්‍යාව වන 56,697 කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. අඩුම පිරිමි ගොවි කාරකයින් සංඛ්‍යාව වන 8,105 හා අඩුම ගැහැණු ගොවි කාරකයින් සංඛ්‍යාව වන 1,168 මන්නාරම දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

ගොවි කාරකයින්ට අමතරව මෙවර කෘෂිකාර්මික තොරතුරු රැස් කිරීමේ අදියරේදී උප ගොවි කාරකයින් පිළිබඳව ද තොරතුරු රැස් කළ අතර 2014 කෘෂිකාර්මික තොරතුරු රැස් කිරීම අනුව මුළු උප ගොවි කාරකයින් සංඛ්‍යාව 22,502 ක් ලෙස වාර්තා වී ඇත. මෙයින් පිරිමි උප ගොවි කාරකයින් 11,485 (51.0%) ක් වන අතර ගැහැණු උප ගොවි කාරකයින් 11,017 (49.0%) ක් වේ.

පළාත් අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම උප ගොවි කාරකයින් සංඛ්‍යාව සබරගමුව (3,759) පළාතෙන් වාර්තා වී ඇති අතර එය මුළු ගොවි කාරකයින් සංඛ්‍යාවෙන් 16. 7% ක ප්‍රතිශතයකි. අඩුම උප ගොවි කාරකයින් සංඛ්‍යාව උතුරුමැද (1,287) පළාතෙන් වාර්තා වී ඇති අතර එය මුළු ගොවි කාරකයින් සංඛ්‍යාවෙන් 5.7% ක ප්‍රතිශතයකි. උතුරු පළාතෙන් උප ගොවි කාරකයින් 2,864 (12.7%) ක් ද වයඹ පළාතෙන් උප ගොවි කාරකයින් 2,780 (12.3%) ක් ද දකුණු පළාතෙන් උප ගොවි කාරකයින් 2,736 (12.2%) ක් ද නැගෙනහිර පළාතෙන් උප ගොවි කාරකයින් 2,638 (11.7) ක් ද බස්නාහිර පළාතෙන් උප ගොවි කාරකයින් 2,292 (10.2%) ක් ද මධ්‍යම පළාතෙන් උප ගොවි කාරකයින් 2,103 (9.3%) ක් ද ඌව පළාතෙන් උප ගොවි කාරකයින් 2,043 (9.1%) ක් ද ලෙස වාර්තා වී ඇත.

දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් වැඩිම උප ගොවි කාරකයින් සංඛ්‍යාව රත්නපුර (2,598) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර අඩුම උප ගොවි කාරකයින් සංඛ්‍යාව මන්නාරම (35) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. එමෙන්ම වැඩිම පිරිමි උප ගොවි කාරකයින් සංඛ්‍යාව 1,322 ක් ලෙසත් වැඩිම ගැහැණු උප ගොවි කාරකයින් සංඛ්‍යාව 1,266 ලෙසත් රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. අඩුම පිරිමි උප ගොවි කාරකයින් සංඛ්‍යාව වන 23 හා අඩුම ගැහැණු උප ගොවි කාරකයින් සංඛ්‍යාව වන 12 මන්නාරම දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

වගු අංක 3.2.1 : ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව ගොවි කාරකයින් සහ උප ගොවි කාරකයින් සංඛ්‍යාව -2014

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	ගොවි කාරකයින්				උප ගොවි කාරකයින්				එකතුව			
	පුරුෂ		ස්ත්‍රී		පුරුෂ		ස්ත්‍රී		පුරුෂ		ස්ත්‍රී	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	28,206	1.5	5,956	1.4	180	1.6	210	1.9	28,386	1.5	6,166	1.4
ගම්පහ	89,643	4.8	21,484	5.1	474	4.1	509	4.6	90,117	4.8	21,993	5.1
කළුතර	76,615	4.1	18,911	4.5	493	4.3	426	3.9	77,108	4.1	19,337	4.5
මහනුවර	110,507	5.9	27,803	6.7	474	4.1	452	4.1	110,981	5.9	28,255	6.6
මාතලේ	64,904	3.4	12,956	3.1	294	2.6	133	1.2	65,198	3.4	13,089	3.1
නුවරඑළිය	72,733	3.9	12,525	3.0	456	4	294	2.7	73,189	3.9	12,819	3
ගාල්ල	102,204	5.4	25,800	6.2	503	4.4	684	6.2	102,707	5.4	26,484	6.2
මාතර	88,483	4.7	19,537	4.7	440	3.8	275	2.5	88,923	4.7	19,812	4.6
හම්බන්තොට	87,578	4.6	17,768	4.3	642	5.6	192	1.7	88,220	4.7	17,960	4.2
යාපනය	35,389	1.9	7743	1.8	126	1.1	193	1.8	35,515	1.9	7,936	1.9
මන්නාරම	8,105	0.4	1168	0.3	23	0.2	12	0.1	8,128	0.4	1,180	0.3
වවුනියාව	20,701	1.1	5793	1.4	142	1.2	658	6	20,843	1.1	6,451	1.5
මුලතිවු	17,094	0.9	5267	1.3	298	2.6	551	5	17,392	0.9	5,818	1.4
කිලිනොච්චිය	17,274	0.9	4,792	1.1	53	0.5	808	7.3	17,327	0.9	5,600	1.3
මඩකලපුව	28,302	1.5	6815	1.6	345	3	197	1.8	28,647	1.5	7,012	1.6
අම්පාර	58,541	3.1	10442	2.5	603	5.3	840	7.6	59,144	3.1	11,282	2.6
ත්‍රිකුණාමලය	28,747	1.5	5855	1.4	494	4.3	159	1.4	29,241	1.5	6,014	1.4
කුරුණෑගල	234,825	12.5	56697	13.6	958	8.3	837	7.6	235,783	12.4	57,534	13.4
පුත්තලම	70,279	3.7	20442	4.9	417	3.6	568	5.2	70,696	3.7	21,010	4.9
අනුරාධපුර	153,615	8.2	31587	7.6	554	4.8	147	1.3	154,169	8.1	31,734	7.4
පොළොන්නරුව	64,012	3.4	14735	3.5	438	3.8	148	1.3	64,450	3.4	14,883	3.5
බදුල්ල	104,188	5.5	20863	5	461	4.0	400	3.6	104,649	5.5	21,263	5.0
මොණරාගල	88,305	4.7	15298	3.7	649	5.7	533	4.8	88,954	4.7	15,831	3.7
රත්නපුර	144,953	7.7	25441	6.1	1,332	11.6	1,266	11.5	146,285	7.7	26,707	6.2
කෑගල්ල	88,122	4.7	21674	5.2	636	5.5	525	4.8	88,758	4.7	22,199	5.2
ශ්‍රී ලංකාව	**1,883,325**	**100.0**	**417,352**	**100.0**	**11,485**	**100.0**	**11,017**	**100.0**	**1,894,810**	**100.0**	**428,369**	**100.0**

සිතියම් අංක 9 : දිස්ත්‍රික්ක මට්ටමින් කුඩා ගොවි කාණ්ඩ යටතේ සිටින ගොවි කාරකයින් ගණන ස්ත්‍රී පුරුෂ භාවය අනුව



ගොවි කාරකයින් සංඛ්‍යාව ඔවුන්ගේ පදිංචි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

3.2.2 දිස්ත්‍රික්ක අනුව කුඩා ගොවි කාණ්ඩවල බිම් ප්‍රමාණයෙහි ව්‍යාප්තිය

මේ යටතේ 2014 වසරේ පර්චස් 40 ට වැඩි හෝ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් අලෙවි කරනු ලබන කුඩා ගොවි කාණ්ඩවල බිම් ප්‍රමාණය ගොවි කාරකයා පදිංචි පළාත/ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

ශ්‍රී ලංකාව	**8,173**	**219,816**	**227,989**	**100.0**

3.3.6 කුඩා ගොවි කාණ්ඩවල කුකුල් පාලනය

මේ යටතේ 2014 වසරේ කුඩා ගොවි කාණ්ඩවල කුකුළන්/ කිකිළියන් සංඛ්‍යාව ගොවි කාරකයින් පදිංචි පළාත/ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

ආර්ථික සංගණනය 2013/14 යටතේ සිදු කල කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමේදී කුඩා ගොවි කාණ්ඩ යටතේ ශ්‍රී ලංකාවෙන් වාර්තා වී ඇති මුළු කුකුළන් සංඛ්‍යාව 6,327,977 ක් වේ. එයින් පර්චස් 40 ට අඩු සහ නිෂ්පාදනයෙන් වැඩි කොටස නිවසේ පරිභෝජනයට ගන්නා කුඩා ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති සංඛ්‍යාව 999,916 ක් වේ. එය කුඩා ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති මුළු කුකුළන් සංඛ්‍යාවෙන් 15.8% ක් වේ. එමෙන්ම පර්චස් 40 ට වැඩි හෝ නිෂ්පාදනයෙන් වැඩි කොටසක් අලෙවි කරන ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති කුකුළන් සංඛ්‍යාව 5,328,061 ක් වේ. එය කුඩා ගොවි කාණ්ඩ යටතේ වාර්තා වී ඇති මුළු කුකුළන් සංඛ්‍යාවේ ප්‍රතිශතක් වශයෙන් 84.2% ක් වේ.

ගොවිකාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව සැලකිල්ලට ගතහොත් කුඩා ගොවි කාණ්ඩ යටතේ වැඩිම කුකුළන් සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙනි. එම සංඛ්‍යාව 2,871,794 (45.4%) ක් වේ. එමෙන්ම දෙවනුවට කුඩා ගොවි කාණ්ඩ යටතේ වැඩිම කුකුළන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ පුත්තලම දිස්ත්‍රික්කයෙන් වන අතර එම සංඛ්‍යාව 549,225 (8.7%) ක් වේ. අඩුම කුකුළන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ හම්බන්තොට දිස්ත්‍රික්කයෙනි. එම සංඛ්‍යාව 33,803 (0.5%) ක් වේ.

වගු අංක 3.3.6 : ගොවි කාරකයින් පදිංචි දිස්ත්‍රික්ක අනුව කුඩා ගොවිකාණ්ඩවල කුකුළන් සහ කිකිළියන් සංඛ්‍යාව - 2014

ගොවි කාරකයා පදිංචි දිස්ත්‍රික්කය	කුකුළන් සහ කිකිළියන් සංඛ්‍යාව			
	පර්චස් 40කට අඩු ගොවි කාණ්ඩ	* පර්චස් 40කට වැඩි ගොවි කාණ්ඩ	එකතුව	
			සංඛ්‍යාව	%
කොළඹ	22,629	389,101	411,730	6.5
ගම්පහ	91,788	246,162	337,950	5.3
කළුතර	31,540	168,129	199,669	3.2
මහනුවර	39,484	132,532	172,016	2.7
මාතලේ	15,397	59,012	74,409	1.2
නුවරඑළිය	23,636	32,961	56,597	0.9
ගාල්ල	18,385	80,520	98,905	1.6
මාතර	11,732	42,264	53,996	0.9
හම්බන්තොට	6,045	27,758	33,803	0.5
යාපනය	138,106	131,971	270,077	4.3
මන්නාරම	29,445	36,640	66,085	1.0
වවුනියාව	16,226	53,924	70,150	1.1
මුලතිව්	16,722	62,523	79,245	1.3
කිළිනොච්චි	16,912	76,577	93,489	1.5
මඩකළපුව	85,319	41,394	126,713	2.0
අම්පාර	113,689	46,675	160,364	2.5
ත්‍රිකුණාමලය	90,747	67,740	158,487	2.5
කුරුණෑගල	52,365	2,819,429	2,871,794	45.4
පුත්තලම	73,082	476,143	549,225	8.7
අනුරාධපුර	15,397	96,587	111,984	1.8
පොළොන්නරුව	15,732	59,854	75,586	1.2
බදුල්ල	20,164	67,985	88,149	1.4
මොණරාගල	6,184	33,369	39,553	0.6
රත්නපුර	21,653	21,852	43,505	0.7
කෑගල්ල	27,537	56,959	84,496	1.3
ශ්‍රී ලංකාව	**999,916**	**5,328,061**	**6,327,977**	**100.0**

* මෙහි මස් පිණිස ඇති කරනු ලබන කුකුළන්/ කිකිළියන් සංඛ්‍යාව ඇතුලත් වී නැත.

සිව්වන පරිච්ඡේදය

4. වතු අංශය

ආර්ථික සංගණනය 2013/14 යටතේ පවත්වන ලද කෘෂිකාර්මික තොරතුරු රැස් කිරීමේ අදියරේදී කුඩා ගොවි කාණ්ඩ පිළිබඳ තොරතුරු මෙන්ම වතු අංශය පිළිබඳ තොරතුරු ද රැස් කරනු ලැබිණි. එම අදියරේදී සකසන ලද සාරාංශ ලේඛන ඇසුරින් වතු ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත.

වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි ස්ථානය

වත්තක් තුළ වත්තට අදාල සියලුම පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන තීන්දු තීරණ ගන්නා නිලධාරීන් ස්ථානගත වී ඇති ප්‍රධාන කාර්යාලය පිහිටි ස්ථානය, ආර්ථික සංගණනය යටතේ වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි ස්ථානය ලෙස සලකන ලදි. වත්තකට අදාලව උප කොටස් කිහිපයක් ඇති අවස්ථාවක එම උප කොටස් වලටද උප පරිපාලන කාර්යාල පිහිටා තිබිය හැකිය. නමුත් ආර්ථික සංගණනය යටතේ වත්තේ පරිපාලන කාර්යාලය ලෙස සලකනු ලැබූයේ උප කොටස් සියල්ලම පරිපාලනය කරනු ලබන ප්‍රධාන පරිපාලන කාර්යාලයයි.

4.1 වතු සංඛ්‍යාව හා ඒවායෙහි බිම් ප්‍රමාණයේ ව්‍යාප්තිය

2014 වර්ෂයේ පැවැත්වූ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමේ අදියරේදී වතු පිළිබඳ ලබා ගත් තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ වාර්තා වී ඇති මුළු වතු සංඛ්‍යාව 7,317 කි. 2002 කෘෂිකර්ම සංගණනයේදී එය 6,577 ක් ලෙස වාර්තා වී ඇත. 2002 වර්ෂය සමඟ සසඳන විට මෙවර වතු සංඛ්‍යාව 740 කින් වැඩිවී ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි පළාත අනුව සැලකීමේදී වැඩිම වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ වයඹ පළාතෙනි. එම සංඛ්‍යාව 3,193 ක් වේ. එය ශ්‍රී ලංකාවේ මුළු වතු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 43.6 % කි. අඩුම වතු සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ නැගෙනහිර පළාතෙනි. එම සංඛ්‍යාව 87 කි. එය මුළු වතු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 1.2 % කි. 2002 වර්ෂයේ පැවැත්වූ කෘෂිකර්ම සංගණනයේ වතු සංඛ්‍යාව සමඟ සසඳන විට 2014 වර්ෂයේ වතු පිළිබඳ තොරතුරු රැස් කිරීම අනුව, මෙම පළාතේ වතු සංඛ්‍යාවෙහි වැඩිවීමක් දැකිය හැක්කේ 2009 වර්ෂයේදී උදාවූ සාමකාමී වාතාවරණය තුළ මෙම ප්‍රදේශයේ ජනතාව, පුද්ගලික සමාගම් සහ රජය වතු අංශය සංවර්ධනය කිරීමට වැඩි උනන්දුවක් දැක්වීම නිසා විය හැක. එමෙන්ම 2002 වර්ෂයේදී පැවැත්වූ කෘෂිකර්ම සංගණනයේදී උතුරු පළාතේ ඇති වතු සංඛ්‍යාව එක් වත්තක් ලෙස වාර්තා වී ඇති අතර 2014 වන විට එම වතු සංඛ්‍යාව 244 දක්වා වැඩිවී ඇත. මීට ප්‍රධාන හේතුව වූයේ 2009 වර්ෂයෙන් පසුව රටේ ඇති වූ සාමකාමී පරිසරය තුළ අවතැන් වූ ජනතාව විශේෂයෙන්ම කිලිනොච්චි සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල නැවත පදිංචි කර වූ නිසා අතහැර දමා ඇති වතු නැවත නඩත්තු කිරීම ආරම්භ කිරීම විය හැක. ඒ සමඟම මෙම ප්‍රදේශයේ ඇති රජයට අයත් මුඩු ඉඩම් රජය විසින් ගොවිපළ ලෙස සංවර්ධනය කිරීම සඳහා මහජනතාව, පුද්ගලික ආයතන සහ රජයේ ආයතනවලට තම අනුග්‍රහය යටතේ ලබා දීමත් එක් කරුණක් විය හැක. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව මෙම වතුවල ව්‍යාප්තිය පිළිබඳ අවධානය යොමු කරන විට 2002 වර්ෂය මෙන්ම මෙවරත් වැඩි වතු සංඛ්‍යාවක් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී

ඇත. එම සංඛ්‍යාව 1828 කි. නමුත් 2002 වර්ෂයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ වතු සංඛ්‍යාව 2,017 ක් ලෙස වාර්තා වී ඇති අතර මෙවර එය 189 කින් පහත වැටී ඇත. දෙවනුවට වැඩිම වතු සංඛ්‍යාවක් පුත්තලම (1,365) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. රත්නපුර (614), ගම්පහ (406) යන දිස්ත්‍රික්කවල 700 – 400 ත් අතර වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත. කළුතර (334), මහනුවර (347) සහ කෑගල්ල (362) යන දිස්ත්‍රික්කවල 400 – 300 ත් අතර වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත. කොළඹ (124), මාතලේ (271), නුවරඑළිය (253), ගාල්ල (244), මාතර (299), හම්බන්තොට (118), කිළිනොච්චි (180), බදුල්ල (196) යන දිස්ත්‍රික්කවල 300 – 100 ත් අතර වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත. වතු සංඛ්‍යාව 100 ට අඩු දිස්ත්‍රික්ක ලෙස යාපනය (10), මන්නාරම (7), මුලතිව් (41), මඩකළපුව (57), අම්පාර (23), ත්‍රිකුණාමලය (7), අනුරාධපුරය (66), පොළොන්නරුව (62), මොණරාගල (97) වාර්තා වී ඇත. අඩුම වතු සංඛ්‍යාව වවුනියාව (6) දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

වතු යටතේ වාර්තා වී ඇති මුළු බිම් ප්‍රමාණය සැලකිල්ලට ගතහොත් 2014 වර්ෂයේ වාර්තා වී ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 951,983 (හෙක්ටයාර් 385,263) කි. මෙම බිම් ප්‍රමාණය 2002 වර්ෂයේ පැවති කෘෂිකර්ම සංගණනයේදී අක්කර 950,947ක් ලෙස වාර්තා වී ඇත. මේ අනුව ශ්‍රී ලංකාව තුළ වතු යටතේ බිම් ප්‍රමාණය 2002 වර්ෂය හා සැසඳීමේදි 2014 වර්ෂයේදී අක්කර 1,036 කින් එනම් 0.11 % කින් ඉහළ නැග ඇත.

වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී වතු යටතේ ඇති බිම් ප්‍රමාණයේ විශාල පහත වැටීමක් සිදුව ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේය. එම දිස්ත්‍රික්කයේ 2002 වර්ෂයේ පැවති කෘෂිකර්ම සංගණනයේදී අක්කර 121,804 ලෙස වාර්තා වී ඇති බිම් ප්‍රමාණය, 2014 වතු පිළිබඳ තොරතුරු රැස් කිරීමේ අදියරේදී අක්කර 105,294 ලෙසින් වාර්තා වී ඇති අතර එය අක්කර 16,510 කින් එනම් 13.6 % කින් අඩුවීමක් පෙන්නුම් කරයි. මීළඟට වතු අංශය යටතේ වැඩිම බිම් ප්‍රමාණයේ අඩුවීමක් වාර්තා වී ඇත්තේ බදුල්ල දිස්ත්‍රික්කයෙනි. එම දිස්ත්‍රික්කයේ වතු අංශය යටතේ ඇති බිම් ප්‍රමාණය 2002 වර්ෂයේ පැවති කෘෂිකර්ම සංගණනයේදී අක්කර 101,017 ක් ලෙස වාර්තා වී ඇති අතර 2014 වර්ෂයේදී අක්කර 88,809 ලෙස අක්කර 12,208 ක පහත වැටීමක් පෙන්නුම් කර ඇත. මෙම පහත වැටීම ප්‍රතිශතයක් ලෙස 12.1% ක් වේ. මාතලේ දිස්ත්‍රික්කයේ 2002 වර්ෂයේදී අක්කර 43,903 ක් ලෙස වාර්තා වූ බිම් ප්‍රමාණය 2014 වර්ෂයේදී අක්කර 32,136 ක් ලෙස ද ගාල්ල දිස්ත්‍රික්කයේ 2002 වර්ෂයේදී අක්කර 39,381 ක් ලෙස වාර්තා වූ බිම් ප්‍රමාණය 2014 වර්ෂයේදී අක්කර 30,630 ක් ලෙස ද කළුතර දිස්ත්‍රික්කයේ 2002 වර්ෂයේදී අක්කර 67,728 ක් ලෙස වාර්තා වූ බිම් ප්‍රමාණය 2014 වර්ෂයේදී අක්කර 59,807 ක් ලෙස ද මුළු බිම් ප්‍රමාණයේ අඩුවීමක් වාර්තා වී ඇත. එය ප්‍රතිශත ලෙස පිළිවෙලින් දැක්වූ විට 26.8% ක්, 22.22% ක් සහ 11.7% ක් වේ. පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සසඳන විට වතු යටතේ බිම් ප්‍රමාණය අඩුවී ඇති සෙසු දිස්ත්‍රික්ක ලෙස මාතර, හම්බන්තොට, රත්නපුර සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක දැක්විය හැක.

පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සසඳන විට වතු යටතේ බිම් ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වූ දිස්ත්‍රික්කය ලෙස පොළොන්නරුව දිස්ත්‍රික්කය වාර්තා වී ඇත. පසුගිය සංගණන වර්ෂයේදී (2002) අක්කර 9,764 ක් ලෙස වාර්තා වී ඇති මෙම බිම් ප්‍රමාණය 2014 වර්ෂයේදී අක්කර 23,566 ක් ලෙස වාර්තා වී ඇත. මීට ප්‍රධාන හේතුව පෙර සඳහන් කළ පරිදි අයහපත් වාතාවරණය නිසා අතහැර ගිය ප්‍රදේශවල නැවත පදිංචි වීමට අවසර ලබාදීම නිසා අතහැර දමා තිබූ වතු නැවතත් ජනතාව විසින් නඩත්තු කිරීම ආරම්භ කිරීමයි. වතු යටතේ ඇති බිම් ප්‍රමාණය වැඩි වූ සෙසු දිස්ත්‍රික්ක ලෙස කිලිනොච්චි, පුත්තලම, මන්නාරම, අම්පාර, මොණරාගල, ත්‍රිකුණාමලය, මඩකළපුව, මුලතිව්, කොළඹ, මහනුවර, අනුරාධපුරය, යාපනය, නුවරඑළිය, ගම්පහ සහ වවුනියාව යන දිස්ත්‍රික්ක සඳහන් කළ හැක.

වගු අංක 4.1 : වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව වතු සංඛ්‍යාව හා ඒවායෙහි බිම් ප්‍රමාණය - 2014

දිස්ත්‍රික්කය	වතු			
	සංඛ්‍යාව	භූමි ප්‍රමාණය		
		අක්කර	හෙක්ටයාර්	%
කොළඹ	124	15,555	6,295	1.6
ගම්පහ	406	19,244	7,788	2.0
කළුතර	334	59,807	24,204	6.3
මහනුවර	347	72,633	29,394	7.6
මාතලේ	271	32,136	13,005	3.4
නුවරඑළිය	253	152,340	61,651	16.0
ගාල්ල	244	30,630	12,396	3.2
මාතර	299	32,631	13,206	3.4
හම්බන්තොට	118	11,829	4,787	1.2
යාපනය	10	616	249	0.1
මන්නාරම	7	7,300	2,954	0.8
වවුනියාව	6	255	103	0.0
මුලතිව්	41	2,417	978	0.3
කිලිනොච්චිය	180	10,192	4,125	1.1
මඩකලපුව	57	3,947	1,597	0.4
අම්පාර	23	7,012	2,838	0.7
ත්‍රිකුණාමලය	7	3,873	1,567	0.4
කුරුණෑගල	1,828	105,294	42,612	11.1
පුත්තලම	1,365	65,724	26,598	6.9
අනුරාධපුර	66	7,687	3,111	0.8
පොළොන්නරුව	62	23,566	9,537	2.5
බදුල්ල	196	88,809	35,941	9.3
මොණරාගල	97	17,538	7,098	1.8
රත්නපුර	614	96,245	38,950	10.1
කෑගල්ල	362	84,703	34,279	8.9
ශ්‍රී ලංකාව	**7,317**	**951,983**	**385,263**	**100.0**

සිතියම් අංක 17 : දිස්ත්‍රික්ක අනුව මුළු වතු ගණන සහ වතු යටතේ ඇති බිම් ප්‍රමාණය



වතු සංඛ්‍යාව හා වතුවල බිම් ප්‍රමාණයන් වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

4.2 බෝග වගාව අනුව වතුවල ව්‍යාප්තිය

වගා කර ඇති බෝග වර්ගය අනුව වැඩිම වතු සංඛ්‍යාවක් වන වතු 4,909 ක් වගා කර ඇත්තේ පොල් වගාව යටතේය. දෙවනුවට තේ වගාව යටතේ වතු 2,222 ක් ද තෙවනුවට රබර් වගාව යටතේ වතු 1,990 ක් ද වාර්තා වී ඇත. පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සසඳන විට පොල් වතු සංඛ්‍යාව 4,142 සිට 4,909 දක්වා වතු 767 කින් ද රබර් වතු සංඛ්‍යාව 1,331 සිට 1,990 දක්වා වතු 659 කින් ද තේ වතු සංඛ්‍යාව 1,740 සිට 2,222 දක්වා වතු 482 කින්ද වැඩිවී ඇත. එසේ වුවද පසුගිය සංගණන වර්ෂය (2002) හා සැසඳීමේදී පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය (ක්‍රමවත් වගාව හා විසිරි වගාව යටතේ) අක්කර 175,883 සිට අක්කර 173,970 දක්වා අක්කර 1,913 කින් ද රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 163,150 සිට 161,152 දක්වා අක්කර 1,998 කින් ද තේ වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 293,938 සිට 234,124 දක්වා අක්කර 59,814 කින් ද අඩුවී ඇත.

4.2.1 තේ වගාව යටතේ වතුවල ව්‍යාප්තිය

වතු පිළිබඳ තොරතුරු රැස් කිරීමේ අදියරේදී රැස් කරන ලද තොරතුරුවලට අනුව තේ වගාව යටතේ වගාකර ඇති මුළු වතු සංඛ්‍යාව 2,222 ක් ලෙසින් වාර්තා වී ඇත. මෙය පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සංසන්දනය කිරීමේදී 27.7% ක වැඩිවීමකි. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී වැඩිම තේ වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයෙනි. එය වතු 528 ක් වේ. පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සසඳන විට මෙම දිස්ත්‍රික්කයේ තේ වතු සංඛ්‍යාව 331 ක් ලෙස වාර්තා වී ඇති අතර එම සංඛ්‍යාව මෙවර 197 ක වැඩිවීමක් වාර්තා කර ඇත. දෙවනුවට වැඩි වශයෙන් තේ වගා කර ඇති මහනුවර දිස්ත්‍රික්කයේ තේ වතු 274 ක් වාර්තා වී ඇත. මෙයට අමතරව නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් 246 ක් ද, කෑගල්ල දිස්ත්‍රික්කයෙන් 245 ක් ද, කළුතර දිස්ත්‍රික්කයෙන් 218 ක් ද ලෙසින් තේ වතු වාර්තා වී ඇත. මාතර දිස්ත්‍රික්කයේ තේ වතු 207 ක් වාර්තා වී ඇති අතර ගාල්ල දිස්ත්‍රික්කයේ එය 196 ක් ලෙස වාර්තා වී ඇත. බදුල්ල දිස්ත්‍රික්කයේ තේ වතු 172 ක් වාර්තා වී ඇත. මාතලේ දිස්ත්‍රික්කයේ තේ වතු ගණන 79 කි. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී කොළඹ, ගම්පහ, කුරුණෑගල සහ මොණරාගල දිස්ත්‍රික්කවල පිළිවෙලින් 43, 07, 04, 03 ක් ලෙස තේ වතු සංඛ්‍යාවන් වාර්තා වී ඇති අතර අනුරාධපුරය, අම්පාර, කිළිනොච්චි, ත්‍රිකුණාමලය, පුත්තලම, පොළොන්නරුව, මන්නාරම, මඩකලපුව, මුලතිව්, යාපනය, වවුනියාව සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල තේ වතු වාර්තා වී නොමැත.

වගා කර ඇති බිම් ප්‍රමාණය සැලකීමේදී තේ වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 234,124 (හෙක්ටයාර් 94,749) ක් ලෙස වාර්තා වී ඇත. නමුත් 2002 වර්ෂයේ කෘෂිකර්ම සංගණනය සමඟ සැසඳීමේදී තේ වගාව යටතේ වගා කර ඇති බිම් ප්‍රමාණයෙහි කැපී පෙනෙන අඩුවීමක් වාර්තා වී ඇත. එම අඩුවීම අක්කර 59,814 ක් වන අතර ප්‍රතිශතයක් ලෙස 20.3% කි. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව තේ වගා කළ බිම් ප්‍රමාණය සැලකිල්ලට ගතහොත් වගා කර ඇති වැඩි අක්කර ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි. එය අක්කර 96,714 ක් වේ. පසුගිය කෘෂිකර්ම සංගණනයේදී (2002) එය අක්කර 114,214 ක් වූ අතර එම අගය හා සැසඳීමේදී මෙවර එහි අඩුවීම අක්කර 17,500 කි. ඒ හැරුණු විට බදුල්ල දිස්ත්‍රික්කයේ අක්කර 50,252 ක් තේ වගාව යටතේ වාර්තා වී ඇත. මහනුවර (අක්කර 31,211), රත්නපුර (අක්කර 22,352), මාතර (අක්කර 10,042), කෑගල්ල (අක්කර 7,153), මාතලේ (අක්කර 6,694), ගාල්ල (අක්කර 5,069) සහ කළුතර (අක්කර

3,428) යන දිස්ත්‍රික්කවල අක්කර 3000 ට වැඩි තේ වගා කර ඇති බිම් වාර්තා වී ඇත. සෙසු දිස්ත්‍රික්කවලින් වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සලකා බැලීමේදී මොණරාගල (අක්කර 822), කොළඹ (අක්කර 242), කුරුණෑගල (අක්කර 142), ගම්පහ (අක්කර 03) හැර අනෙක් දිස්ත්‍රික්කවලින් තේ වගා කළ බිම් වාර්තා නොවේ.

තේ වතු සංඛ්‍යාව සහ තේ වගා කර ඇති බිම් ප්‍රමාණය මෙලෙස පහත වැටීමට, තේ වතු කැබලි වීම, නාගරීකරණය නිසා තේ වගා කළ බිම් වෙනත් කටයුතු සඳහා භාවිතා කිරීම සහ වෙනත් වැඩි ආර්ථික වටිනාකමක් ලැබෙන බෝගවලට තේ වගා කළ ඉඩම් ආදේශ කරගැනීම යන කරුණු හේතුවී ඇත.

වගු අංක 4.2.1 : වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව තේ වගා කර ඇති වතු සංඛ්‍යාව හා ඒවායෙහි බිම් ප්‍රමාණය - 2014

දිස්ත්‍රික්කය	තේ වගාව		
	වතු සංඛ්‍යාව	බිම් ප්‍රමාණය (අක්කර)	බිම්ප්‍රමාණය (හෙක්ටයාර්)
කොළඹ	43	242	98
ගම්පහ	7	3	1
කළුතර	218	3,428	1387
මහනුවර	274	31,211	12631
මාතලේ	79	6,694	2709
නුවරඑළිය	246	96,714	39140
ගාල්ල	196	5,069	2051
මාතර	207	10,042	4064
හම්බන්තොට	0	0	0
යාපනය	0	0	0
මන්නාරම	0	0	0
වවුනියාව	0	0	0
මුලතිවු	0	0	0
කිලිනොච්චිය	0	0	0
මඩකලපුව	0	0	0
අම්පාර	0	0	0
ත්‍රිකුණාමලය	0	0	0
කුරුණෑගල	4	142	57
පුත්තලම	0	0	0
අනුරාධපුර	0	0	0
පොළොන්නරුව	0	0	0
බදුල්ල	172	50,252	20337
මොණරාගල	3	822	333
රත්නපුර	528	22,352	9046
කෑගල්ල	245	7,153	2895
ශ්‍රීලංකාව	**2,222**	**234,124**	**94,749**

සිතියම් අංක 18 : දිස්ත්‍රික්ක අනුව තේ වතු යටතේ ඇති බිම් ප්‍රමාණය සහ තේ වතු ගණන



තේ වතු සංඛ්‍යාව හා තේ බිම් ප්‍රමාණයන් වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

4.2.2: රබර් වගාව යටතේ වතුවල ව්‍යාප්තිය

වතු පිළිබඳ තොරතුරු රැස් කිරීමේ අදියරේදී රැස් කරන ලද තොරතුරුවලට අනුව රබර් වගාව යටතේ වගා කර ඇති මුළු වතු සංඛ්‍යාව 1,990 ක් ලෙසින් වාර්තා වී ඇත. මෙය පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සැසඳීමේදී 49.51% ක වැඩිවීමකි. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී රබර් වගා කර ඇති වතුවලින් වැඩිම වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයෙනි. එය රබර් වතු 465 ක් වේ. ඒ හැරුණු විට කළුතර (309), කෑගල්ල (297), මාතර (157), ගාල්ල (139), කුරුණෑගල (116) හා ගම්පහ (111) යන දිස්ත්‍රික්කවල 100 කට වැඩි රබර් වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී අනෙක් දිස්ත්‍රික්කවල 100 ට අඩු වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර අම්පාර, අනුරාධපුර, ත්‍රිකුණාමලය, මන්නාරම, මඩකලපුව, මුලතිව් සහ යාපනය යන දිස්ත්‍රික්කවල රබර් වතු වාර්තා වී නොමැත.

රබර් වගාව යටතේ ඇති වතුවල මුළු බිම් ප්‍රමාණය අක්කර 161,152 ක් වේ. පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සැසඳීමේදී මෙවර රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය අක්කර 1,998 ක අඩුවීමක් පෙන්නුම් කර ඇත. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව රබර් වගා කර ඇති බිම් ප්‍රමාණය සැලකීමේදී වැඩිම බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ කෑගල්ල දිස්ත්‍රික්කයෙනි. එය අක්කර 51,035 කි. මෙම බිම් ප්‍රමාණය 2002 කෘෂිකර්ම සංගණනයේදී අක්කර 50,039 ක් ලෙස වාර්තා වී ඇත. මේ හැරුණු විට රත්නපුර දිස්ත්‍රික්කයේ අක්කර 34,921 ක් ද, කළුතර දිස්ත්‍රික්කයේ අක්කර 31,261 ක් ද, කොළඹ දිස්ත්‍රික්කයේ අක්කර 10,701 ක් ද, ගාල්ල දිස්ත්‍රික්කයේ අක්කර 6,338 ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ අක්කර 6,243 ක් ද, මාතර දිස්ත්‍රික්කයේ අක්කර 5,807 ක් ද ලෙස රබර් වගා කර ඇති බිම් වාර්තා වී ඇත. බදුල්ල, මාතලේ, මොණරාගල, නුවරඑළිය, ගම්පහ, මහනුවර, පුත්තලම, පොළොන්නරුව, වවුනියාව, හම්බන්තොට සහ කිළිනොච්චි යන දිස්ත්‍රික්කවල අක්කර 4,000 කට වඩා අඩු බිම් ප්‍රමාණයන් වාර්තා වී ඇත.

වගු අංක 4.2.2 : වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව රබර් වගා කර ඇති වතු සංඛ්‍යාව හා ඒවායෙහි බිම් ප්‍රමාණය - 2014

දිස්ත්‍රික්කය	රබර් වගාව		
	වතු සංඛ්‍යාව	බිම් ප්‍රමාණය (අක්කර)	බිම්ප්‍රමාණය (හෙක්ටයාර්)
කොළඹ	97	10,701	4,331
ගම්පහ	111	1,409	570
කළුතර	309	31,261	12,651
මහනුවර	39	953	386
මාතලේ	97	3,452	1,397
නුවරඑළිය	13	2,134	864
ගාල්ල	139	6,338	2,565
මාතර	157	5,807	2,350
හම්බන්තොට	12	41	17
යාපනය	0	0	0
මන්නාරම	0	0	0
වවුනියාව	2	47	19
මුලතිවු	0	0	0
කිලිනොච්චිය	1	2	1
මඩකලපුව	0	0	0
අම්පාර	0	0	0
ත්‍රිකුණාමලය	0	0	0
කුරුණෑගල	116	6,243	2,527
පුත්තලම	12	101	41
අනුරාධපුර	0	0	0
පොළොන්නරුව	3	50	20
බදුල්ල	78	3,582	1,450
මොණරාගල	42	3,075	1,244
රත්නපුර	465	34,921	14,132
කෑගල්ල	297	51,035	20,654
ශ්‍රීලංකාව	**1,990**	**161,152**	**65,219**

සිතියම් අංක19 : දිස්ත්‍රික්ක අනුව රබර් වතු යටතේ ඇති බිම් ප්‍රමාණය සහ වතු ගණන



රබර් වතු සංඛ්‍යාව හා රබර් බිම් ප්‍රමාණයන් වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

සිතියම් අංක 20 : දිස්ත්‍රික්ක අනුව වතු යටතේ ඇති බිම් ප්‍රමාණය සහ භෝගය අනුව වතු යටතේ ඇති බිම් ප්‍රමාණය



තේ හා රබර් බිම් ප්‍රමාණයන් වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

4.2.3 පොල් වගාව යටතේ වතුවල ව්‍යාප්තිය

වතු පිළිබඳ තොරතුරු රැස් කිරීමේ අදියරේදී රැස් කළ තොරතුරුවලට අනුව පොල් වගාව යටතේ වගා කර ඇති මුළු වතු සංඛ්‍යාව 4,909 ක් ලෙස වාර්තා වී ඇත. මෙය පසුගිය සංගණන වර්ෂය සමඟ සැසඳීමේදී 18.5%ක වැඩිවීමකි. පොල්වතු වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙනි. එය වතු 1,705 ක් වේ. පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සැසඳීමේදී එය වතු 1,944 සිට 1,705 දක්වා වතු 239 ක අඩුවීමක් පෙන්නුම් කර ඇත. දෙවනුවට වැඩිම පොල් වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ පුත්තලම දිස්ත්‍රික්කයෙනි. එය පොල් වතු 1,327 ක් වන අතර 2002 වර්ෂයේ කෘෂිකර්ම සංගණනයේදී එම දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ පොල් වතු සංඛ්‍යාව සමඟ සංසන්දනය කිරීමේදී මෙවර එම දිස්ත්‍රික්කයේ පොල් වතු සංඛ්‍යාවේ වැඩිවීමක් වාර්තා වී ඇත. එය පොල් වතු 835 සිට 1,327 දක්වා වතු 492 ක වැඩිවීමකි. මෙම දිස්ත්‍රික්කය හැරුණු විට 100 ට වැඩි පොල් වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගම්පහ, රත්නපුර, කළුතර, මාතලේ, කෑගල්ල, කිලිනොච්චි, මාතර යන දිස්ත්‍රික්කවලය. 50 – 100 අතර පොල් වතු සංඛ්‍යාවක් කොළඹ, මොණරාගල, ගාල්ල, හම්බන්තොට සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇත. 50 ට අඩු පොල් වතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බදුල්ල, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, අම්පාර, මුලතිව්, වවුනියාව, මන්නාරම, යාපනය, නුවරඑළිය සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කවලිනි. පසුගිය සංගණන වර්ෂය (2002) සමඟ සන්සන්දනය කළ විට කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වූ පොල් වතු මෙවර විශාල වශයෙන් වැඩිවී ඇත.

වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව බිම් ප්‍රමාණය සැලකීමේදී ක්‍රමවත් වගාව හා විසිරි වගාව එක්ව ගත්විට පොල් වගා කර ඇති වැඩිම බිම් ප්‍රමාණය කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාර්තා වී ඇත. එය අක්කර 87,409 ක් වේ. 2002 වර්ෂයේ කෘෂිකර්ම සංගණනයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි පොල් වගා කළ බිම් ප්‍රමාණය අක්කර 93,630 ක් ලෙස වාර්තා වී ඇති අතර අක්කර 6,221 ක බිම් ප්‍රමාණයක් මෙවර පොල් වගාවෙන් ඉවත්වී ඇත. කුරුණෑගල දිස්ත්‍රික්කය හැරුණු විට පුත්තලම දිස්ත්‍රික්කයෙහි අක්කර 46,015 ක් ද ගම්පහ දිස්ත්‍රික්කයෙහි අක්කර 15,857 ක් ද වාර්තා වී ඇති අතර අනෙක් දිස්ත්‍රික්කවල අක්කර 5,000 ට අඩු බිම් ප්‍රමාණයන් පොල් වගාව යටතේ වාර්තා වී ඇත.

මෙවර පොල් වතු සංඛ්‍යාව 2002 වර්ෂයේ කෘෂිකර්ම සංගණනයට සාපේක්ෂව වැඩි වුවද පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය පහත වැටීම සුවිශේෂිතාවයකි. බිම් ප්‍රමාණය මෙලෙස පහත වැටීමට ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැක්කේ පොල් වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක දෙක වන කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්කවල පොල් ඉඩම් කැබලි කර වෙනත් කටයුතු සඳහා යොදා ගැනීම විය හැක.

වගු අංක 4.2.3 : වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව පොල් වගා කර ඇති වතු සංඛ්‍යාව හා ඒවායෙහි බිම් ප්‍රමාණය - 2014

දිස්ත්‍රික්කය	වතු සංඛ්‍යාව	ඵල දරණ බිම් ප්‍රමාණය			ඵල නොදරණ බිම් ප්‍රමාණය			එකතුව			විසිරි වගාව යටතේ මුළු ගස් ගණන	
		අක්කර	හෙක්ටයාර්	%	අක්කර	හෙක්ටයාර්	%	අක්කර	හෙක්ටයාර්	%	ගස් ගණන	%
කොළඹ	56	834	338	0.6	74	30	0.4	908	368	0.6	2,428	0.3
ගම්පහ	381	13,754	5566	9.6	1,177	476	6.4	14,931	6042	9.2	55,588	7.8
කළුතර	183	832	337	0.6	194	79	1.1	1,026	416	0.6	2,885	0.4
මහනුවර	39	770	312	0.5	54	22	0.3	824	334	0.5	7,660	1.1
මාතලේ	157	3,457	1399	2.4	578	234	3.2	4,035	1633	2.5	17,097	2.4
නුවරඑළිය	9	127	51	0.1	4	2	0.0	131	53	0.1	361	0.1
ගාල්ල	86	1,151	466	0.8	215	87	1.2	1,366	553	0.8	21,007	3.0
මාතර	132	1,466	593	1.0	110	45	0.6	1,576	638	1.0	20,567	2.9
හම්බන්තොට	78	1,844	746	1.3	844	342	4.6	2,688	1088	1.7	11,071	1.6
යාපනය	2	62	25	0.0	0	0	0.0	62	25	0.0	0	0.0
මන්නාරම	4	85	34	0.1	40	16	0.2	125	50	0.1	0	0.0
වවුනියාව	1	7	3	0.0	7	3	0.0	14	6	0.0	0	0.0
මුලතිව්	25	715	289	0.5	193	78	1.1	908	367	0.6	443	0.1
කිළිනොච්චි	143	779	315	0.5	1,149	465	6.3	1,928	780	1.2	3,214	0.5
මඩකළපුව	52	428	173	0.3	366	148	2.0	794	321	0.5	9174	1.3
අම්පාර	10	391	158	0.3	67	27	0.4	458	185	0.3	0	0.0
ත්‍රිකුණාමලය	6	3	1	0.0	41	17	0.2	44	18	0.0	80	0.0
කුරුණෑගල	1705	73,218	29630	50.9	6,925	2802	37.9	80,143	32432	49.4	435,943	61.3
පුත්තලම	1327	39,144	15841	27.2	5,140	2080	28.1	44,284	17921	27.3	103,878	14.6
අනුරාධපුර	40	317	128	0.2	163	66	0.9	480	194	0.3	4,150	0.6
පොළොන්නරුව	40	2,093	847	1.5	394	159	2.2	2,487	1006	1.5	388	0.1
බදුල්ල	21	0	0	0.0	11	4	0.1	11	4	0.0	41	0.0
මොණරාගල	56	329	133	0.2	156	63	0.9	485	196	0.3	2,345	0.3
රත්නපුර	201	884	358	0.6	227	92	1.2	1,111	450	0.7	4,427	0.6
කෑගල්ල	155	1,135	459	0.8	156	63	0.9	1,291	522	0.8	8,838	1.2
ශ්‍රී ලංකාව	**4,909**	**143,825**	**58,202**	**100.0**	**18,285**	**7,400**	**100.0**	**162,110**	**65,602**	**100.0**	**711,585**	**100.0**

සිතියම් අංක 21: දිස්ත්‍රික්ක අනුව පොල් වතු යටතේ ඇති බිම් ප්‍රමාණය සහ පොල් වතු ගණන



පොල් වතු සංඛ්‍යාව හා පොල් බිම් ප්‍රමාණයන් වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

4.3 වතු ආශ්‍රිතව සිදු කරන සත්ව පාලනයේ ව්‍යාප්තිය

ආර්ථික සංගණනය 2013/14, කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කිරීමේ අදියරේදී වතු අංශය යටතේ සත්ව පාලනය පිළිබඳ සංඛ්‍යාති ද රැස් කරන ලදී. එම අදියරේදී රැස් කළ ගව පාලනය, කුකුළු පාලනය සහ මස් හා බිත්තර පිණිස ඇති කරන සතුන් පිළිබඳ සංඛ්‍යාති මෙම පරිච්ඡේදයේදී විස්තර කරනු ලැබේ.

4.3.1 වතු ආශ්‍රිතව සිදු කරන එළ ගවපාලනයේ ව්‍යාප්තිය

වතු ආශ්‍රිතව සිදු කරනු ලබන සත්ව පාලනය යටතේ එළ ගව පාලනය පිළිබඳ සංඛ්‍යාති පිළිබඳව මෙහිදී අවධානය යොමු කරනු ලැබේ.

වතු ආශ්‍රිතව සිදු කරන එළ ගව පාලනය පිළිබඳ තොරතුරුවලට අනුව සැලකීමේදී ශ්‍රී ලංකාවේ වතු ආශ්‍රිතව ජීවත්වන මුළු ගවයින් සංඛ්‍යාව 33,593 ක් වේ. ඉන් 28,058 ක් ගැහැණු සතුන් වේ. එය මුළු එළ ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 83.52 % වේ. එළ ගවයින් අතරින් ගවයින් 5,535 ක් පිරිමි සතුන් වන අතර එය මුළු එළ ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 16.48% ක් වේ. ගැහැණු සතුන් අතරින් 6,659 ක් දැනට කිරි ගනිමින් සිටින කිරි දෙනුන් වේ. එය මුළු එළ ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 19.8% ක් වේ. එමෙන්ම දෛනිකව නිෂ්පාදනය කරනු ලබන එළ කිරි ප්‍රමාණය ලීටර් 51,849 ක් ලෙස වාර්තා වී ඇත.

වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි පළාත අනුව සැලකීමේදී වතු ආශ්‍රිතව වැඩිම එළ ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ වයඹ (16,683) පළාතෙනි. එය මුළු එළ ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 49.7 % ක් වේ. එමෙන්ම අඩුම එළ ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ උතුරු (303) පළාතෙනි. එය මුළු එළ ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 0.9 % ක් වේ. වතු ආශ්‍රිතව සිදු කරන එළ ගව පාලනයේදී වැඩිම ගැහැණු සතුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ වයඹ (13,180) පළාතෙන් වන අතර එය මුළු එළ ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 39.2% ක් වේ. වාර්තා වී ඇති තොරතුරුවලට අනුව අඩුම ගැහැණු සතුන් සංඛ්‍යාවක් වාර්තාවන්නේ ඌව (274) පළාතෙනි. එය මුළු එළ ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 0.8% ක් වේ. වතු ආශ්‍රිතව සිදු කරන එළ ගව පාලනයේදී වැඩිම පිරිමි සතුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ වයඹ (3,503) පළාතෙන් වන අතර එය මුළු එළ ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 10.4% ක් වේ. වාර්තා වී ඇති තොරතුරුවලට අනුව අඩුම පිරිමි සතුන් සංඛ්‍යාවක් වාර්තාවන්නේ උතුරු (24) පළාතෙනි. එය මුළු එළ ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 0.07 % ක් වේ. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි පළාත අනුව සැලකීමේදී දෛනික එළ කිරි නිෂ්පාදනය වැඩියෙන්ම සිදු කෙරෙන්නේ මධ්‍යම පළාතෙහි බව වාර්තා වී ඇති තොරතුරුවලට අනුව පැහැදිලි වේ. එය කිරි ලීටර් 38,119 ක් වන අතර සමස්ත දෛනික කිරි නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 19.2% ක් වේ. අඩුම දෛනික කිරි නිෂ්පාදනයක් වාර්තා වී ඇත්තේ දකුණු පළාතෙනි. එය කිරි ලීටර් 151 ක් වන අතර සමස්ත දෛනික කිරි නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 0.3% ක් වේ.

වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී වතු ආශ්‍රිතව වැඩිම එළ ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල (11,297) දිස්ත්‍රික්කයෙනි. එය මුළු එළ ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 33.6% ක් වේ. එමෙන්ම අඩුම එළ ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ මන්නාරම (03) දිස්ත්‍රික්කයෙනි. එය මුළු එළ ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.01% ක් වේ. වතු ආශ්‍රිතව සිදු කරන එළ ගව පාලනයේදී වැඩිම ගැහැණු සතුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල (9,297) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු එළ ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 27.7% ක් වේ. වාර්තා වී

ඇති තොරතුරුවලට අනුව අඩුම ගැහැණු සතුන් සංඛ්‍යාවක් වාර්තාවන්නේ මන්නාරම (03) දිස්ත්‍රික්කයෙනි. එය මුළු එළ ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.009% ක් වේ. වතු ආශ්‍රිතව සිදු කරන එළ ගව පාලනයේදී වැඩිම පිරිමි සතුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල (2000) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු එළ ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 5.9% ක් වේ. වාර්තා වී ඇති තොරතුරුවලට අනුව අඩුම පිරිමි සතුන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ යාපනය (1) දිස්ත්‍රික්කයෙනි. මන්නාරම දිස්ත්‍රික්කයෙන් පිරිමි සතුන් වාර්තා නොවේ. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී දෛනික එළ කිරි නිෂ්පාදනය වැඩියෙන්ම සිදු කෙරෙනුයේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් බව වාර්තා වී ඇති තොරතුරුවලට අනුව පැහැදිලිවේ. එය කිරි ලීටර් 36,568 ක් වන අතර සමස්ත දෛනික කිරි නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 70.5% ක් වේ. මන්නාරම දිස්ත්‍රික්කයෙන් දෛනික කිරි නිෂ්පාදනයක් වාර්තා වී නැත.

වගු අංක 4.3.1: වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව වතුවල එළ ගවයින් සංඛ්‍යාව හා කිරි නිෂ්පාදනය - 2014

දිස්ත්‍රික්කය	එළ ගවයින්								දෛනික කිරි නිෂ්පාදනය (ලීටර්)	
	ගැහැණු සතුන්		දැනට කිරි ගනිමින් සිටින දෙනුන්		පිරිමි සතුන්		එකතුව			
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	126	0.6	36	0.5	86	1.6	248	0.7	42	0.1
ගම්පහ	1,282	6.0	311	4.7	436	7.9	2,029	6.0	1,160	2.2
කළුතර	147	0.7	39	0.6	79	1.4	265	0.8	71	0.1
මහනුවර	463	2.2	188	2.8	147	2.7	798	2.4	1,078	2.1
මාතලේ	478	2.2	117	1.8	133	2.4	728	2.2	473	0.9
නුවරඑළිය	4,525	21.2	2,292	34.4	350	6.3	7,167	21.3	36,568	70.5
ගාල්ල	31	0.1	11	0.2	13	0.2	55	0.2	28	0.1
මාතර	120	0.6	24	0.4	61	1.1	205	0.6	90	0.2
හම්බන්තොට	120	0.6	23	0.4	43	0.8	186	0.6	33	0.1
යාපනය	5	0.0	2	0.0	1	0.0	8	0.0	5	0.0
මන්නාරම	3	0.0	0	0.0	0	0.0	3	0.0	0	0.0
වවුනියාව	29	0.1	14	0.2	13	0.2	56	0.2	59	0.1
මුලතිව්	91	0.4	11	0.2	8	0.1	110	0.3	24	0.1
කිළිනොච්චි	92	0.4	32	0.5	2	0.0	126	0.4	64	0.1
මඩකළපුව	414	1.9	78	1.2	59	1.1	551	1.6	280	0.5
අම්පාර	106	0.5	33	0.5	77	1.4	216	0.6	72	0.1
ත්‍රිකුණාමලය	49	0.2	10	0.2	8	0.1	67	0.2	38	0.1
කුරුණෑගල	7,293	34.1	2,004	30.1	2,000	36.1	11,297	33.6	8,199	15.8
පුත්තලම	3,323	15.5	560	8.4	1,503	27.2	5,386	16.0	1,770	3.4
අනුරාධපුර	821	3.8	165	2.5	183	3.3	1,169	3.5	554	1.1
පොළොන්නරුව	1,320	6.2	557	8.4	170	3.1	2,047	6.1	712	1.4
බදුල්ල	59	0.3	17	0.3	30	0.5	106	0.3	131	0.3
මොණරාගල	164	0.8	34	0.5	47	0.9	245	0.7	71	0.1
රත්නපුර	80	0.4	12	0.2	41	0.7	133	0.4	44	0.1
කෑගල්ල	258	1.2	89	1.3	45	0.8	392	1.2	283	0.6
ශ්‍රී ලංකාව	**21,399**	**100.0**	**6,659**	**100.0**	**5,535**	**100.0**	**33,593**	**100.0**	**51,849**	**100.0**

සිතියම් අංක 22 : දිස්ත්‍රික්ක අනුව වතු යටතේ ඇති එළ ගවයින්ගේ ව්‍යාප්තිය



එළ ගවයින් සංඛ්‍යාව වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

සිතියම් අංක 23 : දිස්ත්‍රික්ක අනුව වතු යටතේ ඇති දැනට කිරි ගනිමින් සිටින එළ ගවයින්ගේ සංඛ්‍යාව සහ දෛනික කිරි නිශ්පාදනය



දැනට කිරි ගනිමින් සිටින එළ ගවයින් සංඛ්‍යාව හා දෛනික කිරි නිෂ්පාදනය වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සඳහන්ව ඇත.

4.3.2 වතු ආශ්‍රිතව සිදු කරන මී ගවපාලනයේ ව්‍යාප්තිය

වතු ආශ්‍රිතව සිදු කරනු ලබන සත්ව පාලනය යටතේ මී ගව පාලනය පිළිබඳ සංඛ්‍යාති පිළිබඳව මෙහිදී අවධානය යොමු කරනු ලැබේ. වතු ආශ්‍රිතව සිදු කරන මී ගව පාලනය පිළිබඳ තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාවේ වතු ආශ්‍රිතව ජීවත්වන මුළු මී ගවයින් සංඛ්‍යාව 8,998 ක් වේ. ඉන් 7,361 ක් ගැහැණු සතුන් වේ. එය මුළු මී ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 81.8 % කි. මී ගවයින් අතරින් ගවයින් 1,637 ක් පිරිමි සතුන් වන අතර එය මුළු මී ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 18.2 % ක් වේ. ගැහැණු සතුන් අතරින් 1,716 ක් දැනට කිරි ගනිමින් සිටින කිරි දෙනුන් වේ. එය මුළු මී ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 19.1% ක් වේ. එමෙන්ම දෛනිකව නිෂ්පාදනය කරනු ලබන මී කිරි ප්‍රමාණය ලීටර් 4,192 ක් ලෙස වාර්තා වී ඇත.

වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි පළාත අනුව සැලකීමේදී වතු ආශ්‍රිතව වැඩිම මී ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ වයඹ (3,720) පළාතෙනි. එය මුළු මී ගවයින්ගේ ප්‍රතිශතයක් ලෙස 41.3% ක් වේ. එමෙන්ම අඩුම මී ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ උතුරු (22) පළාතෙනි. එය මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.2% ක් වේ. වතු ආශ්‍රිතව සිදු කරන මී ගව පාලනයේදී වැඩිම ගැහැණු සතුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ වයඹ (3,083) පළාතෙන් වන අතර එය මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 34.3% ක් වේ. වාර්තා වී ඇති තොරතුරුවලට අනුව අඩුම ගැහැණු සතුන් සංඛ්‍යාවක් වාර්තාවන්නේ උතුරු (12) පළාතෙනි. එය මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.1% ක් වේ. වතු ආශ්‍රිතව සිදු කරන මී ගව පාලනයේදී වැඩිම පිරිමි සතුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ වයඹ (637) පළාතෙන් වන අතර එය මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 7.1% ක් වේ. වාර්තා වී ඇති තොරතුරුවලට අනුව අඩුම පිරිමි සතුන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ ඌව (9) පළාතෙනි. එය මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.1% ක් වේ. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි පළාත අනුව සැලකීමේදී දෛනික මී කිරි නිෂ්පාදනය වැඩියෙන්ම සිදු කෙරෙන්නේ වයඹ පළාතෙන් බව වාර්තා වී ඇති තොරතුරුවලට අනුව පැහැදිලි වේ. එය කිරි ලීටර් 1,670 ක් වන අතර සමස්ථ දෛනික කිරි නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 39.8% ක් වේ. අඩුම දෛනික කිරි නිෂ්පාදනයක් වාර්තා වී ඇත්තේ සබරගමුව පළාතෙනි. එය කිරි ලීටර් 12 ක් වන අතර සමස්ත දෛනික කිරි නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 0.3% ක් වේ.

වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී වතු ආශ්‍රිතව වැඩිම මී ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල (2,660) දිස්ත්‍රික්කයෙනි. එය මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 29.6% ක් වේ. අඩුම මී ගවයින් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ නුවරඑළිය (1) දිස්ත්‍රික්කයෙනි. එය මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.01% ක් වේ. ගාල්ල, යාපනය, මන්නාරම, මුලතිව් හා බදුල්ල යන දිස්ත්‍රික්ක වල මී ගවයින් වාර්තා වී නොමැත. වතු ආශ්‍රිතව සිදු කරන මී ගව පාලනයේදී වැඩිම ගැහැණු සතුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල (2,191) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 24.3 % ක් වේ. අඩුම ගැහැණු සතුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ නුවරඑළිය (1) දිස්ත්‍රික්කයෙනි. එය මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.01% ක් වේ. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී ගාල්ල, යාපනය, මන්නාරම, මුලතිව්, කිළිනොච්චි හා බදුල්ල යන දිස්ත්‍රික්ක වල ගැහැණු සතුන් වාර්තා වන්නේ නැත. වතු ආශ්‍රිතව සිදු කරන මී ගව පාලනයේදී වැඩිම පිරිමි සතුන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල (469) දිස්ත්‍රික්කයෙන් වන අතර එය මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 5.2 % ක් වේ. අඩුම පිරිමි සතුන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ කළුතර (1) දිස්ත්‍රික්කයෙන්ය. එය මුළු මී ගවයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.01% ක් වේ. වත්තේ පරිපාලන

කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී නුවරඑළිය, ගාල්ල, යාපනය, මන්නාරම, වවුනියාව, මුලතිව් හා බදුල්ල යන දිස්ත්‍රික්ක වල පිරිමි සතුන් වාර්තා වන්නේ නැත.

වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සැලකීමේදී දෛනික මී කිරි නිෂ්පාදනය වැඩියෙන්ම සිදු කෙරෙන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි බව වාර්තා වී ඇති තොරතුරුවලට අනුව පැහැදිලි වේ. එය කිරි ලීටර් 1,336 ක් වන අතර සමස්ත දෛනික කිරි නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 31.9% ක් වේ.

වගු අංක 4.3.2: වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව වතුවල මී ගවයින් සංඛ්‍යාව හා කිරි නිෂ්පාදනය - 2014

දිස්ත්‍රික්කය	මී ගවයින්									
	ගැහැණු සතුන්		දැනට කිරි ගනිමින් සිටින දෙනුන්		පිරිමි සතුන්		එකතුව		දෛනික කිරි නිෂ්පාදනය (ලීටර්)	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	14	0.3	12	0.7	5	0.3	31	0.3	6	0.1
ගම්පහ	290	5.1	66	3.9	91	5.6	447	5.0	183	4.4
කළුතර	3	0.1	0	0.0	1	0.1	4	0.0	0	0.0
මහනුවර	195	3.5	44	2.6	68	4.2	307	3.4	79	1.9
මාතලේ	260	4.6	50	2.9	85	5.2	395	4.4	128	3.1
නුවරඑළිය	0	0.0	1	0.1	0	0.0	1	0.0	0	0.0
ගාල්ල	0	0.0	0	0.0	0	0.0	0	0.0	0	0.0
මාතර	71	1.3	24	1.4	10	0.6	105	1.2	92	2.2
හම්බන්තොට	559	9.9	181	10.6	162	9.9	902	10.0	428	10.2
යාපනය	0	0.0	0	0.0	0	0.0	0	0.0	0	0.0
මන්නාරම	0	0.0	0	0.0	0	0.0	0	0.0	0	0.0
වවුනියාව	8	0.1	4	0.2	0	0.0	12	0.1	30	0.7
මුලතිව්	0	0.0	0	0.0	0	0.0	0	0.0	0	0.0
කිළිනොච්චි	0	0.0	0	0.0	10	0.6	10	0.1	0	0.0
මඩකළපුව	16	0.3	7	0.4	2	0.1	25	0.3	5	0.1
අම්පාර	8	0.1	5	0.3	15	0.9	28	0.3	36	0.9
ත්‍රිකුණාමලය	12	0.2	3	0.2	5	0.3	20	0.2	10	0.2
කුරුණෑගල	1,681	29.8	510	29.7	469	28.7	2,660	29.6	1,336	31.9
පුත්තලම	560	9.9	332	19.4	168	10.3	1,060	11.8	334	8.0
අනුරාධපුර	260	4.6	52	3.0	94	5.7	406	4.5	205	4.9
පොළොන්නරුව	1,349	23.9	231	13.5	426	26.0	2,006	22.3	1,103	26.3
බදුල්ල	0	0.0	0	0.0	0	0.0	0	0.0	0	0.0
මොණරාගල	333	5.9	182	10.6	9	0.6	524	5.8	205	4.9
රත්නපුර	1	0.0	2	0.1	8	0.5	11	0.1	0	0.0
කෑගල්ල	25	0.4	10	0.6	9	0.6	44	0.5	12	0.3
ශ්‍රී ලංකාව	**5,645**	**100.0**	**1,716**	**100.0**	**1,637**	**100.0**	**8,998**	**100.0**	**4,192**	**100.0**

සිතියම් අංක 24: දිස්ත්‍රික්ක අනුව වතු යටතේ ඇති මී ගවයින්ගේ ව්‍යාප්තිය



මී ගවයින් සංඛ්‍යාව වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

සිතියම් අංක 25 : දිස්ත්‍රික්ක අනුව වතු යටතේ ඇති දැනට කිරි ගනිමින් සිටින මී ගවයින්ගේ සංඛ්‍යාව සහ දෛනික කිරි නිශ්පාදනය



දැනට කිරි ගනිමින් සිටින මී ගවයින් සංඛ්‍යාව හා දෛනික කිරි නිෂ්පාදනය වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සඳහන්ව ඇත.

4.3.3 වතු ආශ්‍රිතව සිදු කරන කුකුල් පාලනයේ ව්‍යාප්තිය

ආර්ථික සංගණනය 2013/14 කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමේ අදියරේදී වතු අංශය යටතේ වතු ආශ්‍රිතව සිදු කරන කුකුළු පාලනය පිළිබඳව වූ තොරතුරු ද රැස් කරන ලදී . මේ තුළ අභිජනනය (බෝ කිරීම) පිණිස, බිත්තර පිණිස සහ ගම්බදව (නිදැල්ලේ) ඇති කරන කිකිළියන් පිළිබඳ තොරතුරු රැස් කරනු ලැබිණි.

රැස් කරන ලද තොරතුරුවලට අනුව වතු ආශ්‍රිතව සිදු කරන ලද කුකුළු පාලනයේදී වාර්තා වී ඇති මුළු කිකිළියන් සංඛ්‍යාව 1,364,967 ක් වේ. එයින් අභිජනනය (බෝ කිරීම) පිණිස ඇති කරන කිකිළියන් සංඛ්‍යාව 659,601 ක් වේ. එය මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 48.3% වේ. බිත්තර පිණිස ඇති කරන වැඩි දියුණු කළ කිකිළියන් සංඛ්‍යාව 702,275 ක් ලෙස වාර්තා වී ඇති අතර එය මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 51.4% ක් වේ. බිත්තර සඳහා ගම්බදව ඇති කරන කිකිළියන් 3,091 ක් වාර්තා වී ඇත. එය මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.3% ක් වේ. සතියක කාලයක් තුළ බිත්තර නිෂ්පාදනය 5,470,635 ක් බව වාර්තා වේ.

වතු ආශ්‍රිතව සිදු කරන කුකුළු පාලනය සැලකීමේදී වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි පළාත අනුව වැඩිම කිකිළියන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ වයඹ (625,414) පළාතෙනි. එය මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 45.8% ක් වේ. අඩුම කිකිළියන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ඌව (260) පළාතෙනි. එය මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.02% ක් වේ. එමෙන්ම අභිජනනය (බෝ කිරීම) පිණිස ඇති කරන කිකිළියන්ගෙන් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බස්නාහිර (311,404) පළාතෙනි. එය මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 22.8% ක් වේ. අභිජනනය (බෝ කිරීම) පිණිස ඇති කරන කිකිළියන්ගෙන් අඩුම සංඛ්‍යාවක් වාර්තා වන්නේ ඌව (91) පළාතෙන් වන අතර එය මුළු කිකිළියන් සංඛ්‍යාවෙන් 0.01% කි. අභිජනනය (බෝ කිරීම) පිණිස ඇති කරන කිකිළියන් උතුරු, නැගෙනහිර හා උතුරු මැද පළාත් වලින් වාර්තා වී නොමැත. බිත්තර සඳහා වැඩි දියුණු කළ හා ගම්බදව බිත්තර පිණිස ඇති කරන කිකිළියන් එක්ව ගත් විට වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ වයඹ (457,499) පළාතෙනි. එය මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 33.5% ක් වේ. බිත්තර පිණිස වැඩි දියුණු කළ හා බිත්තර පිණිස ගම්බදව ඇති කරන කිකිළියන් එක්ව ගත් විට අඩුම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ඌව (169) පළාතෙනි. එය මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.01% ක් වේ.

වතු ආශ්‍රිතව සිදු කරන කුකුළු පාලනය සැලකීමේදී වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව වැඩිම කිකිළියන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ පුත්තලම (373,949) දිස්ත්‍රික්කයෙනි. එය මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 27.4% ක් වේ. අඩුම කිළියන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බදුල්ල (4) දිස්ත්‍රික්කයෙනි. එය මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.0003% ක් වේ. අම්පාර, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලින් කිකිළියන් වාර්තා නොවීමද සුවිශේෂීතාවයකි. එමෙන්ම අභිජනනය (බෝ කිරීම) පිණිස ඇති කරන කිකිළියන්ගෙන් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කළුතර (139,811) දිස්ත්‍රික්කයෙනි. මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස එය 10.2% ක් වේ. අභිජනනය (බෝ කිරීම) පිණිස ඇති කරන කිකිළියන්ගෙන් අඩුම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ නුවරඑළිය (2) දිස්ත්‍රික්කයෙනි. එම සංඛ්‍යාව මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.0001% ක් වේ. හම්බන්තොට, යාපනය, මන්නාරම, වවුනියාව, මුලතිව්, කිළිනොච්චි, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, අනුරාධපුර, පොළොන්නරුව, බදුල්ල හා රත්නපුර යන දිස්ත්‍රික්ක වල අභිජනනය (බෝ කිරීම) පිණිස ඇති කරන කිකිළියන් වාර්තා වී නොමැත. බිත්තර පිණිස වැඩි දියුණු කළ හා ගම්බද බිත්තර දමන කිකිළියන් එක්ව ගත් විට වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ පුත්තලම (249,367) දිස්ත්‍රික්කයෙනි. එය මුළු කිකිළියන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 18.3%ක් වේ. බිත්තර

පිණිස ඇති කරන වැඩි දියුණු කළ හා ගම්බද කිකිළියන් එක්ව ගත් විට අඩුම සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බදුල්ල (4) දිස්ත්‍රික්කයෙනි. ගාල්ල, අම්පාර හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල වැඩි දියුණු කළ හා ගම්බද බිත්තර පිණිස ඇති කරන කිකිළියන් වාර්තා වී නොමැත.

එමෙන්ම සතියක කාලයක් තුළ බිත්තර නිෂ්පාදනය 5,470,635 ක් ලෙස වාර්තා වී ඇත. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි පළාත අනුව බිත්තර නිෂ්පාදනය වැඩියෙන්ම සිදුවී ඇත්තේ වයඹ (2,962,600) පළාතෙනි. එය මුළු බිත්තර නිෂ්පාදනයෙන් 54.2% ක් වේ. අඩුම බිත්තර නිෂ්පාදනය වාර්තා වී ඇත්තේ ඌව (883) පළාතෙනි. එය මුළු බිත්තර නිෂ්පාදනයෙන් 0.02 % ක් වේ. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව බිත්තර නිෂ්පාදනය වැඩියෙන්ම සිදුවී ඇත්තේ පුත්තලම (2,062,704) දිස්ත්‍රික්කයේය. එය මුළු බිත්තර නිෂ්පාදනයෙන් 37.7% ක් වේ. අඩුම බිත්තර නිෂ්පාදනයක් වාර්තා වන්නේ ගාල්ල (5) දිස්ත්‍රික්කයෙනි. වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව අම්පාර හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල ඉහත බිත්තර සඳහා වැඩි දියුණු කළ හා ගම්බද බිත්තර පිණිස ඇති කරන කිකිළියන් වාර්තා වී නොමැති බැවින් බිත්තර නිෂ්පාදනයක් වාර්තා වී නොමැත.

රූප සටහන 09 : වතු ආශ්‍රිතව සිදු කරන කුකුළු පාලනය- 2014



වගු අංක **4.3.3 :** වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව වතුවල කුකුළන්/කිකිළියන් සංඛ්‍යාව හා බිත්තර නිෂ්පාදනය - **2014**

දිස්ත්‍රික්කය	බෝ කිරීම සඳහා බිත්තර දමන කිකිළියන්		බිත්තර සඳහා වැඩි දියුණු කළ බිත්තර දමන කිකිළියන්		ගම්බද බිත්තර දමන කිකිළියන්		එකතුව		බිත්තර නිෂ්පාදනය	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	68,405	10.4	2,967	0.4	10	0.3	71,382	5.2	309,171	5.7
ගම්පහ	103,188	15.6	46,601	6.6	875	28.3	150,664	11.0	428,591	7.8
කළුතර	139,811	21.2	0	0.0	227	7.3	140,038	10.3	393,212	7.2
මහනුවර	138,209	21.0	2,299	0.3	10	0.3	140,518	10.3	422,159	7.7
මාතලේ	40,515	6.1	28,700	4.1	13	0.4	69,228	5.1	238,550	4.4
නුවරඑළිය	2	0.0	120,219	17.1	247	8.0	120,468	8.8	501,235	9.2
ගාල්ල	5	0.0	0	0.0	0	0.0	5	0.0	5	0.0
මාතර	1,325	0.2	125	0.0	12	0.4	1,462	0.1	4,765	0.1
හම්බන්තොට	0	0.0	19,600	2.8	38	1.2	19,638	1.4	98,612	1.8
යාපනය	0	0.0	0	0.0	20	0.7	20	0.0	35	0.0
මන්නාරම	0	0.0	0	0.0	63	2.0	63	0.0	130	0.0
වවුනියාව	0	0.0	350	0.1	0	0.0	350	0.0	1,030	0.0
මුලතිව්	0	0.0	0	0.0	28	0.9	28	0.0	101	0.0
කිළිනොච්චි	0	0.0	0	0.0	105	3.4	105	0.0	10	0.0
මඩකළපුව	0	0.0	2,010	0.3	53	1.7	2,063	0.2	7,222	0.1
අම්පාර	0	0.0	0	0.0	0	0.0	0	0.0	0	0.0
ත්‍රිකුණාමලය	0	0.0	0	0.0	0	0.0	0	0.0	0	0.0
කුරුණෑගල	43,333	6.6	207,626	29.6	506	16.4	251,465	18.4	899,896	16.5
පුත්තලම	124,582	18.9	248,741	35.4	626	20.3	373,949	27.4	2,062,704	37.7
අනුරාධපුර	0	0.0	1,660	0.2	8	0.3	1,668	0.1	9,800	0.2
පොළොන්නරුව	0	0.0	20,659	2.9	18	0.6	20,677	1.5	88,067	1.6
බදුල්ල	0	0.0	4	0.0	0	0.0	4	0.0	20	0.0
මොණරාගල	91	0.0	0	0.0	165	5.3	256	0.0	863	0.0
රත්නපුර	0	0.0	73	0.0	60	1.9	133	0.0	260	0.0
කෑගල්ල	135	0.0	641	0.1	7	0.2	783	0.1	4,197	0.1
ශ්‍රී ලංකාව	**659,601**	**100.0**	**702,275**	**100.0**	**3,091**	**100.0**	**1,364,967**	**100.0**	**5,470,635**	**100.0**

සිතියම් අංක 26 : දිස්ත්‍රික්ක මට්ටමින් වතු යටතේ බිත්තර නිශ්පාදනය සහ බිත්තර දමන කිකිළියන්ගේ ව්‍යාප්තිය



බිත්තර දමන කිකිළියන් සංඛ්‍යාව හා බිත්තර නිෂ්පාදනය වත්තේ පරිපාලන කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය අනුව සඳහන් කර ඇත.

4.4 අයිතිය අනුව වතුවල ව්‍යාප්තිය

කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කිරීමේ අදියර යටතේ වතු පිළිබඳ තොරතුරු රැස් කිරීමේදී ශ්‍රී ලංකාව තුළ පිහිටි වතු ප්‍රධාන වශයෙන් වතුවල අයිතිය අනුව වර්ග කිරීම්දී අංශ 6ක් යටතේ හඳුනා ගන්නා ලදී. එනම්,

1. රජයේ වතු
2. අර්ධ රජයේ වතු
3. වැවිලි සමාගම් සතු වතු
4. පුද්ගලික සමාගම් සතු වතු
5. තනි පුද්ගලයෙකු සතු වතු
6. හවුල් අයිතියක් ඇති වතු

මෙම වර්ග කිරීම යටතේ අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට අයිතිව ඇති ඔවුන් විසින් වගාව නඩත්තු කරන වතු, රජයේ වතු ලෙස ද අයිතිය අර්ධ රාජ්‍ය ආයතන සතුව පවතින වතු, අර්ධ රජයේ වතු ලෙස ද 1992 වර්ෂයේදී ක්‍රියාත්මක වූ රාජ්‍ය වතු පෞද්ගලීකරණ වැඩසටහන යටතේ බදු දී වතු, වැවිලි සමාගම් සතු වතු ලෙස ද පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් එකතුවී සමාගම් නීතිය යටතේ ලියාපදිංචි කොට ඇති ඔවුන් සතු වතු, පුද්ගලික සමාගම් සතු වතු ලෙස ද කිසියම් තනි පුද්ගලයෙකු සතු වතු, පුද්ගලික තනි වතු ලෙස ද පුද්ගලයින් දෙදෙදෙකු හෝ ඊට වැඩි පුද්ගලයින් සංඛ්‍යාවක් විසින් හවුලේ අයිතිය ඇතිව නඩත්තු කරනු ලබන වතු, පුද්ගලික හවුල් වතු ලෙස ද 2013/14 ආර්ථික සංගණනයේදී හඳුනා ගන්නා ලදී.

මෙම හඳුනා ගැනීම මත ශ්‍රී ලංකාවේ පුද්ගලික තනි වතු 4,885 ක් ද, පුද්ගලික හවුල් වතු 897 ක් ද, පුද්ගලික සමාගම් සතු වතු 473 ක් ද, වැවිලි සමාගම් සතු වතු 342 ක් ද, රජයේ වතු 494ක් ද, අර්ධ රජයේ වතු 226 ක් ද වාර්තා වී ඇත.

රූප සටහන 09 : අයිතිය අනුව වතුවල ව්‍යාප්තිය - 2014



වගු අංක 4.4.1 : අයිතිය අනුව වතුවල ව්‍යාප්තිය - 2014

දිස්ත්‍රික්කය	අයිතිය											
	රජයේ		අර්ධ රජයේ		වැවිලි සමාගම්		පුද්ගලික සමාගම්		පුද්ගලික තනි		පුද්ගලික හවුල්	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	17	3.4	0	0.0	7	2.0	15	3.2	76	1.6	9	1.0
ගම්පහ	81	16.4	22	9.7	7	2.0	19	4.0	226	4.6	51	5.7
කළුතර	21	4.3	8	3.5	18	5.3	17	3.6	203	4.2	67	7.5
මහනුවර	21	4.3	31	13.7	14	4.1	37	7.8	189	3.9	55	6.1
මාතලේ	16	3.2	15	6.6	3	0.9	29	6.1	155	3.2	53	5.9
නුවරඑළිය	28	5.7	9	4.0	86	25.1	32	6.8	79	1.6	19	2.1
ගාල්ල	5	1.0	4	1.8	11	3.2	19	4.0	169	3.5	36	4.0
මාතර	6	1.2	8	3.5	13	3.8	30	6.3	200	4.1	42	4.7
හම්බන්තොට	20	4.0	5	2.2	0	0.0	10	2.1	69	1.4	14	1.6
යාපනය	0	0.0	0	0.0	0	0.0	0	0.0	9	0.2	1	0.1
මන්නාරම	1	0.2	0	0.0	0	0.0	0	0.0	6	0.1	0	0.0
වවුනියාව	3	0.6	0	0.0	0	0.0	0	0.0	3	0.1	0	0.0
මුලතිව්	0	0.0	1	0.4	0	0.0	1	0.2	39	0.8	0	0.0
කිලිනොච්චි	5	1.0	5	2.2	0	0.0	3	0.6	157	3.2	10	1.1
මඩකළපුව	4	0.8	3	1.3	0	0.0	3	0.6	45	0.9	2	0.2
අම්පාර	12	2.4	3	1.3	0	0.0	1	0.2	7	0.1	0	0.0
ත්‍රිකුණාමලය	1	0.2	0	0.0	0	0.0	2	0.4	3	0.1	1	0.1
කුරුණෑගල	84	17.0	63	27.9	50	14.6	76	16.1	1362	27.9	193	21.5
පුත්තලම	55	11.1	20	8.8	21	6.1	85	18.0	1112	22.8	72	8.0
අනුරාධපුර	13	2.6	5	2.2	2	0.6	10	2.1	36	0.7	0	0.0
පොළොන්නරුව	9	1.8	4	1.8	1	0.3	7	1.5	36	0.7	5	0.6
බදුල්ල	24	4.9	1	0.4	39	11.4	19	4.0	108	2.2	5	0.6
මොණරාගල	30	6.1	4	1.8	2	0.6	7	1.5	49	1.0	5	0.6
රත්නපුර	15	3.0	11	4.9	50	14.6	31	6.6	407	8.3	100	11.1
කෑගල්ල	23	4.7	4	1.8	18	5.3	20	4.2	140	2.9	157	17.5
ශ්‍රී ලංකාව	**494**	**100.0**	**226**	**100.0**	**342**	**100.0**	**473**	**100.0**	**4885**	**100.0**	**897**	**100.0**

සිතියම් අංක 27: දිස්ත්‍රික්කය හා අයිතිය අනුව වතු සංඛ්‍යාව



එකම කාරක තත්ත්වයක් හා එකම භුක්තියක් යටතේ අවම වශයෙන් එක් බිම් කැබැල්ලක් හෝ අක්කර 20 ක් වන හෝ ඊට වැඩි ගොවි කාණ්ඩයක් වත්තක් ලෙස හැදින්වේ.